# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# வருடாந்த ஆண்டறிக்கை

# Annual Report and Accounts

## 1994

RECEIVED
DIVISION
ISLAND, COLOMBO 15

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන
නියෝජිතායතනය

தேசிய நீரியல்வள ஆராய்ச்சி அபிவிருத்தி
முகாமை

**NATIONAL AQUATIC RESOURCES RESEARCH & DEVELOPMENT AGENCY**

ARA-012

# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 1994

N A R A
DIVISION
COLOMBO 15

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15.

# පටුන


සමුද්‍ර ජීව විද්‍යා අංශය .................................................... පිටු 1

අභ්‍යන්තර ජලජීවී සම්පත් හා
ජලජීවී වගා අංශය .................................................... පිටු 5

ධීවර තාක්ෂණ අංශය .................................................... පිටු 9

ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය .................................................... පිටු 10

සමුද්‍ර විද්‍යා අංශය .................................................... පිටු 15

පසු තාක්ෂණික අංශය .................................................... පිටු 22

පාරිසරික අංශය .................................................... පිටු 28

අවසාන ගිණුම් හා විගණකාධිපති වාර්තාව .................................................... පිටු 31

# සමුද්‍ර ජීව විද්‍යා අංශය 1994

**සාමාන්‍ය**

1994 වර්ෂයේදී මෙම අංශය මගින් සිදු කරන ලද පර්යේෂණ වැඩ සටහන් සඳහා නිලධාරීන් 7 දෙනකු දායක විය.

**පර්යේෂණ වැඩ සටහන්**

සමුද්‍ර ජීව විද්‍යා අංශයේ පර්යේෂණ ව්‍යාපෘති 9ක් මෙම වර්ෂය තුලදී සම්පූර්ණ කෙරිණ. මෙයින් ව්‍යාපෘති 6ක් නාරා ආධාර යටතේද ඉතිරි ව්‍යාපෘති බාහිර ප්‍රතිපාදන යටතේද සිදු කෙරිණි.

1. නාරා ප්‍රතිපාදන යටතේ වූ ව්‍යාපෘති

1.1 ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර වෙරළේ විශාල සමුද්‍රවාසී ධීවර කර්මාන්තයේ මෝරුන් ඇල්ලීම පිළිබඳ අධ්‍යයනය

මෙම 1994 වර්ෂයේදී මෝර විශේෂ 07ක් වාර්තාවිය. මෙයින් 75%ක කිරි මෝරුන් වේ. මෙම මෝරු විශේෂය මීගමු හා බේරුවල මසුන් ගොඩට ගෙන එන ස්ථානවල ප්‍රධානතම විශේෂයක් ලෙස හඳුනාගන්නා ලදී. මෙහිදී මෙම ධීවර කර්මාන්තයේම දායකවන දෙවන විශේෂය වනුයේ (Oceanic whitetip shark) වේ. මෙහිදී මෙම මෝර මසුන්ගේ හකු 26ක්ද විවිධ මෝර විශේෂවල නිදර්ශක 7ක්ද එකතු කරන ලදී.
මෙම වර්ෂයේදී මෙම මෝර ධීවර කර්මාන්තය බහුදින ධීවර යාත්‍රාවල මුළු ආදායමෙන් 10 - 50% දක්වා ප්‍රමාණයක් ලබාගැනීමට සමත්විය.

1.2 මොරටුව සිට බේරුවල දක්වා මාදැල් හා කුඩා ඇස් සහිත කරමල් දැල් භාවිතා කර සිදුකරනු ලබන ධීවර කර්මාන්තයේ ජෛව-ආර්ථික තත්ව අධ්‍යයනය
ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලයේදී අගුලාන සිට වික්කපොල දක්වා සිදුකරනු ලබන මාදැල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය සිදු කෙරිනි. මෙම මාදැල් ඇදීම 1994 වර්ෂයේ මැයි සිට ඔක්තෝම්බර් දක්වා කාලයේදී ක්‍රියාත්මක නොවීය. 1994 මාර්තු 13 නාරා ආයතනය, ශ්‍රී ලංකා නාවික හමුදාව හා මිනින්දෝරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව ජල ශාස්ත්‍රීය අධ්‍යයනයක් සඳහා වැඩසටහනක් සකස්කරන ලදී.
ජල ශාස්ත්‍රීය අංශය මගින් අධ්‍යක්ෂණය කරන මෙහි, සභාපති/නාරා, අණදෙන නිලධාරී හෝ එතුමාගේ නියෝජිතයකු හා මිනුම්පති හෝ එතුමාගේ නියෝජිතයෙකුගෙන් මෙය සමන්විත වේ. මෙම ජල ශාස්ත්‍රීය කාර්යාලය මගින් සිදුකරන ලද වැඩසටහනේ පරමාර්ථ නම් ශ්‍රී ලංකාවේ මුහුදු කලාපයට අයත් ගැඹුරු මුහුදේ, වෙරළේ හා අනෙකුත් ප්‍රදේශවල පූර්ණ ජලශාස්ත්‍රීය අධ්‍යයනයක් කිරීමයි. දත්ත එකතු කිරීම සඳහා හලාවත හා බේරුවල ප්‍රදේශ තෝරාගන්නා ලදී. මෙම ස්ථානවල දත්ත එක්රැස් කිරීමේ කටයුතු අවුරුද්ද පුරා සිදුකරන ලද අතර මෙහිදී ප්‍රධාන බෝට්ටු/ආම්පන්න සඳහා මත්ස්‍ය අස්වනු නෙළීමේ සීඝ්‍රතාව 5.93 කි.ග්‍රෑ./බෝට්ටුවකට/දිනකට හා 12.76 කි.ග්‍රෑ./බෝට්ටුවකට/දිනකට විය.

1.5 ශ්‍රී ලංකාවේ දකුණු දිග හා බටහිර වෙරළාසන්න ප්‍රදේශවල ධීවර කර්මාන්තයේ ජෛව-ආර්ථික අධ්‍යයනය
මෙහිදී දකුණුදිග හා බටහිර වෙරළේ දත්ත එක්රැස් කරනු ලබන ස්ථානවල සාම්පල කටයුතු සති 2කට වරක් සිදුකරන ලදී. ධීවරයින් විසින් සිදුකරන ලබන දත්ත සටහන් කිරීමේ පොත් භාවිතයෙන් පටනන්ගල ප්‍රදේශයේ කාලීන මත්ස්‍ය ඇල්ලීම පිළිබඳ ජෛව-ආර්ථික දත්ත සංසන්දනාත්මක අධ්‍යයනයක් සඳහා එකතු කරන ලදී. දකුණු දිග හා බටහිර වෙරළේ අත්යොත් පන්න යොදා සිදුකරනු ලබන මත්ස්‍ය ඇල්ලීම් බහුලව දක්නට ලැබේ. මීගමුව හා හලාවත ප්‍රදේශවල අධ්‍යයන මාස 4කදී අත්යොත් යොදා හා ට්‍රෑමල් නෙට් භාවිතයෙන් මත්ස්‍ය ඇල්ලීමේ ක්‍රම වැඩිවිය.

1.6 ශ්‍රී ලංකාවේ වයඹ දිග වෙරළාසන්න ප්‍රදේශවල වාණිජමය වශයෙන් හා ඉහල සුලබතාවකින් යුත් මුහුදු කුඩැල්ලන් විශේෂවල (හොලතුරියා ස්කාබ්‍රා හා හොලතුරියා ඇට්‍රා) ප්‍රජනනය සන්සන්දනය කිරීම.

මෙම විශේෂ දෙකෙහිම ප්‍රජනන ඉන්ද්‍රියවල වර්ධනය කාලය සමග ප්‍රස්ථාරගත කලවිට වැඩිවීම අවස්ථා 2ක් වාර්තා වේ. නමුත් හොංස්කැබ්‍රාවල සීඝ්‍රතාව හොංඇට්‍රාවලට වඩා පමාවිය. මෙමගින් හෙළිවූයේ මාර්තු සිට අප්‍රියෙල් දක්වා හා සැප්තැම්බර් සිට නොවැම්බර් දක්වා හොංස්කැබ්‍රාවල බිත්තර දමන කාලය බවත්, හොංඇට්‍රා වල එය අප්‍රියෙල් සිට මැයි හා ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා බවත්ය. මෙම විශේෂ දෙක සඳහා වගාකිරීම ආරම්භය සඳහා සුදුසුම කාලය මාර්තු සිට මැයි දක්වාය.

1.7 දකුණු දිග වෙරලේ වටකරනු ලබන දැල් පිලිබඳ ජෛව-ආර්ථික අධ්‍යයනය

වටකරනු ලබන දැල් භාවිතයෙන් සිදුකරනු ලබන ධීවර කර්මාන්තය පිලිබඳ අධ්‍යයනයක් අවුරුද්ද පුරා වැලිගම, මිරිස්ස, දෙවුන්දර, කුඩාවැල්ල හා කෝට්ටේගොඩ යන ප්‍රදේශවල සිදු කෙරිණි. මෙහිදී අල්ලනු ලබන වේගය නිදහස්ව පිහිටනු ලබන මත්ස්‍ය කාණ්ඩවල වෙනස්වීම මත දිනපතා විවිධ විය. මෙහිදී මසුන් අස්වැන්න නෙලීමේ සීඝ්‍රතාව 0-600 කි.ග්‍රෑ./බෝට්ටුවකට විය. ප්‍රධාන වශයෙන් ටූනා මසුන් මෙම අස්වැන්නේ විය. නිරිතදිග මෝසම්වල බලපෑම නිසා මැයි මස ආරම්භයේදීම මෙම ටූනා මසුන්ගේ අස්වැන්න අඩු විය. සමහර වටකරනු ලබන දැල් සමග කුඩා ඇස් සහිත කරමල් දැල් (1" - 1.75") භාවිතා විය.

**බාහිර ප්‍රතිපාදන යටතේ වූ ව්‍යාපෘති**

සරෙක් ව්‍යාපෘතිය මගින් සපයන ලද ප්‍රතිපාදන යටතේ වෙරලාසන්න පරිසර පද්ධති අධ්‍යයන වැඩ සටහන යටතේ පුත්තලම/මුන්දල මෝය පද්ධති පිලිබඳ අධ්‍යයනය

සැප්තැම්බර් මාසය දක්වා උඩප්පුව සිට මාම්පුරි දක්වා වෙරලාසන්න ධීවර කර්මාන්තය යටතේ අල්ලනු ලබන ප්‍රමාණය/ අල්ලනු ලබන කාර්යක්ෂමතාව (බෝට්ටු ගණන) පිලිබඳ දත්ත එක්රුස් කරන ලදී. එතැන් පටන් ක්ෂේත්‍ර අධ්‍යයන සිදු නොකෙරිණ. දත්ත විශ්ලේෂණය හා විද්‍යාත්මක වාර්තා පිලියෙල කිරීම සිදුකරන ලදී.

සමාජ-ආර්ථික තත්වය පිලිබඳ අධයයනයක් සිදු කරන අධ්‍යයනයේ අඩුපාඩු මගහරවා ගන්නා ලදී. මෙහිදී සමාජ - ආර්ථික දත්ත විශ්ලේෂණයද අවසාන වාර්තාව පිලියෙල කිරීමද සිදුකරන ලදී.

2.2 ටී.සී.පී. ව්‍යාපෘතිය යටතේ පාවෙන දැල් හා මරුවැල් ධීවර කර්මාන්තය සඳහා සමීක්ෂණ පද්ධතියක් පිහිටුවීම/ ටී.සී.පී./එස්.ආර්.එල්/2251(ඒ)-FAO ප්‍රතිපාදන

පාවෙන දැල් හා මරුවැල් භාවිතයේ සිදුකරන මසුන් ඇල්ලීම පිලිබඳ දත්ත එක්රුස් කිරීමක් අවුරුද්ද පුරා ක්‍රියාත්මක කරන ලද අතර එම දත්ත පර්යන්ත ගත කරන ලදී. පෙර අවුරුද්දේ එකතු කරනලද දත්ත විශ්ලේෂණය සිදුකරන ලදී. මෙම ව්‍යාපෘතිය 1994 දෙසැම්බර් වලදී අවසන් කරන ලද අතර, නාරාආයතනය මගින් තවදුරටත් දත්ත එකතු කරන්නන් යොදා දිගටම දත්ත එකතු කිරීම සිදුකරන ලදී. මෙම ව්‍යාපෘති එකගත්ව වාර්තාවේ සඳහන් වන පරිදි ව්‍යාපෘතිය අවසානයේදී ඒ සඳහා තාවකාලික ව බඳවාගන්නා ලද කාර්ය මණ්ඩලය ස්ථිර කිරීමට සැලසුම්කර ඇත.

2.3 ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවතුල සම්පත් සමීක්ෂණය (ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ)

මෙම ව්‍යාපෘතිය සඳහා පත්කරන ලද උපදේශකයින් ශ්‍රී ලංකාවේ කරන ලද සම්පත් සමීක්ෂනය පිලිබඳ විමර්ෂණ හා ඉන්දියන් සාගරයේ යොත්පත්න ධීවර කර්මාන්තය පිලිබඳ විමර්ශණය කරන ලදී. මෙහිදී සම්පත් සමීක්ෂණය මගින් ලබාගත් දත්ත විශ්ලේෂණය සඳහා පරිගණක දත්ත සැකසුමක් පිලියෙල කිරීම සිදුකරගෙන යනු ලැබේ.

සම්පත් සමීක්ෂණ යාත්‍රා 2ක් සඳහා ජාත්‍යයන්තර වශයෙන් අයදුම්පත් කැඳවන ලදී. ක්ෂේත්‍ර පරික්ෂන කටයුතු සඳහා තෝරා ගන්නා ලද ධීවර යාත්‍රාවල දත්ත සටහන් පොත් ලබාදෙන ලදී.

2.4 රුකව කලපුවේ ඉස්සන් පැටවුන් මුදාහැරීමේ රටාව පිලිබඳ අධ්‍යයනය

අවුරුද්දේ පලමු මාස 4ක කාලයේදී ඉස්සන් ඇල්ලීම ඉහල වූ අතර එය මෙ. ටො.4ක් පමණ විය. නිරිතදිග මෝසම්වල බලපෑම නිසා ඉස්සන් නිෂ්පාදනය අඩුවන අතර මැයි මාසයේදී එය අවම වේ. මෙම කලපුවේ මත්ස්‍ය හා ඉස්සන් නිෂ්පාදනය අවම වනුයේ ජූනි සිට සැප්තැම්බර් අතර කාලයේදීය. මෙහිදී මෙම අවුරුද්දේ මෝය කට කීප වරක් කපා මුහුදට විවෘත කරන ලද අතර ජූලි - නොවැම්බර් කාලයේදී දිගටම කලපුව මුහුද හා සම්බන්ධව පවතී. 1994 ඔක්තෝම්බර් මස කලපුව තුල මත්ස්‍ය "කෑල්" සාදාතිබූ අතර පසුව ඉස්සන් නිෂ්පාදනය අඩුවීම නිසා ඒවා ඉවත් කරන ලදී.

2.5 කොරල් පර අධ්‍යයනය

වයඹ පලාතේ ක්ෂේත්‍ර කටයුතු

මෙම අධ්‍යයන කටයුතු 1993දී ආරම්භ කරන ලද අතර මෙම කොරල් පරවල තත්වය අධ්‍යයනය 1994 වසරේදීද සිදු කෙරිණි.

ජීවී කොරල් ප්‍රමාණය හානි සිදුවී ඇති කොරල් ප්‍රමාණය, මෙම හානිවල ව්‍යාප්තිය හා කොරල් පරවල තත්වයන් පිළිබඳ අධ්‍යයනයන් කරන ලදී. මේ සඳහා මාම්පුරි හා කන්දකුලිය ප්‍රදේශවල පිහිටි බාර් කොරල්පරය පිළිබඳ අධ්‍යයනය කිරීම සිදු කෙරිණ. මෙහිදී වඩාත් වැදගත් වූ සොයාගැනීම වූයේ 1992 වර්ෂයේදී මෙම කොරල්පරය කෙරෙහි මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය බලපෑ අතර 1994 වර්ෂයේදී එම හානිය ඇකැග්නැස්ටර් ප්ලැග්සි නැමැති මසුන් මගින් සිදුවී තිබීමයි.

**දකුණු හා ගිණිකොණ ප්‍රදේශවල ක්ෂේත්‍ර කටයුතු**

කිරින්ද ප්‍රදේශයේ ග්‍රේට් බාසස් පරය පිළිබඳ මූලික සමීක්ෂණයක් සිදු කෙරිණි. මෙම මූලික සමීක්ෂණය මගින් කොරල් විශේෂ වල විවිධත්වය, මත්ස්‍ය හා අනෙකුත් ජීවීන් හා ධීවර කර්මාන්ත කටයුතු පිළිබඳ තොරතුරු එක්රැස් කරන ලදී.

2.6 හික්කඩුව කරදිය අභයභූමියේ පරිපාලනය සඳහා වූ විශේෂ පරිපාලනමය සැලැස්ම

පරිපාලනමය සැලැස්ම පිළියෙල කිරීමේ අරමුණෙන් හික්කඩුව හා රූකව ප්‍රදේශ සඳහා USAID ආධාර යටතේ වෙරළාසන්න සම්පත් පරිපාලන ව්‍යාපෘතියේ විශේෂ ප්‍රදේශ පරිපාලනමය වැඩ සටහනක් ක්‍රියාත්මක කරගෙන යන ලදී. නාරා ආයතනය මගින් 1985 හා 1992 සිදුකරන ලද මූලික අධ්‍යයන මගින් හෙළිවන්නේ විවිධ ක්‍රියාකාරකම් නිසා මෙම කොරල්පරයේ තත්වය පහත් මට්ටමකට පැමිණ ඇති බවයි.

මෙහිදී අධ්‍යයන කටයුතු සඳහා සලකුණු කරන ලද ද්‍රව්‍ය මනුෂ්‍යයින් විසින් ඉවත් කර තිබූ අතර ස්ථිර සලකුණු ක්‍රමයක් 1994දී භාවිතා කරන ලදී.

ඉදිරිපත් කරන ලද ප්‍රකාශණ හා පර්යේෂණ පත්‍රිකා

1994 දෙසැම්බර් 2 දින පැවති නාරා 2වන වාර්ෂික විද්‍යාත්මක සැසියේදී පහත පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී.

1. දයාරත්න පී. හා කේ. ජේ. සිවකුමාරන්
   ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළේ හැඹිලිදැල් ධීවර කර්මාන්තය පිළිබඳව ජෛව ආර්ථික තක්සේරුව

2. සිවකුමාරන් කේ. ජේ. හා පී. දයාරත්න
   ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිතදිග වෙරළේ මාදැල් ධීවර කර්මාන්තය පිළිබඳ ජෛව-සමාජ ආර්ථික තක්සේරුව පිළිබඳ මූලික අධ්‍යයන

3. ජයකොඩි ඩී. එස්. හා එස්.එස්. සී. පීරිස්
   ශ්‍රී ලංකාවේ බටහිර හා නිරිතදිග මුහුදේ මසුන් එක්රැස් කිරීමේ ඇටවුම් පිළිබඳ මූලික අධ්‍යයනය

4. රාජසූරිය ඒ. හා කවිෂ් රත්නප්‍රිය
   කන්දකුලිය මුහුදේ බාර් කොරල් පරයේ අකන්තෙස්ටර් ප්ලන්සි තාරකා මත්සයන් බහුලතාව හා ඔවුන් පාලනය සඳහා පිළියම්

5. මොයිදීන් එම්. එම්.
   වඩාත් බහුල මුහුදු කුඩැල්ලන් වර්ග දෙකක ප්‍රජනන-ජීව විද්‍යාව සන්සන්දනාත්මක අධ්‍යයනය

6. ජයවර්ධන පී.පී.ඒ.ටී. ජයවර්ධන හා පී. දයාරත්න
   ශ්‍රී ලංකාවේ වයඹ වෙරළ ප්‍රදේශයේ කන්දකුලියේ පියාමැස්සන්ගේ ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය

7. මල්දෙනිය ආර්.
   මීගමුව පතුලේ අත්යොත් භාවිතයෙන් සිදුකරන ධීවර කර්මාන්තය - එය හඳුන්වාදීමෙන් දශකයකට පසු

8. අමරසූරිය ඩී. හා පී. දයාරත්න
නිරිතදිග වෙරළේ හා බටහිර වෙරළේ ප්‍රදේශවලට ගෙන එනු ලබන විශාල නිතලවාසී මත්ස්‍ය අස්වැන්නේ මෝරුන් වර්ග 7ක් පිළිබඳ අධ්‍යයනය.

9. දයාරත්න පී. හා ආර්. මල්දෙණිය
NW35 යාත්‍රාව මඟින් අල්ලනු ලබන විශාල නිතලවාසී මසුන් පිළිබඳ අධ්‍යයනය

10. රාජසූරිය ඒ.
ශ්‍රී ලංකාවට නව ගල්මල් (කොරල්) ගන 3ක් හා විශේෂ 12ක්

පහත පර්යේෂණ පත්‍රිකා 49වන ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන වාර්ෂික විද්‍යාත්මක සැසියේදී ඉදිරිපත් කෙරිනි.

1. මල්දෙණිය ආර්. හා වී.ඒ. රාජපක්ෂ
ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර වෙරළවල අල්ලනු ලබන ස්නැපර්ස් මසුන්ගේ (කුලය ලුම්ජානිඩේ) වර්ගීකරණය

2. දයාරත්න පී. හා කේ. පී. සිවකුමාරන්
ශ්‍රී ලංකාවේ නිරිතදිග ප්‍රදේශයේ වටකරනු ලබන ඇල් ධීවර කර්මාන්තයේ ජෛව සමාජ ආර්ථික තක්සේරුව

පහත සඳහන් පර්යේෂණ පත්‍රිකා ශ්‍රී ලංකා/එෆ්.ඕ.ඕ. වැඩ මුළුවේදී ප්‍රජා මට්ටමේ ධීවර පරිපාලන පද්ධති සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය

දයාරත්න පී.
ධීවර කර්මාන්තය පරිපාලනය සඳහා උපාධී මාර්ග සැලසුම් කිරීම සඳහා තොරතුරු පිළියෙල කිරීම

ජයකොඩි ඩී. එස්.
මීගමු කලපුවේ පාරම්පරික ධීවර කර්මාන්තය

පුහුණු පාඨමාලා/වැඩ මුළු

1. වෙරළ සංරක්ෂන දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කල වෙරළ සම්පත් පරිපාලනය යන මැයෙන් වූ පුහුණු පාඨමාලාවකට සහභාගී විය.
2. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සංවිධානය කරන ලද පුහුණුවන ගුරුවරුන් සඳහා දේශණ කිරීමට සම්පත් දායකයින් වශයෙන් සහභාගී විය. මෙම වැඩමුළුව 1994 ජූනි 21 සිට 25 දක්වා හික්කඩුවේදී පැවැත්විනි.
3. 1994 ජූලි මස නාරා ආයතනයේ පැවති සූරතල් මසුන් වගා කිරීමේ පුහුණු පාඨමාලාවකට එක් නිලධාරියෙකු සහභාගී විය.
4. 1994 ජූලි 7 දින නරේසා ආයතනයේ පැවති වෙරළාසන්න පාරිසරික උපදේශක කමිටු රැස්වීමකට නිලධාරීන් දෙදෙනකු සහභාගී විය.
5. 1994 ජූලි 30 "ජෛව විවිධත්වය සංරක්ෂණය සඳහා ජාතික උපායමාර්ග සංවර්ධනය" යන මැයෙන් පැවති වැඩ මුළුවකට නිලධාරීන් දෙදෙනකු සහභාගී විය. මෙම වැඩමුළුව පාරිසරික අමාත්‍යාංශයේ සංවිධානය කරන ලදි.
6. 1994 සැප්තැම්බර් 18 සිට 22 දක්වා දික්වැල්ල රෙලාස් හෝටලයේ පැවති සංචාරක කර්මාන්තය හා වෙරළාසන්න සම්පත් පරිපාලනය යන මැයෙන්වූ දේශණයකට සම්පත් දායකයකු වශයෙන් නිලධාරියෙකු සහභාගී විය.

ශ්‍රී ලංකාවේ ඉන්ටර්කොන්ටිනෙන්ටල් හෝටලයේ ඔක්තෝබර් 3 සිට 5 දක්වා පැවති ප්‍රජා මට්ටමේ ධීවර කර්මාන්තය පරිපාලනය යන මැයෙන් වූ වැඩ මුළුවකට නිලධාරීන් පස් දෙනකු සහභාගී විය.

# අභ්‍යන්තර ජලජීවී සම්පත් හා ජලජීවී වගා අංශය

**ව්‍යාපෘති**

1. ඉස්සන් වගා ගොවිපල වලින් බැහැර කරනු ලබන ද්‍රව්‍ය පිලිබඳ අධ්‍යයනය (සරෙක් ව්‍යාපෘතිය)

සරෙක් ව්‍යාපෘතිය යටතේ, ඉස්සන් වගා කිරීම සඳහා ජලය ගනු ලබන ප්‍රධාන ජල ප්‍රභවවල, ජලයේ තත්වය අධ්‍යයනය කිරීම. මෙහිදී තෝරාගන්නා ලද ගොවිපලවල බැහැර කරනු ලබන ජලයේ තත්වය තත්වය ඉහල නැංවීම සඳහා මොලස්කාවන් භාවිතා කිරීමට ඇති හැකියාව සොයාබලන ලදී. මෙහිදී බැහැර කරනු ලබන ජලය ගලායන ඇල මාර්ගවල දෙපියන් බෙල්ලන් හා ගොළු බෙල්ලන් ජීවත්වීම හා වර්ධනය අධ්‍යයනය කරන ලදී.

අවුරුද්දේ සැලකිය යුතු කාලයක් මෙම ප්‍රධාන ජලය ලබාගන්නා ඇල මාර්ගවල ජලයේ තත්වය සම්පූර්ණ අවලම්භිත අංශු හා දේහ ක්‍රියාකාරිත්වයන් නිසා බැහැරවන විෂද්‍රව්‍ය සාමාන්‍ය උපරිම තත්වයක විය.

2. කලපු කකුළුවා තර කිරීම

කකුළුවන් වගාකිරීමේ මූලික පර්යේෂණ ආරම්භ කරන ලදී. පයිබර් ග්ලාස් ටැංකිවල බහාලූ අඩු බරක් සහිත කකුළුවන් ඔවුන්ගේ දේහ බරින් 5-8% දක්වා ආහාර ලබාදෙන අතර වර්ධන වේගය අධ්‍යයනය කරන ලදී. මෙයට පෙර එසේ කකුළුවන් තර කිරීම පිලිබඳ ඉදිරිපත් කර තිබෙන පර්යේෂණ පත්‍රිකා අධ්‍යයනය කරන ලදී.

3. කල්පිටිය ප්‍රදේශයේ ආටිමියා වගාව

ජලය හා විදුලි බලය සැපයීම මගින් කල්පිටිය ප්‍රාදේශීය පර්යේෂන මධ්‍යස්ථානයේ වූ පොකුණු අළුත්වැඩියා කරන ලදී. මෙහිදී වගාව පිලිබඳ පර්යේෂණ චේක්කයින් පැටවුන් 500 හඳුන්වාදීම මගින් සිදුකරන ලදී.මෙහිදී චේක්කයින් 500 හා ඉස්සන් 1500 යොදා බහු වගාවක් ආරම්භ කරන ලදී. කාබනික පොහොර නිෂ්පාදනය වැඩි කිරීමට පොකුණුවලට එක්කරන ලද අතර, වී කුඩු ආහාර වශයෙන් යොදන ලදී.

4. කණ්ඩලම ප්‍රදේශයේ මිරිදිය ධීවර කටයුතුවල යෙදෙන ධීවර ප්‍රජාවේ සමාජ විද්‍යාත්මක අධ්‍යයනය

මෙහිදී මූලික වශයෙන් දත්ත එක්රැස් කිරීම සම්පූර්ණ කරන ලද අතර, කණ්ඩලම වැව අවට වූ ගම් 3ක ජීවත්වන ජනයා සම්පූර්ණ කරන ලද අතර, කණ්ඩලම වැව අවට වූ ගම් 3ක ජීවත්වන ජනයා සම්බන්ධව සමාජ විද්‍යාත්මක දත්ත එක්රැස් කෙරිණි.

5. ඉස්සන් වගාව සඳහා යොදාගනු ලබන ප්‍රදේශවල සමාජ විද්‍යාත්මක ගැටළු, පාරිසරික සොයාබැලීම්, එම ප්‍රදේශ පාවිච්චි කිරීම නිසා ඇතිවූ වෙනස්කම් හා ඉඩම් පාවිච්චි කරන්නන් අතර අර්බුද.

මෙහිදී අළුතින් ඉදිකරන ලද ඉස්සන් වගා ගොවිපලවල ස්ථානය, පසේ තත්වය හා ජලයේ තත්වය පිලිබඳ තොරතුරු එකතු කරන ලදී. ඉස්සන් වගාකරන ප්‍රදේශවල මුලදී එම බිම පාවිච්චි කිරීමේ රටාව හා ඒවායේ සිදුවිය හැකි වෙනස්කම් පිලිබඳ අධ්‍යයනය කරන ලදී.

6. බෙල්ලන් බාහිර පරිසරයෙන් ලබාගන්නාවූ අංශුමාත්‍ර මූල ද්‍රව්‍ය, ඇනට ඔවුන් එකතු කිරීම හා ඔවුන්ගේ ව්‍යාප්ති රටාව අධ්‍යයනය කිරීම.

මෙයට අයත්වූයේ (1) මීගමු කලපුවේ ආහාරය සඳහා ගන්නාවූ බෙල්ලන්ගෙන් ව්‍යාප්ති රටාව අධ්‍යයනය, (2) බෙල්ලන්ගේ ව්‍යාප්තිය කෙරෙහි පාරිසරික සාධකවල බලපෑම අධ්‍යයනයයි. මේ සඳහා කලපුවේ ස්ථාන 6ක් තෝරාගන්නා ලදී. මෙහිදී මෙම ස්ථාන 6හි පසේ ව්‍යුහය හා කාබනික ද්‍රව්‍ය ප්‍රමාණයද අධ්‍යයනය කරන ලදී. එකතු කරන ලද බෙල්ලන් සාම්පලවල අංශු මාත්‍ර මූල ද්‍රව්‍ය අධ්‍යයනය කරන ලදී.

7. බෙල්ලන් වගා කිරීමේ වැඩ සටහන (දකුණු පලාත් සභාව)

මේ සඳහා දකුනු පලාත් සභාවට ව්‍යාපෘතියක් ඉදිරිපත් කරන ලද අතර රු. 150,000ක් ලබාදෙන ලදී. මෙහිදී රුමස්සල බොක්කේ ජලයේ පාවෙන මැසි (8 x 5 මීටර) සාදන ලද අතර එක් මැස්සක ප්ලාස්ටික් කුඩ ආධාරයෙන් දුඹුරු බෙල්ලන් (Perna perna) 25,000 තැන්පත් කරන ලදී. මෙහිදී කුඩා බෙල්ලන් රුකව පරයෙන් එක්රැස් කරන ලද අතර ඒවා වගාකරන ලද ප්‍රදේශයට ප්‍රවාහනය කරන ලදී. මෙම වගා කටයුතු සඳහා ධීවර පවුල් 3ක් සහභාගී වන ලදී. මෙහිදී බෙල්ලන් තැන්පත් කරන ලද බාස්කට් ශුද්ධ කිරීමේ සතියකට වරක් සිදු කෙරිණි. සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

මගින් මෙම බෙල්ලන්ට එම ප්‍රදේශවල ජනතාවගේ හා සංචාරක හෝටලවල ඇති ඉල්ලුම පිළිබඳ සොයාබලන ලදී.

8. එතරම් උචිත නොවන පස් අඩංගු ප්‍රදේශවල ඉදිකරන ලද ඉස්සන් වගා ගොවිපලවල රෝග ඇතිවීම පරීක්ෂා කිරීම.
වෙරලාසන්න ප්‍රදේශවන හලාවත කලපුව අවට, ඩච් ඇල, මුන්දලම කලපුව අවට හා මී ඔය මෝය අවට ප්‍රදේශය අවට ප්‍රදේශවල ඉදිකරන ලද ඉස්සන් වගා පොකුණු වල දත්ත එක්රැස් කරන ලදී. මෙහිදී ව්‍යාධිජනක ආකාර හා පොදු රෝග ලක්ෂණ පිළිබඳව ගොවිපල ප්‍රදේශ පරීක්ෂා කරන ලදී.

9. ඉස්සන් වගාව හා පරිසරය
ආසියා ශාන්තිකර කලාපයේවූ NACA ජාත්‍යන්තර ආයතනය මගින් මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදී. නියම ආකාරයෙන් පරිසරයට හානියක් නොවන පරිදි අස්වැන්න ලබාගැනීම ඒවා සැලසුම් කිරීම හා පරිපාලනය සඳහා ප්‍රතිපත්ති සකසනු ලබන අය හා ගොවීන්ට මෙම අධ්‍යයනය වැදගත් වේ.
ප්‍රශ්ණ මාලාවක් උපයෝගී කොටගෙන ගොවිපල 170ක් පරීක්ෂා කරන ලදී. මෙහිදී ගණන් ගන්නන් 12ක්ද, පරීක්ෂකයින් දෙදෙනකුද සහභාගී වන ලදී.

10. ශ්‍රී ලංකාවේ ස්ටර්පත් මත්ස්‍යයින් වාණිජ තත්වයෙන් වගාකීමේ හැකියාව සොයාබැලීම
මෙහිදී සෝවියට් රුසියාවේ ධීවර අමාත්‍යාංශය අනුබද්ධ වොල්ගොගොඩ් සටර්ජන් ඇති කරනු ලබන ආයතනය හා ඒකාබද්ධව සිදුකරන ලදී.

**අරමුණු:**
* වොල්ගොගොඩ්වල සිට ශ්‍රී ලංකාවේ උඩවලව අභිජනන මධ්‍යස්ථානය දක්වා බිත්තර මඩිය සහිත කීටයින් ප්‍රවාහනය කිරීමට ඇති හැකියාව සොයාබැලීම
* පාලනය කරන ලද පාරිසරික තත්ව යටතේදී බිත්තර කීටයන් ඇඟිල්ලක් දක්වා වර්ධනය කරවීමට ඇති හැකියාව
* මෙම ඇඟිල්ලන්ගේ සිට ඉහල උෂ්ණත්ව තත්ව යටතේදී වෙළඳපොලට යැවීමට සුදුසු තත්වයක දක්වා වර්ධනය කිරීම පිළිබඳ අධ්‍යයනය

මෙහිදී බිත්තර මඩි කීටයන් ප්‍රවාහනය ඉහල ප්‍රමාණයක ජීවත්වීමේ හැකියාවක් ඇතිව සාර්ථකව සිදුකරන ලදී. බාහිර ටැංකිවල බහාලූ මසුන්ගේ ඉහල වර්ණ අනුපාතයක් දක්නට ලැබුණි. $22^{0}c$ දක්වා උෂ්ණත්වය පාලනය කලාවූ තත්ව යටතේදී වීදුරු ටැංකිවල ජීවත් වීමේ වේගය 60% විය. මාස 7ක කාලයකදී 130 ග්‍රෑ. දක්වා වර්ධනය විය.

**පර්යේෂණ පත්‍රිකා**

1. කිත්සිරි එච්.එම්.පී.
පුත්තලම කලපුවේ වාණිජමය වශයෙන් වැදගත්වන දෙපියන් බෙල්ලන් වර්ග තුනක බහුලතාව කෙරෙහි මුහුදු පැලෑටි ප්‍රමාණයේ බලපෑම - නාරා වාර්ෂික විද්‍යාත්මක සැසිය - 1994

2. කිත්සිරි එච්.එම්.පී.
පුත්තලම කලපුවේ දෙපියන් බෙල්ලන්ගේ ධීවර කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය - SLAAS 1994

3. කුරුප්පු එම්. එම්.
වාණිජමය බීජ රැකවුම් මධ්‍යස්ථානවල භාවිතා කරනු ලබන ශ්‍රී ලංකා ආටීමියා විශේෂයේ පෝෂ්‍ය තත්වය හා ප්‍රමාණය පිළිබඳව සලකා බැලීම - නාරා වාර්ෂික විද්‍යාත්මක සැසිය 1994

4. කුරුප්පු එම්.එම්.
ශ්‍රී ලංකාවේ ආටීමියා පැතෙනොජෙන්ටිකාවල ජීවන චක්‍ර
දකුණු ආසියා ජාතික ඉතිහාසය යන සඟරාව සඳහා පර්යේෂණ පත්‍රිකාවක් යවන ලදී.

5. ජයසිංහ, ජේ.එම්.පී.කේ.
වයඹ පලාතේ ඉස්සන් වගා පද්ධතිවල ප්‍රදේශ තක්සේරු කිරීම: පසේ තත්ව පරීක්ෂාව SLAAS 1994

6. කොරයා, ඒ.එස්.එල්.ඊ., ඒකරත්න එස්.යූ.කේ., ජයසිංහ ජේ.එම්.පී.කේ.
ඩව් ඇලෙහි ජලයේ තත්වය: ශ්‍රී ලංකා ඉස්සන් වගා කිරීමේ කර්මාන්තයේදි භාවිතා කරන ප්‍රධාන ජලය ලබාගන්නා ප්‍රභවය :SLAAS 1994

7. කොරයා, ඒ.එස්.එල්.ඊ. ඒකරත්න එස්.යූ.කේ. හා එදිරිසිංහ යූ.
කරඅඩු ඉස්සන් වගාකරනු ලබන මඩ පොකුණුවල පතුලේ ජීවත්වන්නන්, ජලවාංග හා පසේ තත්වය කෙරෙහි ජලය හුවමාරු කිරීමේ බලපෑම

8. විජේසේකර ආර්.ජී.එස්., ජයසිංහ ජේ.එම්.පී.කේ. හා එදිරිසිංහ යූ.
කරඅඩු ඉස්සන් වගාකරනු ලබන මඩ පොකුණුවල පතුලේ ජීවත්වන්නන්, ජලවාංග හා පසේ තත්වය කෙරෙහි ජලය හුවමාරු කිරීමේ බලපෑම

9. එදිරිසිංහ යූ., වන්නිගම ජේ.පී. හා ජයසිංහ ජේ.එම්.පී.කේ.
කරදඩු ඉස්සාගේ වර්ධනය කෙරෙහි හා මඩ පොකුණුවල ජලයේ තත්වය කෙරෙහි ජලය හුවමාරු කිරීමේ ප්‍රතිශතයේ බලපෑම
SLAAS 1994

10. ගුණවර්ධන අයි.එම්.පී. කේ., එදිරිසිංහ යූ. හා ජයසිංහ ජේ.එම්.පී.කේ.
දේශීය අමුද්‍රව්‍ය භාවිතා කර ඉස්සන් සඳහා ආහාර පිළියෙල කිරීම - SLAAS 1994

11. ජයසිංහ ජේ.එම්.පී.කේ., සුනිල් ඩබ්ලිව් හා එදිරිසිංහ යූ.
ඉස්සන් බීජ ගොවිපලවල ආර්ථික වර්ධනය - SLAAS 1994

12. වන්නිනායක ඩබ්.එම්.ටී.බී. හා බ්‍රැන්ඩ් ජී. ආර්.
එක්සත් රාජධානියේ අයිරිස් මුහුදේ වෙසෙන ඇක්‍යුපෙක්ටන් ඔපෙක්‍යුලාරිස් හා පෙක්ටන් මැකිසිමස් දෙපියන් බෙල්ලන්ගේ ජීවන චක්‍ර අධ්‍යයනය
නාරා වාර්ෂික විද්‍යාත්මක සැසිය.

13. සිරිවර්ධන පී.පී.ජී.එස්.එන්., හා රානා කේ. ජේ. හා බර්ඩ් ඩී.ජේ.
තිලාපියා බිත්තර මඩි කීටයන් ලෝහ වර්ගවලට නිරාවරණය කලවිට ලෝහ තත්වයන් දරාගැනීමේ විවිධත්වය: පර්යේෂණාගාරවලදී ලබාගත් විෂවීමේ පර්යේෂණ ක්ෂේත්‍රයේදී භාවිතා කිරීම සම්බන්ධව සොයාබැලීම
නාරා විද්‍යාත්මක සැසිය - 1994

14. සිරිවර්ධන පී.පී.ජී.එස්.එන්.
කැඩ්මියම් ලෝහයේ වෙනස් තත්වයන් කෙරෙහි තිලාපියා බිත්තර මඩි කීටයන්ගේ ක්ෂුද්‍රව්‍යුහයක ලෙස වෙනස්වීම
නාරා විද්‍යාත්මක සැසිය සඳහා පෝස්ටරයක් ඉදිරිපත් කරන ලදී. (1994)

වාර්තා

- ජාතික අධ්‍යයන ආයතනය සඳහා සුරතල් මසුන් ඇති කිරීම පිලිබඳව පහත මාතෘකා යටතේ පරිච්ඡේද 4ක් ලියන ලදී.
  1. මෙම කර්මාන්තයේ වැදගත්කම
  2. මසුන් හඳුනාගැනීම
  3. සුරතල් මසුන් අභිජනනය
  4. පෝෂණය
- සුරතල් මසුන් වගාකිරීමේ මූලික සිද්ධාන්ත - ගුරුවරුන් සඳහා
- පස් අවුරුදු ධීවර සැලැස්ම - ජීව මසුන් අපනයනය
- ජාතික අධ්‍යාපන ආයතන සඳහා සුරතල් මසුන්ගේ ලෙඩරෝග යන මැයෙන් පොත් පිංචක් පී.කේ.එම්. විජේගුණවර්ධන මිය විසින් පිලියෙල කරන ලදී.
- නාරා ආයතනය මගින් සංවිධානය කරන ලද සුරතල් මසුන් ඇති කිරීමේ පුහුණු පාඨමාලාව සඳහා මත්ස්‍ය රෝග මැයෙන් දේශණ පිලියෙල කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනය මගින් 10 - 11 වසර සඳහා පිලියෙල කල විෂය නිර්දේශය සඳහා මත්ස්‍ය රෝග

මැයෙන් පරිච්ඡේද ලිවීම

- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවට ආරම්භයා ව්‍යාපෘතියේ අවසාන වාර්තාව සැකසීම
- ජීව මසුන් අපනයනය පිළිබඳ වාර්තාව
- ඉස්සන් වගාව පිළිබඳ පත්‍රිකාව

**උපදේශක සේවා**

ඉස්සන් ගොවිපල සඳහා ස්ථාන 46 පරීක්ෂා කරන ලදී.

මුළු ආදායම - 512,875 විය.

**අනෙක් ක්‍රියාකාරකම්**

**සුරතල් මසුන් වගාව**

- විශ්ව විද්‍යාල, නාරා ආයතනය හා අනෙක් අදාල ස්ථානවල ආධාරයෙන් සහභාගීවන්නන් 40ක් සඳහා මාසයක පුහුණු පාඨමාලාවක් කරන ලදී.

**එක් දවසේ පාඨමාලා**

වැඩ සටහන් 05ක් - යක්කල

වැඩ සටහන් 01ක් - නුවර

වැඩ සටහන් 01ක් - උණවටුන

**ඉස්සන් වගාව**

හලාවත, මඩකලපුව හා කොළඹ ඉස්සන් වගාව පිළිබඳ දේශණ කරන ලදී.

- පාරිසරික ඇගැයීම් කමිටු රැස්වීම් සඳහා සහභාගී විය.

**පශ්චාත් උපාධි අධ්‍යයන**

සාමාජිකයින් 07 දෙනෙකු පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල යෙදේ. එක් නිලධාරියෙකු තමාගේ දර්ශන විශාරද උපාධිය නිම කරන ලදී.

A. ශ්‍රී ලංකාව තුල
දර්ශපති - 02
විද්‍යාපති - 01

B. විදේශ
දර්ශන විශාරද - 01

**ධීවර තාක්ෂණ අංශය**

**කාර්ය මණ්ඩලය**

| | | |
|---|---|---|
| ඩී.එස්. ජයකොඩි | - | සහකාර අධ්‍යක්ෂ |
| එස්. එස්. සී. පීරිස් | - | පර්යේෂණ සහකාර |
| ඩබ්ලිව්.ජී. සිරිසේන | - | පර්යේෂණ සහකාර |
| පී. එම්. ධර්මසේන | - | පර්යේෂණ සහකාර |
| ඩැන්ටන් සිල්වා | - | රසායනාගාර සහකාර |
| පී.ඩබ්ලිව්. ගුණසේකර | - | බෝට්ටු ක්‍රියාකරු |

**සාමාන්‍ය අදහස්**

මෙම අවුරුද්ද තුලදී ප්‍රධාන ක්‍රියාකාරකම් තුනක් සිදු කරන ලදී. මෙම අංශයට පර්යේෂණ නිලධාරියෙකු නොමැතිකම නිසා ව්‍යාපෘති කටයුතුවලට බාධා ඇතිවිය. ධීවර තාක්ෂණඥයකු හා ධීවර යාත්‍රා පදවන්නකු වශයෙන් නිලධාරීන් දෙදෙනෙකු බඳවා ගන්නා ලෙසට නාරා ආයතනයේ බලධාරීන්ට ඉල්ලීමක් කරන ලදී. ආසියානු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ධීවර තාක්ෂණ උපදේශකයකු මෙම අංශයට ලබාදෙන ලදී.

**ව්‍යාපෘති**

1. මසුන් එක්රැස් කිරීමේ ඇටවුම් (FADS) - CARP ප්‍රතිපාදන යටතේ

මෙම ඇටවුම වර්ෂයේ ජනවාරි-අප්‍රියෙල් කාලයේදී සාදන ලදී. ප්‍රතිඵල ධෛර්යමත් කරවන සුළුය. රටේ විවිධ ප්‍රදේශවලින් මෙම ඇටවුම් පිලිබඳ ඉල්ලීම් ලැබුණි.
මෙම වර්ෂයේදී ඇටවුම් පහක් සෑදීමට සැලසුම් කරන ලදී. අයහපත් කාලගුණික තත්වය නිසා මෙම ඇටවුම සෑදීම ආරම්භ කලද, ඒවා සම්පූර්ණ කිරීමටත් ඒවා ඇටවීමටත් නොහැකි විය.
ව්‍යාපෘති ඉලක්කය - 100%
ලබාගත් ප්‍රගතිය - 80%

2. කැසිටා ව්‍යාපෘතිය - දකුණු පලාත් සභාවප්‍රතිපාදන යටතේ

ජනවාරි-අප්‍රියෙල් කාලය තුල කැසිටා 01ක් සාදන ලදී. නිරිතදිග මෝසම්වල බලපෑමෙන් ඇතිවූ අයහපත් කාලගුණික තත්වය නිසා කැසිටා සෑදීම නතර කරන ලදී. ජුලි -ඔක්තෝම්බර් කාලයේදී අයහපත් කාලගුණික තත්වය නිසා කැසිටා සෑදීම කෙරෙහි බාධා ඇතිවිය. නව කැසිටා 100ක් සාදා නිමකර ඇති අතර ඒවා සංවර්ධනයට සූදානම් කර ඇත.
ව්‍යාපෘති ඉලක්කය - 100%
ලබාගත් ප්‍රථිඵල - 60%

NW35 යාත්‍රාව දියත් කිරීම

පුද්ගලික අයකුගේ මුදල් ආධාර ඇතිව මෙම බෝට්ටුව යාත්‍රා කරන තත්වයේ තබාගැනීමට කටයුතු කරන ලද අතර, නාරා ආයතනයට අයත් මෙම යාත්‍රාව නිරිතදිග මෝසම් කාලයේ දියත් කරන ලදී. මත්ස්‍ය අස්වැන්න පිලිබඳ දත්ත එක්රැස් කිරීම සඳහා මේ කාලයේදී සැලසුම් කරන ලදී. මෙහිදී යාත්‍රා ගමන් වාර 5ක් සිදුකරන ලදී. මෙහි ප්‍රථම ගමන අංශයට ලබාදීමට සමත්විතය. අනෙක් ගමන් වලින් ඒ කාර්යය කිරීමට නොහැකි විය. එක් එක් යාත්‍රාවලදී නාරා ආයතනයේ නිලධාරියෙකු ගමන් කල අතර ඒ මගින් පුහුණුවක්ද ලබාදෙන ලදී.

**පුහුණුවීම්**

එස්.එස්.සී. පීරිස් මහතා හා ඩබ්ලිව්. ජී. සිරිසේන මහත්වරුන් තංගල්ල පුහුණු විද්‍යාලයට පුහුණු කටයුතු සඳහා ඔක්තෝබර්-නොවැම්බර් මාසවලදී යවන ලදී. මෙම පුහුණුවීමංවලට වියදම ආසියානු සංවර්ධන බැංකු ප්‍රතිපාදන යටතේවූ ව්‍යාපෘතිය මගින් දරණ ලදී. මෙම පුහුණු පාඨමාලාව ධීවර ආම්පන්න නිපදවීම හා සම්බන්ධ එකක් විය.

# ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය

1. ජාතික ජල සම්පත් නියෝජිතායතනයේ (ජා.ජ.ස.නි.) ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය 1994 මාර්තු 13 දින ශ්‍රී ලංකා නාවික හමුදාව සහ මිනින්දෝරු දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගෙන පිහිටුවා ගන්නා ලදී. ජා.ජ.කා. පාලනය කරන අධ්‍යක්ෂක මඩුල්ල තුන්දෙනෙකුගෙන් සමන්විත වන අතර, සභාපති/ජා.ජ.ස.නි., නාවික හමුදා කොමදෝරු හෝ ඔහු විසින් නම් කරන්නකු සහ මිනින්දෝරු ජෙනරාල් හෝ ඔහු විසින් නම් කරන්නකු මෙම තිදෙනාට අයත් වේ.

ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ ප්‍රධාන අභිප්‍රායන් අතර, අභ්‍යන්තර ජලාශ සහ වෙරළබඩ, ලඟ වෙරළත, දුර වෙරළත ජාතික සාගර කලාපයේ ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය දක්වා වූ ජල ධරයන්ගේ සවිස්තරාත්මක ජල ශාස්ත්‍රීය මිනුම් කිරීම සහ නාවික සිතියම් නිෂ්පාදනය කිරීම ඇතුළුව, ප්‍රතිඵල ඇතුළත් අනෙකුත් ලියකියවිලි නිෂ්පාදනය කිරීම මූලික තැනක් ගනී.

ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලය විසින් පහත සඳහන් දෑ නිෂ්පාදනය කිරීමෙහිලා දැනට සිදුකෙරෙන ප්‍රධාන ක්‍රියාවලියන්

අ) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සීමාවේ සිට අනන්‍ය ආර්ථික කලාපයෙන් පිටත සීමාව දක්වාවූ නාවික සිතියම් නිෂ්පාදනය

ආ) ජාතික ජල සීමාවේ උදම් වගු

ඇ) ජාතික ජල සීමාවේ උදම් අනාවැකි වගු

ඈ) මුහුදු යන්නන් සඳහා දැන්වීම නිෂ්පාදනය කිරීම සහ නිකුත් කිරීම

ඉ) ඉහත ලිපි නොනවත්වා නවීකරණය කිරීම

2. නිලධාරී මණ්ඩලය

1994 වර්ෂයේ ජාතික ජල ශාස්ත්‍රීය කාර්යාලයේ නිලධාරී මණ්ඩලය පහත පරිදි වේ.

1) අධ්‍යක්ෂ/ජා.ජ.කා.
ආර්.ද. එස්.එස්. අමරසේකර, බී.එස්.සී. (ශ්‍රී ලංකා)
යාන්ත්‍රික ඉංජිනේරු (පෙරඩ්/කැනඩා)

2) ප්‍රධාන බිම් මිනින්දොරු
විමල් කුමාරසිංහ, උසස් මිනින්දෝරු වෘත්තිය විභාගය
(කේම්බ්‍රිජ්, එක්සත් රාජධානිය)

3) ජ්‍යෙෂ්ඨ ජල ශාස්ත්‍රීය මිනින්දෝරු
බී.එච්.බී. නිහාල් සිල්වා
මිනින්දෝරු මට්ටම සහ ඩිප්ලෝමා

4) ක්‍රියාකාරී ජ්‍යෙෂ්ඨ ජල ශාස්ත්‍රීය මිනින්දොරු
එම්.ජ්.ආරියවංශ, බී.එස්.සී.
සංඛ්‍යානය පිලිබඳ පසු උපාධි ඩිප්ලෝමා

5) බිම් මිනින්දොරු
ජ්. එන්. කොඩිකාර
මිනින්දෝරු සහ මට්ටම් (උ.පෙ.) ඩිප්ලෝමා, මිනින්දොරු දෙපාර්තමේන්තුවේ
කෙටිකාලීන මාරුවීමක් මත.

ජ්.ඩබ්. ගුණසේකර
මිනුම් හා මට්ටම් (උ.පෙ)
ඩිප්ලෝමා, මිනින්දොරු දෙපාර්තමේන්තුවේ කෙටිකාලීන මාරුවීමක් මත.

6) මිනුම් වාර්තාකරු
පි.ජ්.ඩී. සුනිල්
ශ්‍රී ලංකා නාවික හමුදාවේ කෙටිකාලීන මාරුවක් මත

7) සැලසුම් ශිල්පී
ඩබ්.ජ්. විල්ප්‍රඩ්
වරලත් සැලසුම් ශිල්පය සඳහා මිනින්දෝරු ජෙනරාල්ගේ සහතික ලත්

8) සිතියම් ශිල්පී
එස්.ආර්.ටී.පී. සිංහබාහු
ජාතික ආධුනිකත්ව සැලසුම් ශිල්පී සහ ජාතික තාක්ෂණික සහතිකය

ජී.ඩී.ටී.ඩී. නන්දදාස, සිතියම් ශිල්පී ඩිප්ලෝමා

9) ප්‍රධාන සිතියම් ශිල්පී
ජී.එන්.පෙරේරා, සිතියම් නිෂ්පාදනය පිලිබඳ ඩිප්ලෝමා
සිටි ඇන්ඩ් ගිල්ස් ලන්ඩන් ආයතනය

10) සිතියම් ශිල්පී උපදේශක
වෝල්ටර් ගුණරත්න, සිතියම් නිෂ්පාදනය පිලිබඳ ඩිප්ලෝමා
සිටි ඇන්ඩ් ගිල්ස් ලන්ඩන් ආයතනය

11) ව්‍යාපාති නිලධාරි
මයිකල් ග්‍රැබර්, එම්.එස්.ඩී.
ජල ශාස්ත්‍රීය උපදේශක සහ කණ්ඩායම් නායක

හර්මන් තුපුර්, නාවික ඉංජිනේරු ඩිප්ලෝමා
කෙටි කාලීන් විශේෂඥ 03.01.93 - 18.07.93

12) යාන්ත්‍රික ඉංජිනේරු
ඩී.ජී. කරුණාසේන, සී.ජී.අයි II කොටස
අයි.ජී.එස්.එල්. II කොටස

13) යාන්ත්‍රික වැඩකරු
ආර්.එම්.එන්.ගාමිණී

14) ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු
ජී.ඩී. නානායක්කාර
සිටි ඇන්ඩ් ගිල්ස් සම්පූර්ණ තාක්ෂන සහතිකය, ලන්ඩන් ආයතනය

15) ඉලෙක්ට්‍රොනික සහකරු
ඩබ්. කේ. සෙනවිරත්න
ජාතික ආධුනිකත්ව මණ්ඩලයේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු සහතිකය

16) ඉලෙක්ට්‍රොනික පුහුණුකරු
එම්.ජී.එස් ප්‍රසාද්
ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ඩිප්ලෝමා, ආධුනික පුහුණු ආයතනය

17) ජල ශාස්ත්‍රීය මුනුම් පුහුණුකරුවන්
ජී.එන්.ඩී. පෙරේරා, බී.එස්.සී. (සාමාන්‍ය)

18) ප්‍රධාන පද්ධති විශ්ලේෂක
ජී.එල්. ලොකුගේ, බී.එස්.සී. (සාමාන්‍ය)
පද්ධති සැලසුම් ඩිප්ලෝමා

19) පද්ධති විශ්ලේෂක
එච්. ජී.බී. විද්‍යාසිරි
පරිගණක තාක්ෂණ පසු උපාධි ඩිප්ලෝමා

20) විශ්ලේෂක
එස්.ඩබ්.එස්. වීරරත්න, බී.එස්.සී.
වැඩ සටහන් සම්පාදක ඩිප්ලෝමා, ජී.සී.එස්. I, II, III

21) දත්ත සැපයුම් ක්‍රියාකරු
ඩබ්.කේ.එම්. මහින්දපාල

22) ජල ශාස්ත්‍රීය නිලධාරී
ඩී.එල්.ජී. ගේවගේ

23) ජල ශාස්ත්‍රීය සහකරු
එල්.එස්.සී. සිරිවර්ධන

24) ගණකාධිකාරී
වී.ඩී.එල්.ආර්. පෙරේරා මෙනවිය
ගණකාධිකාරී ඩිප්ලෝමා බී. කොම් (වාණිජවේදී)

25) ගබඩා පාලක
ඩබ්.එම්.ජී. දයාසේන

26) ලිපිකරු
කේ. ප්‍රේමී

27) යතුරු ලේඛිකා
එම්.ඩී.සී. ජයන්ති
ජී.ජී.චන්ද්‍ර අල්විස්

**පැවැත්වූ පුහුණු කිරීමේ පංති**

ශ්‍රී ලංකා ජර්මන් ආධාර ව්‍යාපෘතිය යටතේ WP පරිගණක යතුරු ලේඛණය, ජා.ජ.කා. සේවක මණ්ඩලයට පුහුණු කිරීම මහ පරිසණක කලමණාකාර පංති පැවැත්වීම

**සහභාගීවූ වැඩමුළු, සම්මන්ත්‍රන දේශණ**

a) "ක්‍රියා කිරීමේ සැලසුම් නැවත සලකා බැලීම" තුන්වන අදියර සහ ජා.ජ.කා ශක්තිමත් කිරීමේ සම්මන්ත්‍රණය 94 ජනි 10-12 දක්වා වත්තල පෙගාසස් රීප් හෝටලයේ පැවැත්විය.

b) ජා.ජ.කා අධ්‍යක්ෂක ආර්. ද එස්.එස්. අමරසේකර මහතා අයොමැක් (IOMAC) නැව් සහ වරාය අධිකාරී සංගමයේ, තාක්ෂණික සහයෝගීතා කණ්ඩායම් උපදේශක සභා රැස්වීමට සහභාගීවිය.

5.0 ජා.ජ.ක අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම්

ජා.ජ.කා. අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම 12ක් පසුගිය කාලය තුල පවත්වා ඇත.
සහභාගීවූවන් පහත දැක්වේ.
එම්.ආර්.පී. මොල්ලිගොඩ, සභාපති ජා.ජ.ස.නි. සහ සභාපති ජා.ජ.කා. අධ්‍යක්ෂක මණ්ඩලය (1994.08.25 දක්වා)
එච්.එම්. ගුණවර්ධන, සභාපති/ජා.ජ.ස.නි සභාපති. ජා.ජ.කා. (94.11.03සිට)
එන්.සී. සෙනවිරත්න, මිනින්දෝරු ජෙනරාල්, සාමාජික
කොමඩෝරු එච්.ආර්. අමරවීර, සාමාජික (94.08.25 දක්වා)
කොමඩෝරු ඩී.ඩබ්. සඳගිරි, සාමාජික (94.11.03 සිට)

එම්.පී. ස්ලගාදු, අතිරේක මිනින්දොරු ජෙනරාල්, රුස්වීම් තුනකට මිනින්දෝරු ජෙනරාල් වරයාගේ අනුමැතිය මත සහභාගි වී ඇත.

6.0 ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය/ජී.ටී.ඉෂෙඩ් ව්‍යාපෘතිය යටතේ ජාතික මුහුදු සිතියම් වැඩසටහන

9101 සහ 9105 අංක දරණ, පරිමාණ 1,25,000 වන සිතියම් දෙක 1994 වර්ෂයේ ලබාගත් දත්ත අනුව තරමක් දුරට සම්පූර්ණ කිරීමට හැකිවිය. මෙම සිතියම් දෙක 1995 වර්ෂයේදී සම්පූර්ණ කිරීමට නියමිතය.

අංක 9013, 9109, 9110, 9202, 9114 දරණ සිතියම් වල ජල ශාස්ත්‍රීය මිනුම් මෙම වර්ෂයේ ආරම්භ කලහ. මෙම වැඩකටයුතු උපකරණවල අළුත්වැඩියාව සහ අයහපත් කාලගුණය බලපෑහ.

7.0 භාරගත් ජල ශාස්ත්‍රීය බිම් මැනීම

අ) කන්කසන්තුරේ වරාය මැනීම
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ඉල්ලීමක් මත කන්කසන්තුරේ ඇතුල් වරායේ ජල ශාස්ත්‍රීය මිනුම් 94 ජනවාරි 6-11 දක්වා කාලය තුල සිදුකරන ලදී. සිතියම 1:2500 පරිමාණයට වන අතර ජැටියේ සහ ප්‍රධාන ජල බාධකයේ හරස් කඩවල් 8ක් ඇඳ සම්පූර්ණ කරන ලද්දේ 94 ජනවාරි 7 දාය. මෙහි පිටපතක් ලංකා වරාය අධිකාරියට භාරදුන්හ.

ආ) වෙරළබඩ සොයාබැලීම් (කොළඹ උතුර CCDඩිGTZ ව්‍යාපෘතිය)
ග්‍රොයින් (මෝදර කෝවිල අසල) සහ කැලණි ගඟ මෝය අතර වෙරළ තීරය වෙනස්වීම සොයාබැලීම සඳහා මිනුම් 93 දෙසැම්බර් 29 දින සිට 94 ජනවාරි 17 දක්වා සිදුකල අතර සිතියම් ව්‍යාපෘති නිලධාරී හට භාරදෙන ලදී.

ඇ.) වෙරළ ඉංජිනේරු සොයාබැලීම - පයාගල (වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා)
මග්ගොන සිට කළු ගඟ මෝය දක්වා කි.මී. 7.5ක් දුර වෙරළ තීරයේ වෙරළ ඉංජිනේරු සොයාබැලීම් සිදු කිරීම සඳහා ජාතිකලජල ශාස්ත්‍රීය කාර්යාලයට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කොන්ත්‍රාත් පදනමක් මත භාරදුනි.

1994 මාර්තු 3 සිට අප්‍රේල් දක්වා කාලය තුල පහත සඳහන් වැඩ සිදුකරන ලදී.

i වෙරළ පාලක ස්ථාන පිහිටුවා ඉදිරි වෙරළත තොරතුරු ලබාගැනීම
ii මීටර් 250 පරතරයන්ගෙන් වෙරළ හරස්කඩ ලබාගැනීම (සෑම මිනුම් රේඛාවක්ම දිර්ග කිරීමක් ලෙස)
iii ගැඹුරු මීටර් 7ක් දක්වා ප්‍රදේශය මීටර් 250 පරතරයක් ඇතිව මුහුදු පතුල සිතියම්ගත කිරීම සඳහා මිනුම් ලබාගැනීම
iv සිතියම් ඇඳ ඇත.

ඈ) උඩවලවේ බිම් මිනුම්
1993 දෙසැම්බර් මාසයේදී මිනුම් කරනු ලැබූ උඩවලවේ මිරිදිය ධීවර මධ්‍යස්ථානයේ ආසන්න වශයෙන් අක්කර 18ක භූමි ප්‍රමාණයේ සිතියම් වැඩ 93 දෙසැම්බර් 14 සිට 94 ජනවාරි 17 දක්වා කාලය තුල සම්පූර්න කරන ලදී.

ඉ) ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය සඳහා මිරිස්ස ධීවර වරාය මැනීම (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය)
වරාය හැරීම සම්බන්ධයෙන් පහත සඳහන් වැඩ සිදුකල අතර සිතියම් භාරදෙන ලදී.

i ශ්‍රී ලංකාව ධීවර වරාය සංස්ථාව සහ කොන්ත්‍රාත්කරු සමඟ ස්වාධීනව 94 ජනවාරි සිදුකල මිනුම් පරීක්ෂා කිරීම.
ii සිතියම්වල පෙන්වා ඇති නිශ්චිත ස්ථාන පරීක්ෂාව
iii කොන්ත්‍රාත්කරුගේ මාසික ප්‍රගති වාර්තා පරීක්ෂාව

ඊ) වෙරළ ඉංජිනේරු සොයාබැලීම - වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා
මුහුදු පතුල මිනුම් - දත්ත මෙහෙයවීමෙන් සිතියම් සම්පූර්න කරන ලදී.

එ) හික්කඩුව සමුද්‍ර උද්‍යානය මිනුම්
වෙරළ පාලක මිනුම්, පතුල සියුම්ගත මිනුම්, පසුව දත්ත යොදා සිතියම් වැඩ සම්පූර්න කරන ලදී.

ඒ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සඳහා බේරුවල ධීවර වරාය
ජල ශාස්ත්‍රීය මිනුම්, බිම් මිනුම් සහ සිතියම් සම්පූර්ණ කරන ලදී.

ඔ) ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය සඳහා පුරාණවැල්ල ධීවර වරාය මැනීම 1994
ක්ෂේත්‍ර වැඩ සහ සිතියම්වැඩ සම්පූර්ණ කරන ලදී.

ඕ) ධීවර හා ජලජ සම්පත් නියෝජිතායතනයේ සාගර විද්‍යා අංශය සඳහා වැලිගම බොක්ක මැනීම
ක්ෂේත්‍ර වැඩ සහ සිතියම් වැඩ සම්පූර්ණ කරන ලදී.

8. අතිකුත් වැඩ

අ) උදම්මානය - ත්‍රිකුණාමලය
ත්‍රිකුණාමලයේ උදම්මානයක් සවිකරන ලදී.

ආ) සැලසුම් ශිල්පී පුහුණුව
කාර්මික විද්‍යාල දෙකක ඉල්ලීමක් මත ආධුනික සැලසුම් ශිල්පීන් දෙදෙනෙකු ඔවුන්ගේ ප්‍රායෝගික පුහුණු පාඨමාලාවේ කොටසක් ලෙස පුහුණු කිරීම සඳහා ජා.ජ.කා. ඇතුලත් කරගන්නා ලදී. මෙම පුහුණුව 1993 දෙසැම්බර් 1 සිට මාස 6ක් දක්වා පවත්වා ගෙන යාමට නියමිතව තිබුණි. කෙසේ වෙතත් ඔවුන් දෙදෙනාම වෙනත් ස්ථානයන්හි ආරක්ෂිතව රැකියාවේ යෙදී සිටින නිසා මෙම පුහුණු වැඩ සටහන් 94 ජනවාරි 13දා අවසන් කිරීමට සිදුවිය.

9.0 වෙනත් පිටපත් කිරීමේ වැඩ

අ) ශ්‍රී ලංකා සහ ඉන්දියන් සාගර ප්‍රදේශයේ ධීවර සිතියම
මෙම සිතියම පිටපත් කිරීම සම්පූර්ණ කර ඇති අතර එය මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් ලැබෙන තුරු ප්‍රමාද වෙමින් පවතී.

ආ) සාගර විද්‍යා අංශය/ජා.ජ.ස.නි. සඳහා මුහුදු පතුල සිතියම් සම්පාදනය කිරීම
මෙම වර්ෂය තුල ඉහත ව්‍යාපෘතියෙහි 70% පමණ සම්පූර්ණ කරන ලදී.

ඇ) පහත සඳහන් සිතියම්. සැලසුම් සහ රූප සම්පාදනය කර ඇත.

i කොරල් ඒකකය/ජා.ජ.ස.නි. සඳහා කල්පිටිය සමුද්‍ර උද්‍යානයේ සිතියම
ii සමුද්‍රජීව විද්‍යා අංශය/ජා.ජ.ස.නි. සඳහා පානදුර සිට හලාවත දක්වා ධීවර ප්‍රදේශ සිතියම්ගත කිරීම
iii පාරිසරික ගවේෂණ ඒකකය/ජා.ජ.ස.නි. සඳහා කලමැටිය කලපුව සිතියම්ගත කිරීම
iv ජා.ජකා. අයත් ප්‍රදේශය සහ වතුර ටැංකිය තිබෙන ස්ථාන දැක්වෙන රූපය
v පාරිසරික ගවේෂණ ඒකකය/ජා.ජ.ස.නි. සඳහා ලුනාව කලපුවේ පාරිසරික සැලසුම්
vi සිතියම් ශිල්පී අංශය සඳහා කාමර නැවත සකස්කිරීමේ සැලසුම්
vii ජා.ජක. ගබඩා අංශය, නඩත්තුව කරන ඉලෙක්ට්‍රොනික උපකරණ, සිතියම් උපකරණ, බෝට්ටු සහ අනිකුත් බිම් උපකරණ සමඟ ඉලෙක්ට්‍රොනික සහ යාන්ත්‍රික ඉංජිනේරු අංශය

10.0 සේවකයන් බඳවා ගැනීම

පසුගිය කාලය තුල පහත සඳහන් සේවකයන් බඳවාගෙන ඇත.

1. ප්‍රධාන පද්ධති විශ්ලේෂක
2. විශ්ලේෂක )පරිගණක වැඩ සටහන් සම්පාදක)
3. දත්ත සැපයුම් ක්‍රියාකරු
4. පුහුණු ජල ශාස්ත්‍රීය මිනින්දොරු
5. ගණකාධිකාරී
6. යාන්ත්‍රික ඉංජිනේරු
7. යාන්ත්‍රික වැඩකරු

# සමුද්‍ර විද්‍යා අංශය

1.0 කාර්ය මණ්ඩලය

1.1 සමුද්‍ර විද්‍යා අංශය (නාරා)

| | |
|---|---|
| පර්යේෂන නිලධාරීන් | - 07 (එක් අයකු අධ්‍යයන නිවාඩු) |
| පර්යේෂණ සහකාර | - 04 |
| සාම්පල්කරු | - 01 |
| ලඝු ලේඛිකා | - 01 |
| කාර්යාල සහායක | - 01 |
| සිතියම්කරු | - 01 (කොන්ත්‍රාත් පදනම යටතේ) |

1.2 සරෙක් ව්‍යාපෘති කාර්ය මණ්ඩලය

| | |
|---|---|
| පර්යේෂණ සහකාර | - 02 (කොන්ත්‍රාත් පදනම යටතේ) |
| කාර්මික සහකාර | - 02 (කොන්ත්‍රාත් පදනම මත) |

මෙම අංශයේ රසායනාගාර සහායකවරයෙකු ඉංජිනේරු තාක්ෂණ අංශයට මාරුකරන ලදී.

2.0 පර්යේෂණ කටයුතු

2.1 UNDP ව්‍යාපෘතිය යටතේ පොතුවිල් ප්‍රදේශයේ ක්‍රමානුකුල භුගර්භ විද්‍යාව/භෞතික භුගර්භ විද්‍යාව සිතියම්ගත කිරීමක් පොතුවිල් ප්‍රදේශයේදී සිදුකරන ලදී.

2.2 ශ්‍රී ලංකාවේ මහද්වීපික තටාකයන්ගේ භෞතික සාගර විද්‍යා අධ්‍යයනය UNDP/FRG ව්‍යාපෘතිය) UNDP/FRG වල ප්‍රතිපාදන නොමැතිකම නිසා ව්‍යාපෘති දෙකම ආරම්භ කිරීමට නොහැකි විය.
සුළි සුළං නිසා හානිවූ සමුද්‍ර මාරු නෞකාවේ අළුත්වැඩියා කටයුතු නිසාත්, මෙම නෞකාව වරායේ රුඳවීමට ඉඩ පහසුකම් නොමැති වූ නිසාත් UNDP මගින් ලබා දෙනු ලැබූ උපකරණ පරීක්ෂා කිරීමට නොහැකි විය.

සුළි සුළං නිසා හානිවූ සමුද්‍ර මාරු නෞකාවේ අළුත්වැඩියා කිරීමෙන් පසු ජූනි මස 7 දින එය ත්‍රිකුණාමලයට රුගෙන යන ලදී. මෙහිදී උපකර්නවල ක්‍රියාකාරිත්ව පරීක්ෂා කරන ලදී. ත්‍රිකුණාමල වරායේ පිටත ජූලි මාසයේදී එක් දින ගමන් 3ක් යාත්‍රාවෙන් යන ලදී.

"ඕෂියානික්ස්" ආයතනයෙන් පැමිණි විශේෂඥ ඉංජිනේරුවරයකු හා නාරා ආයතනයේ විද්‍යාඥයකු සම්බන්ධ වී දින 5කදී මෙම නැවේ තට්ටුව අළුත්වැඩියා කෙරුණි. මෙහිදී උපකරණ 10ක ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරන ලද අතර "ඕසියැනික්ස්" වැඩපළෙහි වූ "වන් ටෙට්‍රන්-6" ගැඹුරු ජලයේ ශබ්ද තරංග භාවිතාකර සංඥා හඳුනාගන්නා උපකරණයෙන් (එකෝ සවුන්ඩර්) කොටස් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සිංගප්පූරුවට යැවීම සිදු කරන ලදී. සාගර විද්‍යා අංශයත්, සේවා හා මෙහෙයුම් අංශයත් ඉංජිනේරු විශේෂඥයකුත් එක්ව "Transduler" හා "Capasilur" සවිකිරීම සිදු කරනලදී.

අවසාන දිනයේදී සිදු කරන ලද පරීක්ෂණ කටයුතු අතරතුරේදී විදුලි උත්පාදක යන්ත්‍රය (40 කි.වො.) ක්‍රියා විරහිත විය. මෙම අළුත්වැඩියා කටයුතු සඳහා මිල ගණන් කැඳවන ලද අතර, 1994 සැප්තැම්බර් වලදී එම උත්පාදක යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සඳහා මිල ගණන් කැඳවන ලද අතර, 1994 සැප්තැම්බර් වලදී එම උත්පාදක යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සඳහා මීගමුවේ සාන්ත ජෝෂප් ඉංජිනේරු ආයතනයට භාරදෙන ලදී.

රසායනාගාරයේ වායු සමීකරණ යන්ත්‍රයේ ක්‍රියාකාරිත්වය අඩු මට්ටමකින් සිදුවන නිසා බොහෝ උපකරණ ප්‍රධාන කාර්යාලයේ රසායනිගාරයට ක්‍රියාකරවීම සඳහා යවන ලදී. උපකරණ ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය අත්‍යාවශ්‍ය කොටස මිලදීගන්නා ලදී. මාර්ග 6කින් යුත් පනිවුඩ හුවමාරු යන්ත්‍රයක් හා AC/DC ට්‍රාන්ස්පෝමර එකක් මිලටගැනීම සඳහා කටයුතු පිළියෙල කරගෙන යනු ලැබේ.

සිංගප්පූරුව "ඕසියැනික්" රසායනාගාරයේදී ටෙට්‍රන්-6 එකෝ සවුන්ඩර් අළුත්වැඩියා කරන ලද අතර එය ආපසු ලබාදෙන ලදී. එය ගැඹුරු මුහුදේ පරීක්ෂා කිරීම අවශ්‍යය. රසායනාගාරය සඳහා මාර්ග 6 සංඥා උපකරණයක් හා ට්‍රාන්ස්පෝමරයක් මිලදීගැනීම සඳහා කටයුතු සිදුකරගෙන යනු ලැබේ. 1994 දෙසැම්බර්වලදී මෙම නෞකාව පවත්වාගෙන යාම හා යාත්‍රා කිරීමේ කටයුතු සේවා හා මෙහෙයුම් අංශයේ සිට සමුද්‍ර විද්‍යා අංශයට භාරදෙන ලදී. විදුලි උත්පාදක යන්ත්‍රය අක්‍රියවීම නිසා යාත්‍රාවේ සවිකරන ලද උපකරණ ක්‍රියාකරවීම පුහුණු කරවීම සඳහා මෙම

අංශයේ කාර්ය මණ්ඩලය යෙදවීමට නොහැකි විය. සමුද්‍ර විද්‍යා පරීක්ෂණ කටයුතු සිදුකිරීම සඳහා සුදුසුකම් ලත් විද්‍යාඥයන්, කාර්මිකයන් හා යාත්‍රා කරන කාර්ය මණ්ඩල අළුතින් බඳවා ගැනීමට අවශ්‍ය වේ.

2.3 නාරා/නරේසා/සරෙක් ව්‍යාපෘති
භෞතික සමුද්‍ර විද්‍යාත්මක ගවේෂණ පුත්තලම/මුන්දලම
රාජපක්ෂ මහතා, ජයසිරි මහතා, ඊ.එම්.එස්. විජේරත්න හා කේ. අරුලානන්දන්
අනෙකුත් ජලාශ හා සම්බන්ධිතව ජලය හුවමාරුව ඇතුළුව මුළු පරිසරය පිළිබඳ අධ්‍යයනය සඳහා මෙම කාලය තුලදී මුහුදු මට්ටම, උෂ්ණත්වය ලවණතාව හා දත්ත ලබාගෙන ඒවා විශ්ලේෂණ සිදු කරන ලදී. සාමාන්‍ය ලවණතා අගයයන් පුත්තලම කලපුව 38ppt මුන්දලම 24pptද ඕලන්ද ඇලෙහි (උතුරු) 2pptද ඕලන්ද ඇල දකුණ 18pptදව විය. වියලි කාලයේ මුන්දලම කලපුවේ ලවණතා අගයන් මුහුදේ එම අගයයන් ඉක්මවා යයි. වර්ෂා කාලයේදී මුන්දලම කලපුවේ ලවණතාව 2ppt දක්වා පහත වැටේ. ජල මට්ටම 35pp දක්වාද, මුන්දලම කලපුවේ එය 5cm දක්වාද විය. මුන්දලම කලපුව හා පුත්තලම කලපුව අතර වඩදිය, බාදිය පරතරය අතර සම්බන්ධතාවයක් නොමැත. මුන්දලම හා පුත්තලම කලපුව අතර ඕලන්ද ඇල හරහා ජලය හුවමාරුවීම අවක්ෂේපණය හා වාෂ්පවීම මත රඳා පවතී.

වර්ෂා කාලයේදී බැහැරව යාමේ ජල පරිමාව 10-28 ඝන මීටර/තත්පරයකට වූ අතර, වියලි කාලයේදී ජලය ගලා ඒමේ පරිමාව 4 ඝන මීටර/තත්පරයකට විය. මුන්දලම කලපුවේ සාමාන්‍ය නැවතීමේ කාලය දින 14-50 වන අතර එය වර්ෂාපතනය සමඟ සමීප සම්බන්ධතාවයක් පෙන්වයි. ඉහලම ධාරණය කිරීමේ කාලය අඩු අවක්ශේපණය වීම සමඟ සම්බන්ධතාවයක් දක්වයි. පුත්තලම කලපුව ජලය හුවමාරුවීම කෙරෙහි මුන්දලම කලපුව/ඩච් ඇලෙහි බලපෑම පිළිබඳ අවසාන වාර්තාව පිළියෙල වෙමින් පවතී.

2.4 මීගමු කලපුවේ භෞතික සමුද්‍ර විද්‍යාත්මක අධ්‍යයනය
රාජපක්ෂ මහතා, ජයසිරි මහතා, ඊ.එම්.එස්. විජේරත්න මහතා හා කේ. අරුලානන්දන් මහතා
ආචාර්ය ලාස් රෙඩ්බර්ග් මහතා වෙත නිවැරදි කිරීමේ කටයුතු සඳහා විශ්ලේෂණය කරන ලද මුහුදු මට්ටම්, උෂ්ණත්ව, ලවණතාවය හා දියවැල් මැනීම දත්ත අඩංගු මූලික වාර්තාව බාරදෙන ලදී. ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමේදී දක්නට ලැබුණේ කලපුවේ ලවණතාව හා ජලය හුවමාරුවීම කෙරෙහි මෝසම් තත්වය තදින් බලපාන බවයි. වියලි කාලයේදී එනම් ජනවාරි සිට මාර්තු හා අගෝස්තු වලදී ලවණතාව 30ppt දක්වා ඉහල අගයක්ද, ජලය රඳා තිබීමේ කාලය සති 2 දක්වාද දක්වා බවයි. වර්ෂා කාලයේදී එනම් මැයි, ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා මිරිදිය කලපුවට ලැබීම 100 ඝන මීටර්/තත්පරයකට ඉක්මවා යනවිට ජලය රඳා ගැනීමේ කාලය දවස් 2 සිට 5 දක්වා අඩු වේ. තවද ලවණතාව 5ppt දක්වාද අඩුවේ. කලපුවේ ලවණතාව කිසි විටෙක මුහුදු ජලයේ මුහුදු ජලයේ ලවණතාව ඉක්මවා ගියේ නැත. නමුත් මිරිදිය ලැබීමට වඩා වාෂ්පීකරණ සීඝ්‍රතාව වැඩි වූ විට මෙය සිදුවේ. මෙහිදී නිගමන වූයේ ගඟෙහි පිටතට ගැලීම හැමවිටම 1.5 ඝන මීටර/තත්පරයකට වඩා ඉහල බවයි. මෙහිදී ඉහල මිරිදිය ප්‍රමාණයක් ලැබෙන විට ඉතා ඉහල සිරස් ලෙසට ස්ථරවලට වෙන්වීමක් දක්නට ලැබේ. මෙම අධ්‍යයන වලින් හෙළිවූ තවත් කරුණක් නම් කලපුවෙන් දඩුගම් ඔය හා ජාඇලට ලුණු වතුර ගලායාම කලපුව කටේ සිට 15 කි.මී. සිට 18 කි.මී. දක්වා දුරක ඔය දිගේ ඇති බවයි. නෙත් කාලයේදී මෙම කරදිය ගලායාම අවම වේ.

2.5 වැලිගම බොක්කේ ජල විද්‍යාත්මක තතත්වය පරීක්ෂා කිරීම - නරේසා ව්‍යාපෘතිය
- කේ. අරුලානන්දන් මහතා
1993 වර්ෂයේදී එකතු කරන ලද දත්ත විශ්ලේෂණය කරන ලද අතර වාර්ෂික වාර්තාව නරේසා ආයතනයට 1994 වර්ෂයේ මුල් භාගයේදී භාරදෙන ලදී. අධ්‍යයන කාලය තුළදී සමුද්‍ර විද්‍යාත්මක සාදක අධ්‍යයනය කරන ලදී.

1. වැලිගම් බොක්ක හා පොල්වත්ත ගඟ අතර ජලය හුවමාරුව
2. පොල්වත්ත ගඟ තුලට කරදිය ගලායාම
3. වැලිගම බොක්කේ ජලය සංසරණය වීම

හඩ්සන් සමීකරණය භාවිතයෙන් වැලිගම් බොක්කේ ජල හුවමාරුව ගණනය කරන ලදී. වර්ෂා හා වියලි කාලයේදී ජලය හුවමාරුවීම පිළිබඳවත් දවස් 45 හා 14 විය. ලවණතාවය මනින උපකරණයක් මගින් දත්ත ලබාගන්තා ලදී. පොල්වත්ත ගඟේ ඉහල ප්‍රදේශයට ලුණු වතුර ගලායාම කි.මී. 8 දක්වා වේ. අනාගතයේදී පොල්වත්ත ගඟේ වෙනස්වීම පරීක්ෂා කරබැලීම සඳහා කරදිය/මිරිදිය මායිමේ වෙනස්වීම පිළිබඳව ගණිතමය ක්‍රම භාවිතා කරමින් ක්‍රමානුකූල පරීක්ෂණයක් කර ඇත.

මෙහිදී අවට අවසාදිත ජලය ගලායාම 4 ඝන අඩි/තත්පරයට විය. දිය පහරෙහි අවසාදිත ජලය ගලායාම් ඌණතාවක් නිසා පොල්වත්ත ගඟේ ඉහල මායිම් වලට කරදිය ගලායාමක් සිදුවිය හැක. පොල්වත්ත ගඟෙහි දියකඩෙහි වේගය පිළිබඳව නිරීක්ෂණ කිරීම් කොට නොමැත. මතුපිට දියකඩ තත්පරයට ඝන මීටර් 10 සිට තත්පරයට මීටර් 110 වශයෙන් පුළුල්ව වෙනස් වේ. වැලිගම බොක්කේ වාර්ෂික දියකඩෙහි වේගය තත්පරයට ඝන මීටර් 22ක් බව නිරීක්ෂණය කරන ලදී.

1994 පළමු භාගයේදී පතුලේ බොර පිළිබඳ අධ්‍යයනය ආරම්භ කරන ලද අතර අර්ධවාර්ෂික ප්‍රගති වාර්තාවක් නරේසා ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී බොර සාම්පල එකතු කරන ලද අතර, ඒවා පෙරා විවිධ සංඛ්‍යාත්මක ලෙස විශ්ලේෂනය කරන ලදී. සියළුම අදාල වෙරළාසන්න පැතිකඩ හා සාම්පල එකතු කල ස්ථාන සිතියමක ලකුණු කරන ලදී. මෙහිදී පාංශු ඛාදනය හා වෙරළේ වැලි එකතුවීම ගණනය කරන ලද අතර පාංශු ඛාදනය සිදුවන ප්‍රදේශ හා වැලි එකතුවීම් ප්‍රදේශ සිතියමේ ලකුණුකරන ලදී.

6. නිරිතදිග වෙරලේ සහ දකුණු වෙරලේ රළ බලශක්ති ජනකයන් පිහිටුවීම සඳහා යෝග්‍ය ප්‍රදේශ තෝරාගැනීම (නරේසා ව්‍යාපෘතියකි.)

මෙම ව්‍යාපෘතිය 01.01.1994 දින ආරම්භ කරන ලද අතර 31.05.95 තෙක් ක්‍රියාත්මක කරන ලදී. නරේසා මගින් මේ සඳහා රුපියල් 102,000.00 මුදලක් ලැබුණි. ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරලේ රළ බලශක්ති ජනකය කරවීම සඳහා සුදුසු ස්ථාන තේරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ විය. එමෙන්ම ඒ ආකාරයේ ආදර්ශයක් මගින් පර්යේෂණ පැවැත්වීම මෙහි අරමුණ විය.

මෙම තොරාගත් ප්‍රදේශවලින් අදාල දත්ත එක්රැස් කර ශක්තිමත් දත්ත සැකසුමක් පිළියෙල කිරීම මෙහි අරමුණ විය. මෙම දත්ත අවසාන අවස්ථාවේදී කුමන ආකාරයේ කර්මාන්තයක්ද හා එය පිහිටුවිය යුතු ස්ථානය සොයාගැනීමටද උපකාරී වේ. දකුණු දිග වෙරලේ පලටුපාන, බුන්දල හා උණවටුන ප්‍රදේශ වඩාත් සුදුසු ස්ථාන බව මෙම ප්‍රතිඵල වලින් හෙලිවිනි. උණවටුන ප්‍රදේශයේ රුමස්සල කන්ද අසබඩ පිහිටි පන්සල අභියස වූ ස්ථානය මේ සඳහා සුදුසුම ස්ථානය බව තෝරාගන්නා ලදී. මෙම කුඩා මුහුදු බොක්කේ දිග මීටර් 7ක්ද පළල මීටර් 4ක්ද විය. මේ සඳහා රළ පහරේ දත්ත මෙම ස්ථාන 3න් අවුරුද්ද පුරා එකතු කරන ලදී.

(1) පලටුපාන හා බුන්දල ප්‍රදේශවල රළ බලශක්ති පිළිබඳ ප්‍රකට ප්‍රසිද්ධිය වූයේ අවුරුද්ද පුරා මෝසම් දෙකෙහි බලපෑමක් ඒ කෙරෙහි ඇතිබවයි.

(2) භෞතික ආදර්ශකයක් පිළිබඳ අධ්‍යයනය සඳහා උණවටුන ප්‍රදේශයේ ලබාගත් දත්ත පාවිච්චි කලහැක.

භෞතික ආදර්ශකයක් පිළියෙල කිරීම යටතේ පවතින අතර සාධක මෙම ආදර්ශකයක මගින් පරීක්ෂා කරයි. උණවටුන හා අනෙක් ප්‍රදේශවල උපරිම රළ පහරේ ලක්ෂණ ලබාගැනීමට බලාපොරොත්තු වේ. ප්‍රතිඵල මගින් හෙලිවූයේ 1994 ඔක්තෝම්බර් හා නොවැම්බර් මාසවල පලටුපාන හා බුන්දල ප්‍රදේශවල රළ පහරේ උස මීටර 1.12 සිට 3.0 දක්වා වෙනස්වන බවයි. එමෙන්ම රළ පහරේ කාලය තත්පර 5.9-12.4 දක්වා විය. උණවටුන ප්‍රදේශයේ රළ පහරේ උස 1.13 - 2.8 මීටර් අගයක් ගන්නා බවත් කාලය 6.45-11.92 තත්පර අගයක් බවත් සොයාගන්නා ලදී.

2.7 ශ්‍රී ලංකාවේ අවට මුහුදේ මුහුදු මට්ටම් විශ්ලේෂණය හා අදම් නිශ්චය කිරීම - නාරා ව්‍යාපාතිය
ජ.එම්.එස්. විජේරත්න මයා

ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමලය, ගාල්ල හා බුන්දල ප්‍රදේශවල ජල ශාස්ත්‍රිය කාර්යාලය මගින් උදම් (වඩදිය බාදිය) මැනීම සඳහා උදම් මාපකයක 3ක් සවිකරන ලදී. ව්‍යාපෘතිය ආරම්භයේදී (1994 මුල) සියළුම උදම් මාපකවල ක්‍රියාකාරීත්වය පරීක්ෂාකරන ලද අතර ඒවා ක්‍රියාත්මක තත්වයේ විය. එක් උදම් මාපකයක් ත්‍රිකුණාමලය නාවික හමුදා ජැටියේ 1994 ජුලිවලදී සවිකරණ ලදී. 1994 ඔක්තෝබර් වල ගාල්ලේ උදම් මාපකය සම්පූර්ණ කරන ලදී. එහෙත් අවාසනාවකට මෙන් අවුරුද්ද අවසානයේ එම මාපක තුල වූ බැටරි ක්‍රියාකාරී නොවීම නිසා මාපක හරියාකාරව ක්‍රියානොකර තිබූ බව බව සොයාගත්තා ලදී. මෙහිදී අළුත්වැඩියා කටයුතු සඳහා ජල ශාස්ත්‍රිය කාර්යාලයට රු. 45,000ක මුදලක් ලබාදෙන ලද අතර මෙම උපකරණ සම්පූර්ණයෙන් අළුත්වැඩියා නොකරන ලදී.

2.8 මීගමු කලපුවේ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය පිළිබඳ ජෛව විද්‍යාත්මක අධ්‍යයනය
මීගමු කලපුවේ අංශු මාත්‍ර මූලද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනය සාර්ථකව නිමකරන ලදී. මෙහිදී විවිධ ආකාරයේ මසුන් තුල අංශුමාත්‍ර මූලද්‍රව්‍ය තැන්පත්වීම විවිධ වූ අතර එය 40-83.4 මි.ග්‍රෑ/ග්‍රෑ. වියළි බර විය. ඒ හා සමගම කලපුවේ මඩවල යකඩ ඉහල මට්ටමකින්ද (14-36 මි.ග්‍රෑ/ග්‍රෑ.) අවට ජලයේද (0.0015-0.0035) දශ ලක්ෂයකට කොටස්) විය. මෙහිදී යකඩ ඉහලම සාන්ද්‍රණ සාධකය ජලය/මඩ හා ජලය/මසුන් පිළිවෙලින් 10 හා 10 විය. මෙහිදී සොයාගනු ලැබූ ලෝහ වර්ග 5 පවතින ප්‍රමාණය හානිකර නොවේ.

මෙම අධ්‍යයනයෙන් හෙලිවූයේ විවිධ මසුන් තුලවූ ලෝහ සාන්ද්‍රණ සැලකිය යුතු වෙනසක් නොගන්නා බවයි. මෙහිදී එකිනෙක මසුන් අතර අංශු මාත්‍ර මූලද්‍රව්‍ය සම්බන්ධයෙන් හුවමාරු සංගුණකයක් ඇත්දැයි සංඛ්‍යාත්මකව විශ්ලේෂණය කල අතර හෙලිවූයේ එය තදින් මත්ස්‍ය විශේෂයේ පරිසරය, ජීවන විලාශ හා භූ විද්‍යාත්මක සම්භවයක් මත රඳා පවතින බවයි.

යකඩ සඳහා ඉහල සාන්ද්‍රණ සාධකය සොයා බලන ලද අතර එයින් හෙලිවූයේ එය මත්ස්‍ය විශේෂ අතර සම්බන්ධතාවයක් ඇති බවයි. කෙසේ වුවත් මේ සඳහා දත්ත විශ්ලේෂණයක්ද, එමෙන්ම අදාල ශිල්පක්‍රම දියුණු කිරීම සඳහා තව දුරටත් අධ්‍යයනයක්ද අවශ්‍යය.

**ව්‍යාපෘති යෝජනා**
3.1 නාරා ව්‍යාපෘති
හලාවත කලපුවේ භෞතික, ජීව විද්‍යාත්මක ක්‍රියාවලිය හා පෝෂ්‍ය ද්‍රව්‍ය ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය
එම්. සෙල්ලදුරේ මිය, වී. ධර්මරත්න මහතා හා කේ. අරුලානන්දන් මහතා

3.1.2 ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම් විශ්ලේෂණය හා උදම් නිශ්චය කිරීම - තවදුරටත් ජ.එම්.එස්. විජේරත්න මයා විසින් 1995 වසර සඳහා බාරදෙන ලදී.

3.1.3 ජලවාංග පිළිබඳ අධ්‍යයනය - මෙම අංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘති යෝජනා මනිමේබලා මිය විසින් අංශයේ සහකාර අධ්‍යක්ෂක වෙත භාරදෙන ලදි.

3.1.4 බොල්ගොඩ මෝය පද්ධතියේ සමුද්‍ර විද්‍යාත්මක සාධක අධ්‍යයනය - කේ. අරුලානන්දන් මහතා

3.2 තරේසා ව්‍යාපෘති

3.2.1 හික්කඩුව කරදිය අභය භූමියේ රොන්මඩ තැන්පත්වීම හා මඩ ප්‍රමාණය පිළිබඳ අධ්‍යයනය - ඊ.එම්.එස්.එස්. විජේරත්න හා ආර්ජන් රාජසූරිය

3.2.2 කැලණිය මෝය හරහා භෞතික ක්‍රියාවලියේ ගති විද්‍යාව හා කාබන් ගලායාම
එම්. සෙල්ලදුරේ හා ඊ.එම්.එස්. විජේරත්න

3.2.3 රළ බලශක්තිය, සූර්ය පොකුණු, මුතුරාජවෙල මුහුදු වැලි පිරවීම යන මැයෙන් ව්‍යාපෘති යෝජනා 3ක් ආචාර්ය තෙන්නකෝන් මහතා විසින් භාරදෙන ලදි.

3.2.4 විවිධ දේශගුණික තත්වවලදු ප්‍රධාන ගංගාවල කරදිය ගලායාම
කේ. අරුලානන්දන්

3.3 සරෙක් ප්‍රතිපාදන සඳහා ව්‍යාපෘති යෝජනා
ශ්‍රී ලංකාවේ වෙරළාසන්න පරිසරයට (මලල කලපුව) ස්වභාවික සම්පත් පරිපාලනය හා සමුද්‍ර විද්‍යාත්මක අධ්‍යයනය
ආචාර්ය ජ්. රණතුංග, කේ. අරුලානන්දන්, එම් සෙල්ලදුරේ, ඊ.එම්.එස්. විජේරත්න

3.4 විදේශ ප්‍රතිපාදන සඳහා

3.4.1 ශ්‍රී ලංකාවේ මනුෂ්‍යයින්ගේ අවශ්‍යතාවයන් සමුද්‍ර විද්‍යාව මගින් සපුරාගත හැකිද?
- අංශයේ පර්යේෂණ නිලධාරීන් විසින් ජපාන කාර්මික සහයෝගිතාව සඳහා අමාත්‍යාංශය හරහා ව්‍යාපෘති යෝජනා භාරදෙන ලදි.

3.4.2 පෝෂ්‍ය ද්‍රව්‍ය හා බොර වතුර ක්‍රියාකාරිත්වය මත පදනම් කඩොලාන මෝයවල පුරුකීම කෙරෙහි රසායනික කැලඹීමේ බලපෑම යන මැයෙන් ව්‍යාපෘති යෝජනා එක්සත් රාජධානියේ සවුත් ඇම්ස්ටන් වෙත වී. ධර්මරත්න මයා ඉදිරිපත් කරන ලදි.

3.4.3 සැටලයිට් දුරස්ථ පාලක මගින්වූ ශ්‍රී ලංකාවේ ජීව විද්‍යාත්මක අධ්‍යයනය සඳහා මූලික මි පෙන්වීම යන මැයෙන් ව්‍යාපෘති යෝජනා ආචාර්ය ජයකොඩි මහතා හරහා ආතර් සී. ක්ලාක් මධ්‍යස්ථානය වෙත මනිමේබලා මිය හා ආචාර්ය එන්.ජ්. රණතුංග මයා බාරදෙන ලදි.

3.5 වෙනත් ප්‍රතිපාදන සඳහා

3.5.1 ශ්‍රී ලංකාවේ දකුණු දිග හා ගිණිකොණ දිග වෙරළේ රළ බලශක්ති සෙවීම යන මැයෙන් ව්‍යාපෘති යෝජනා ආචාර්ය කේ. තෙන්නකෝන් විසින් බලශක්ති සංරක්ෂණ අරමුදල වෙත බාරදෙන ලදි.

3.6 උපදේශක සේවා සඳහා ව්‍යාපෘති

3.6.1 කුඩාවැල්ල ධීවර වරාය ප්‍රදේශයේ පසේ තත්වය පරීක්ෂා කිරීම මැයෙන් ධීවර අමාත්‍යාංශයට ආචාර්ය ජ්. රණතුංග මයා හා කේ. අරුලානන්දන් මහත්වරුන් විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදි.

3.6.2 "ධීවර සම්පත් සමීක්ෂණය" සමගාමී ජීව විද්‍යාත්මක සමුද්‍ර පරීක්ෂණ සිදුකිරීම සඳහා ආචාර්ය ජ්. රණතුංග හා කේ. අරුලානන්දන් මහත්වරුන් විසින් ආසියානු සංවර්ධන බැංකු ආධාරයෙන් කරනු ලබන ව්‍යාපෘතියේ ව්‍යාපෘති නායක වෙත යෝජනා බාරදෙන ලදි.

4.0 එතෙර පුහුණුවීම් (දිගු කාලීන හා කෙටි කිලීන)

4.1.1 ජපානයේ කොචින් විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධි පාඨමාලාවක් කේ. එස් ගුරුගේ මහතා විසින් හදාරණු ලබන අතර ඔහු 1994 මාර්තු සිට රාජකාරි නිවාඩු මත සිටී.

4.1.2 සමුද්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියක් එංගලන්තයේ සවුත් හැම්ප්ටන් විශ්ව විද්‍යාලයේ හදාරා වී. ධර්මරත්න මහතා අවුරුදු දෙකකට පසු පැමිණියේය.

4.1.3 මැඩ්රාස් 10E ආයතනය මගින් සංවිධානය කරනලද "වෙරළාසන්න කලාප පරිපාලනය" යන මැයෙන් වූ සති 10ක පුහුණු පාඨමාලාවකට ආචාර්ය කේ. තෙන්නකෝන් මහතා සහභාගී විය.

4.1.4 ආචාර්ය ජී. රණතුංග මහතා කරච්චියේ TOC ආයතනය මගින් සංවිධානය කරන ලද කරදිය භූ ගර්භ විද්‍යාව පිලිබඳ  දින 8ක පුහුණුවකටද ඕස්ට්‍රේලියාවේ IAEA ආයතනය මගින් සංවිධානය කරන ලද කරදිය විකිරණශීලිතාව යන මැයෙන් දින 12ක පුහුණු පාඨමාලාවකටද සහභාගිවිය.

4.1.5 1994 දෙසැම්බර් 9-14 දක්වා මැන්සාකිවල සමුද්‍ර විද්‍යා ආයතනයේ පැවති වැඩමුළුවකට ජ්.එම්.එස්. විජේරත්න මහතා "පුත්තලම් කලපුවේ උදම් වෙනස්වීම මැයෙන් පර්යේසණ පත්‍රිකාවක්ද, කේ. අරුලානන්දන් මහතා" පුත්තලම් කලපුවේ මතුපිට වාෂ්පීකරණ සංසන්දනය කිරීම" පිලිබඳ පර්යේෂණ පත්‍රිකාවක්ද ඉදිරිපත් කරන ලදී.

4.2 විශේෂ පුහුණුවීම්

1994 ජනවාරි සිට ජනවාරි 22 දක්වා කාලයේදී ජර්මනියෙන් ප්‍රතිපාදන සපයන සෝනි නෞකාව නැගෙනහිර ඉන්දියන් සාගරයේ දියත් කරන ලදී. මෙහිදී ආචාර්ය ජී. රණතුංග, ආචාර්ය කේ. තෙන්නකෝන් හා ඩබ්.ජ්.එස්. පර්නාන්ඩො යන අය තමාගේම පලපුරුද්ද ලබා ගැනීම උදෙසා හා බෙංගාල බොක්ක මුහුදේ වූ අවඝාදිත තත්වය හා ඒවායේ ගමන්මාර්ග හඳුනාගැනීම සඳහා  ඉහත නෞකාවේ පර්යේෂණ කටයුතුවලට සහභාගී විය. ජර්මන් ජනරජයේ පැමිණි ආචාර්ය එච්. තුඩදාස් ප්‍රධාන විශේෂඥයා විය. මෙම චාරිකාවෙන් ලබාගත් දත්ත හා නියැදි එකිනෙකා අතර හුවමාරු කරගන්නා ලදී. සමුද්‍ර සිතියම්, මීගමු මුහුදේ මහාද්වීපික තටක බැසීම ආදිය අවූ. 3ක කාලයකදී විශ්ලේසණය කිරීමට බලාපොරොත්තු වේ.

4.3 දේශීය පුහුණු පාඨමාලා

4.3.1 CRMP මගින් සංවිධානය කරන ලද කිමිදීමේ පාඨමාලාවකට විජේරත්න මහතා සහභාගී විය.

4.3.2 පරමාණු බලශක්ති අධිකාරිය මගින් සංවිධානය කරන ලද දින දෙකක දේශණවලට ආචාර්ය එන්.පී. විජයානන්ද මයා  සහභාගී විය.

5.0 නාරා වාර්ෂික විද්‍යාත්මක සැසියේදී ඉදිරිපත් කල පර්යේෂණ පත්‍රිකා

5.1.1 එම්. සෙල්ලදොරේ මිය හා එස්.ජ්.එම්. අස්මි මයා මීගමු කලපුවේ අංශු මාත්‍ර මුලද්‍රව්‍ය වල ජීව තැන්පත්වීම්

5.1.2 එච්. බී. ජයසිරි හා ජේ. කේ.රාජපක්ෂ
"පුත්තලම කලපුව කෙරෙහි මුන්දලම කලපුව හා ඕලන්ද ඇලෙහි බලපෑම"

5.1.3 ජේ.කේ.රාජපක්ෂ (ජ්.එම්.එස්. විජේරත්න පිලියෙල කරන ලද)
පුත්තලම/මුන්දලම මෝය පද්ධතියේ තාප හැවමාරුව හා සූර්ය විකිරණය 5.1.4 කේ. අරුලානන්දන් පුත්තලම කලපුවේ මතුපිට වාෂ්පීකරණය සංසන්දනය පිලිබඳ අධ්‍යයනය

5.2 පෝස්ටර් ඉදිරිපත් කිරීම

5.2.1 ආචාර්ය ටී.කේ.පී. තෙන්නකෝන්
ත්‍රිකුණාමලය ප්‍රදේශයේ OTEC බලාගාරයන්ට ඇති හැකියාව සොයාබැලීම

5.3 අනෙක් ඉදිරිපත් කිරීම්
කේ. අරුලානන්දන්
වැලිගම බොක්කේ ජල ක්‍රියාවලිය පිලිබඳ පරීක්ෂා කිරීම - නරේසා ආයතනයේදී ඉදිරිපත් කරන ලදී.

6.0 තාක්ෂණික වාර්තා

6.1 පුත්තලම කලපුව හා සම්බන්දව මුන්දලම/ඕලන්ද ඇල මගින් සිදුවන ජල හුවමාරුව
එච්. බී. ජයසිරි  - සරෙක් අවසාන වාර්තාව සඳහා

6.2 ජේ. කේ. රාජපක්ෂ
මීගමු කලපුවේ ලවණතාව වෙනස්වීම කෙරෙහි ගඟෙහි බලපෑම හා පරිපාලනය

7.0 අතිරේක රාජකාරි
1994 ඔක්තෝබර් ධනතුරු ආචාර්ය රණතුංග මයා සම්පූර්ණකොට ඒ වැඩ කටයුතුවල නිරතවීම

7.1 CFHC/ADB ව්‍යාපෘතිය යටතේ මීගමුව හා ගලාවත ප්‍රදේශවල වරාය හා නැංගුරම්ලන ස්ථාන සඳහා ඒවා ගොඩගැනීම, පරීක්ෂා කිරීම හා සැලසුම් කිරීම - එක ටෙන්ඩරයක් පිළිබඳ අවසාන තීරණයක් ගන්නා ලද අතර අනෙක්වා පිළිබඳ තීරණ ගනිමින් පවතී.

7.2 පුරාණ වැල්ල ධීවර වරාය සම්බන්ධව ක්ෂේත්‍ර චාරිකා මගින් සිදුකල දේ පිළිබඳ දත්ත ඇගැයීම. මෙහිදී අදාල යෝජනා සාකච්ඡා කරන ලදී. මෙම වාර්තාව තවදුරටත් අධ්‍යයනය කරමින් පවතී.

7.3 යාත්‍රාව පිළිබඳ සාමාන්‍ය විස්තර පිළියෙළ කරමින් පවතින අතර ඒ පිළිබඳ අදහස් ADB ව්‍යාපෘතියේ නායක ලෙස්ලි ජෝසප් මහතාට භාරදෙන ලදී.

7.4 අයර්ලන්තයේ සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව සඳහා ආචාර්ය කමල් තෙන්නකෝන් මහතා විසින් "ශ්‍රී ලංකාවේ සමුද්‍ර රළ බලශක්ති විභවය" යන මැයෙන් වාර්තා ලිපියක් පිළියෙල කරන ලදී.

7.5 ඒ.එම්.එස් විජේරත්න මයා විසින් ලිපියක් "නාරා ප්‍රවෘත්ති ප්‍රකාශණ පත්‍රිකාව සඳහා "කාබන්ඩයොක්සයිඩ් ප්‍රධාන ප්‍රභවය මුහුද වේ." නමින් ඉදිරිපත් කරන ලදී.

7.6 ජේ. කේ. රාජපක්ෂ හා එච්. බී. ජයසිරි
මුන්දලම කලපුවේ භෞතික සමුද්‍ර විද්‍යාත්මක පරීක්ෂණ මැයෙන් පෝස්ටරයක් පිළියෙල කරන ලදී.

8.0 ක්‍රියාකාරකම්
ආචාර්ය ජී. රණතුංග

8.1 කෙරවලපිටිය (මුතුරාජවෙල ගොඩකිරීමේ ව්‍යාපෘතිය සඳහා E.C.C. (පෞද්ගලික) ආයතනය මගින් පිළියෙල කල "පාරිසරික බලපෑම්" ඇගයීම් වාර්තාව සඳහා අදහස් ආචාර්ය ජී. රණතුංග මයා විසින් ආචාර්ය පද්මිනී ද අල්විස් වෙත භාරදෙන ලදී.

8.2 කල්පිටිය ප්‍රා. පර්යේෂණ මධ්‍යස්ථානයේ හා සමුද්‍රමාරු නෞකාවේ පරිපාලන කටයුතු සඳහා ආචාර්ය ජී. රණතුංග මයා සම්පූර්ණයෙන්ම නිරත විය.

එම්. සෙල්ලදොරේ මිය
8.3 මෙම අංශය තුල UNDP මගින් සපයන ලද උපකරණ වෙන්කිරීම හා ඒවා ලේඛණගත කිරීමේ ක්‍රියාවෙහි නිරතවිය.

8.4 නාරා ව්‍යාපෘති හා සමුද්‍ර මාරු සඳහා රසායන ද්‍රව්‍ය ලැයිස්තුවක් පිළියෙල කිරීම සිදුකරන ලදී.

8.5 සමුද්‍ර මාරු නෞකාවේ ජීව සමුද්‍ර විද්‍යාත්මක පරීක්ෂණ කටයුතු සඳහා ඒ පිළිබඳව පසුගිය පර්යේෂණ පත්‍රිකා එකතු කිරීමක් සිදුකරන ලදී.

වී. ධර්මරත්න
8.7 මධ්‍යම ඉන්දියන් සාගරයේ පෝෂ්‍ය ද්‍රව්‍ය ව්‍යාප්තිය මැයෙන් පෝස්ටරයක් දෙවන ආසියා භූ විද්‍යාත්මක සමුළුවට පිළියෙල කරන ලදී.

කේ. අරුලානන්දන්
8.8 සරෙක් ව්‍යාපෘතිය සඳහා නැවත අයවැය වාර්තාව පිළියෙල කරන ලදී. (භෞතික සමුද්‍ර විද්‍යාත්මක සමීක්ෂණ)

8.9 ජාතික සමුද්‍ර විද්‍යාත්මක ආයතනයට භෞතික සමුද්‍ර විද්‍යාත්මක ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති ආරම්භ කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

8.10 බොල්ගොඩ කලපුවේ සමුද්‍ර විද්‍යාත්මක සාධක අධ්‍යයනය මැයෙන් නාරා ආයතනය සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරන ලදී.

8.11 පුත්තලම කලපුවේ පරිපාලන සැලැස්ම මැයෙන් වූ සාකච්ඡාවකට සහභාගී විය.
ආචාර්ය රංජිත් ද සිල්වා සමග

ආචාර්ය කේ. තෙන්නකෝන්
8.1.2 ත්‍රිකුණාමලය කොඩ්ඩියාර් බොක්ක ප්‍රදේශයේ වූ අළුත්වැඩියා කිරීම් කටයුතු පරීක්ෂා කිරීම සඳහා ආචාර්ය කේ. තෙන්නකෝන් මයා සහභාගී විය. (චාරිකා 5ක් සිදුකරන ලදී.)

නිශාන්ත ද සිල්වා (පර්යේෂණ සහකාර)

8.1.3 මෙම අංශයේ පුස්තකාලයක් පිළියෙලකිරීම සඳහා අවශ්‍ය පසුගිය පර්යේසණ පත්‍රිකා ලැයිස්තුවක් පිළියෙල කරන ලදී.

9. බාධක
කාර්යාලයක් නැතිකම, රසායනාගාර පහසුකම්, සහාය කාර්ය මණ්ඩලය, යාත්‍රාව සඳහා සහායකයින් නැතිකම, (විදුලි ඉංජිනේරු, කාර්මිකයෙකු,) නොමැති බලපෑම ප්‍රධාන බාධක විය.

## පසු අස්වනු තාක්ෂණික අංශය

කාර්ය මණ්ඩලය

| | | |
|---|---|---|
| පර්යේෂණ නිලධාරීන් (ස්ථිර) | - | 05 |
| ව්‍යාපෘති නිලධාරීන් | - | 02 |
| පර්යේෂණ සහකාර | - | 05 |
| රසායනාගාර සහායක | - | 02 |
| කම්කරු | - | 06 |
| ලිපි ලේඛක | - | 01 |

2. අළුත් බඳවා ගැනීම්
චමිලා ලියනගේ මෙනවිය හා රංජිත් එදිරිසිංහ මහතා STD3 ව්‍යාපෘතිය සඳහා අළුතින් බඳවා ගන්නා ලදී.

3. ඉල්ලා අස්වීම්
දෙසැම්බර් මසදී දමයන්ති අමරසිංහ මෙනවිය ඉල්ලා අස්විය.

4. අධ්‍යයන නිවාඩු (විදේශ)
ඩබ්ලිව්.එම්.කේ. පෙරේරා මෙනවිය එක්සත් රාජධානයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරත වේ.

5. ස්ථාන මාරුවීම්
කම්කරු කපිල ජයසේන මයා වෙනත් අංශයකින් මෙම අංශයට මාරු කර එවන ලදී.

6. පශ්චාත් උපාධි අධ්‍යයන
ඩබ්.එම්.කේ. පෙරේරා මෙනවිය එක්සත් රාජධානියේ තවදුරටත් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුවල නිරතවී සිටින අතර ආර්. එදිරිසිංහ මයා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි විය.

7. පුහුණුවීම්, දේශණ හා වැඩමුළු

1. ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා, ආචාර්ය වී. ජයවීර හා ප්‍රදීපා ජයසිංහ මිය 1994 මාර්තු 7 සිට 11 දක්වා ඉන්දියාවේ කොචින්හිදී පැවති IPFC වල මත්ස්‍ය තාක්සණය හා වෙළඳාම යන මැයෙන් වූ රුස්වීමකට සහභාගී විය. මෙහිදී පර්යේෂණ පත්‍රිකා 5ක් සහභාගී වූවන් විසින් ඉදිරිපත් කරන ලදී.

2. පසු තාක්ෂණ ධීවර පර්යේෂණ මැයෙන් ජාත්‍යන්තර ධීවර පර්යේෂන ශිල්පක්‍රම වැඩමුළුවක් සඳහා ආචාර්ය වී. ජයවීර මිය සහභාගීවූ අතර එහිදී ශ්‍රී ලංකාවේ පර්යේෂණ ප්‍රමුඛතාව මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

3. මත්ස්‍ය ලිපිඩ STD1 ව්‍යාපෘතිය යටතේ ඩෙන්මාර්කයේ ධීවර අමාත්‍යාංශය අනුබද්ධ තාක්ෂණික රසායනාගාරයේ පැවති සති 3ක් පුහුණු පාඨමාලාවකට ආචාර්ය වී. ජයවීර මිය සහභාගී විය.

1994 නොවැම්බර් 21 සිට 25 දක්වා තායිලන්තයේ සොංග්කාලා විශ්ව විද්‍යාලයේ පැවති STD3 ව්‍යාපෘතිය හා සම්බන්ධ විද්‍යාත්මක රුස්වීමකට සහභාගී විය.

9.0 ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘති 1 - වටිනාකමින් අඩු මත්ස්‍ය විශේෂ භාවිතය
බී.ඩී.වයි. අමරසිංහ

ව්‍යාපෘති 2 - වගාකල ඉස්සන් සැකසීමේදී ඇතිවන උවදුරු විශ්ලේෂණතාවයේදී ඉතා වැදගත් පාලන අවස්ථාව ඉතා වැදගත් පාලන අවස්ථාව

ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා

ව්‍යාපෘති 3 - කරදිය නිෂ්පාදන අපනයන කර්මාන්තයේදී තත්වය පිලිබඳ කරුණු අධ්‍යයනය

ව්‍යාපෘති 4 - වටිනාකමින් අඩු මත්ස්‍යයින් හා මත්ස්‍ය කර්මාන්තයේදී බැහැර කරනු ලබන ද්‍රව්‍යවලින් ආහාර සඳහා තෙල් නිස්සාරණය කිරීම STD3 ව්‍යාපෘතිය
- ආචාර්ය වී. ජයවීර, චමිලා ලියනගේ හා ආර්. එදිරිසිංහ

ව්‍යාපෘති 5 - හිස්ටමීන් සංරක්ෂණ - ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා හා පී. ජයසිංහ මිය.

9.1 - වට්නාකම්න් අඩු මත්ස්‍ය විශේෂ භාවිතය

- බී.ඩී.වයි. අමරසිංහ

ප්‍රමාණාත්මක අධ්‍යයනයක් මගින් මත්ස්‍ය ඇඹරුම්වල තත්වය මගින් හෙලිවූයේ ජෙලිවල ශක්තිමත් බව මුන්දලි හා වෙන්ගනාවාට වඩා ලාග්නා හා කුසපොත්තා මසුන්ගේ වැඩි බවයි. මත්ස්‍ය ඇගිලි පිලියෙල කිරීමේදී භාවිතා කරනු ලබන ද්‍රව්‍ය හා සම්බන්ධව බැක්ටීරියාවල තත්වය පිලිබඳ පරීක්ෂා කිරීමේදී හෙලිවූයේ TVC 10 - 10 ග්‍රෑ. (ගම්මිරිස්) හා 10 /ග්‍රෑ. (තිරිඟු පිටි) විශ්ලේෂණය කරන ලද සාම්පල දිලීර ප්‍රමාණය 10/ග්‍රෑ. විය.

පොලිස්ටයිරින් බහාලකවල ගබඩා කරනලද ඇඹුල් තියල්වල ගබඩා කිරීමේ ලක්ෂණ පරීක්ෂා කරන ලද අතර, එමගින් ලබාගත් ප්‍රථිඵල, 1994 මාර්තු මාසයේ ඉන්දියාවේ කොචින්වල පැවති IPFC නව වන සැසිවාරයේදී ඉදිරිපත් කරන ලදී.

මසුන් සංරක්ෂක කාරකයක් වශයෙන් ගොරකාවලට ඇති හැකියාව පිලිබඳ මෙම රුස්වීමේදී සාකච්ජා කරන ලදී. බැක්ටීරියා හා දිලීර මත මෙම ගොරකා සංරක්ෂකකාරකයක් වශයෙන් ඇතිවිය හැකි බලපැම පිලිබඳ අධ්‍යයනය කරන ලදී. මෙහිදී පලමු අධ්‍යයනය ගොරකා නිස්සාරකයක් සමග සම්බන්ධ කරනලද රසායනාගාර මාධ්‍යය හා ගොරකා නිස්සාරණය සමග පොටැසියම් සෝඩියේට් හා ටැටරික් අම්ලය, පිලිබඳ සිදුකරන ලදී. මෙම ප්‍රතිඵල 1994 පැවති SLAAS වාර්ෂික විද්‍යාත්මක සැසියේදී ඉදිරිපත් කරන ලදී.

ගොරකා හා සෝඩේට් සමග එක්ව බැක්ටීරියා හා දිලීර මත ක්‍රියාකරන බව සොයාගන්නා ලදී. විවිධ ආකාරයේ ගොරකා නිස්සාරණ හා සෝඩේට් තුල මසුන් ගිල්වා ඒවායේ ක්‍රියාකාරිත්වය නිර්ණය කිරීමට උත්සාහ කරන ලදී. මෙහිදී 2% සෝඩේට් තුල ගිල්වන ලද PH 5.7 දක්වා ගොරකා නිස්සාරකය භාවිතයෙන් අඩු කරන ලද අතර මෙය හුරුල්ලා මසුන්ගේ සම මතවූ බැක්ටීරියා ප්‍රමාණය අඩුකිරීමට හේතු විය.

මසුන් අපනයනය කරන අය සමග ඒකාබද්ධව සුළු පරිමානයෙන් මෙම ප්‍රතිකාරය පරීක්ෂාකරන ලදී.

එය වාතය ඉවත් කල තත්ව යටතේ අසුරන ලද ශීතකල ස්වෝඩ් මසුන් කෙරෙහි බලපැම පරීක්ෂා කරන ලදී. මෙම ප්‍රතිකාරය ගිල්වා හා විසිරුවා පරීක්ෂා කරන ලද අතර අපනයනය කරන්නන් විසින් භාවිතාකරන ලද ප්‍රතිකාරක සමග සන්සන්දනය කරන ලදී. මෙම පරීක්ෂණය නැවත වරක් කරන ලද අතර මෙම පරීක්ෂා දෙකෙන්ම හෙලිවූයේ ප්‍රතිකාරකය විසුරුවා හැරීම එය ගිල්වීමට වඩා ක්‍රියාකාරී බවයි.

හයිඩ්‍රජන් සල්ෆයිඩ් නිෂ්පාදනය කරන බැක්ටීරියාවල වර්ධනය පාලනය කිරීමට මෙමප්‍රතිකාරකය සමත් බව සොයා ගන්නා ලදී. (ආහාර නරක් කරන බැක්ටීරියා ) 1994 තාරා වාර්ෂික සැසියේදී මෙම ප්‍රතිඵල ඉදිරිපත් කරන ලදී. කොචින්වල පැව.ති IPFC රුස්වීමේදී ඉදිරිපත් කරන ලද මෙම ප්‍රථිඵල දැනගැනීමෙන් පසු මහාචාර්ය එම්.එම්.හුස් විසින් ඩෙන්මාර්කයේ සිසුන් අප ආයතනයේ මේ පිලිබඳව පර්යේෂණ කටයුතු කරන අය සමග ඒකාබද්ධව පර්යේෂණ කිරීමට ඇති හැකියාව පිලිබඳව විමසීය. ඔවුන් නොවැම්බර් මස පැමිණි අතර මසුන් හා මත්ස්‍ය නිෂ්පාදනවල ලැක්ටික් අම්ල බැක්ටීරියාවල පැවැත්ම පිලිබඳ අධ්‍යයනය කල අතර ඔවුන් එම බැක්ටීරියා ජෛව සංරක්ෂකාරකයක් ලෙස භාවිතා කලහැකිද යන්න සොයාබලන ලදී.

9.2 වගාකල ඉස්සන් සැකසීමේදී ඇතිවන උවදුරු විශ්ලේෂණතාවයේදී ඉතා වැදගත් පාලන අවස්ථා විවිධ ක්‍රියාකාරකම් කර්මාන්තයේ තත්වය, හා ඉස්සන් අයිස් හා ජලය සාම්පල එම කර්මාන්තාගාරයෙන් එක්රුස් කරන ලදී.

මෙම සාම්පල සම්පූර්ණ බැක්ටීරියා ප්‍රමාණය, කෝලිපෝම්ස් එස්චරිසිටා කෝලයි හා සැල්මොනෙල්ලා පිලිබඳ විශ්ලේෂණය කරන ලදී. මෙහිදී සැකසීමේදී දුර්වලතා ලෙස ශීතකිරීමට පෙර හොඳින් නොසේදීම, අධි ශීත තැටිවල ශීතකිරීමට පෙර යම් කාලයක් තැබීම හඳුනාගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය 1995දී තවදුරටත් සිදුකරනු ලැබේ.

9.3 කරදිය නිෂ්පාදන අපනයන කර්මාන්තයේදී තත්වය හා සම්බන්ධ කරුණු අධ්‍යයනය

මෙහිදී කර්මාන්ත 04 පරීක්ෂා කරන ලදී. හැම කර්මාන්තශාලාවක්ම අවස්ථා දෙකකදී සාම්පල කරන ලදී. මෙහිදී එකතුවන සාම්පල, බාස්කට් තැටි, අත්වැසුම්, තරාදි ආදිය එනම් ඉස්සන්/මසුන් ගැනීමේදී ඇතිවන සාම්පල ජලය හා අයිස් සාම්පල ඉස්සන්/මසුන් සාම්පල එක් එක් අවස්ථාවේදී එකතුකරන ලද අතර මුළු බැක්ටීරියා ප්‍රමාණය පිලිබඳ විශ්ලේෂණය කරන ලදී. තවද හයිඩ්‍රජන් සල්ෆයිඩ් නිස්පාදකයන්, කෝලිපෝම්ස්, අපද්‍රව්‍ය මතවූ කොලිපෝම්ස්, එස්චරිසිටා කෝලයි හා ස්ටැපිලොකොකස් අවුරියස් හඳුනාගන්නා ලදී.

මෙම ප්‍රතිඵල වලින් හඳුනාගන්නා ලද්දේ භාවිතා කරනු ලබන උපකරණ එනම් තැටි, අත්වැසුම්, බාස්කට් හා එක් අවස්ථාවකදී බර කිරීම සඳහා භාවිතා කල තරාදියේ ඇඩි ලෙස දූෂණය වී ඇති බවයි. පාවිච්චි කිරීමට පෙර මේස මත, තැටිවල අත්වැසුම් වල අධික බැක්ටීරියා ගණනක් තිබීමෙන් පෙනී යන්නේ ඒවා පාවිච්චි කිරීමට පෙර සිදුකරනලද සේදීම බැක්ටීරියා ඉවත් කිරීමට තරම් ප්‍රමාණවත් නොවන බවයි.

ඉස්සන්/මසුන් සැකසීමේදී ඇතිවන විවිධාකාරයේ දුර්වලතාත් මෙම අධ්‍යයනයෙන් හඳුනාගන්නා ලදී. මෙහිදී මසුන් සැකසීමේ යෙදෙන්නාගේ ඉල්ලීම් පරිදි වාර්තා දෙකක් නිකුත් කරන ලදී. ඉස්සන් සැකසීමේදී PH තත්වයට බලපාන

සාධකයක් ලෙස භාවිතා කිරීමට ඇති හැකියාව පිලිබඳ සොයාබලන ලදී. මෙම පරීක්ෂණය එම ප්‍රදේශයේදී ආරම්භ කරන ලද අතර, අස්වනු නෙලන කාලය එනම් පැය 87 පමණ කාලයක් සිදු කරන ලදී. පැය 32කට පසු ගබඩා කරන ලද මසුන්ගේ PH වැඩිවීමක් නිරීක්ෂණය කරන ලදී. අයිස් තුල පැය 87කට වඩා ගබඩා කිරීමේදී මුලිකව PH 6.5 සිට 7.4 දක්වා වැඩිවන ලදී. මෙම පරීක්ෂණ තත්වය ස්ථාපිත කිරීමේ අවස්ථාවක් ලෙස ස්ථාපිත කිරීමේ අරමුණින් නැවත වතාවක් සිදුකරන ලදී.

9.4 වටිනාකමින් අඩු මත්ස්‍යයින් හා මත්ස්‍ය කර්මාන්තයේදී බැහැර කරනු ලබන ද්‍රව්‍ය වලින් ආහාර සඳහා තෙල් නිස්සාරණය කිරීම (STD3 ව්‍යාපෘතිය) වී. ජයවීර, සී.වී. ලියනගේ හා ආර්. එදිරිසිංහ

මෝර අක්මාව (සී.වී. ලියනගේ)
මෙම අධ්‍යයනය සඳහා මසුන් ගොඩබාන ස්ථාන 3ක් වන මීගමුව, බේරුවල හා මිරිස්ස තොරාගන්නා ලදී. මෙහිදී අක්මා සාම්පල 100ක් විවිධ ආකාරයේ මත්ස්‍ය විශේෂ වලින් එකතු කරන ලද අතර ලිපිඩ සෙවීම සඳහා විශ්ලේෂණය කරන ලදී. ලිපිඩ ප්‍රමාණය හා ගොඩබාන විවිධ ආකාර මෝර විශේෂ 3ක් එනම් Silky shark (කාචාරියේ පැලයිපෝටිස්) Hammer head shark හා Oceanic white tip shark ඉහලම නිෂ්පාදනය හා ඉහලම තෙල් ප්‍රමාණය හඳුනාගන්නා ලද අතර එම විශේෂ තවදුරටත් කාලානුරූපීව ලිපිඩ ප්‍රමාණය හා තත්වය වෙනස්වීම අධ්‍යයනය භාවිතා කරන ලදී.

TVN හා PH අක්මාවේ තත්වය පරීක්ෂා කිරීමේ සාධක ලෙස භාවිතා කරන ලදී. ඉහල TVN හා PH අගයයන් බාල තත්වය විදහා දක්වයි. නිදහස් මේද අම්ල, පෙරොක්සයිඩ් හා තයෝබාර්බිටියුරික් අම්ල අගයයන් තෙල්වල තත්වය පරීක්ෂා කිරීමේ සාධක භාවිතා කරන ලදී. ලිපිඩ ප්‍රමාණය හා තත්වය මත අයිස් තුල ගබඩා කිරීම හා අධිශීත කිරීම බලපාන ආකාරය පරීක්ෂා කරන ලදී. නිදහස් මේද අම්ල හා පෙරොක්සයිඩ් අගයයන් පරීක්ෂා කිරීමේදී ඒවා ඉහලයාම මගින් හෙළිවූයේ අයිස් තුල ගබඩා කිරීම නිසා ලිපිඩවල තත්වය බාලවන බවයි.

අක්මා පේශියේ වූ තෙල්වල ලිපිඩ ඔක්සිකරණය වේගය පරීක්ෂා කරන ලද අතර අයිස් තුල ගබඩා කිරීමේදී එය වැඩිවී ඇති බව සොයාගන්නා ලදී. ඔක්සිජන් මීටරයක් භාවිතයෙන් ලිපිඩ ඔක්ස්කරණය කටයුතුද කරන ලද මෙම තාක්ෂණය ආචාර්ය සුසුන් බ්‍රෝග්වීයින් හඳුන්වා දෙන ලදී.

මත්ස්‍ය පේශිවල වූ ලිපිඩවල ඔක්සිකරණය වේගය සොයා බැලීම පිලිබඳ කටයුතු කිරීමට STD3 ව්‍යාපෘතිය යටතේ හැවමාරු වැඩසටහනක් ලෙස එක්සත් රාජධානිය ආචාර්ය බ්‍රොග් එවන ලදී. ඇය නාරා ආයතනයේ මෙම අංශයේ 1994 ඔක්තෝබර් නොවැම්බර් මාසවල වැඩ කරන ලදී. වාණිජමය නිස්සාරණය කිරීමේ ක්‍රමයක් සොයා බැලීම උදෙසා තෙල් නිස්සාරණය කිරීමේ විවිධ ක්‍රම සිදුකරන ලදී. මෙම අධ්‍යයනය තවදුරටත් සිදු කෙරේ.

ඩෙන්මාර්කයේ මහාචාර්ය එච්.එච්. හුග් (ව්‍යාපෘති නියාමක) වෙත මෙම STD3 ව්‍යාපෘතියේ තත්වය පිලිබඳ වාර්තාවක් බාරදෙන ලදී.

කුඩා නිතලවාසී මසුන් - ආර්. එදිරිසිංහ
මෙහිදී මීගමුව හා හලාවත මසුන් ගොඩබාන ස්ථාන තෝරාගන්නා ලදී. මත්ස්‍ය වර්ග 47ක් ලිපිඩ ප්‍රමාණය සොයාගැනීම සඳහා විශ්ලේෂණය කරන ලදී. මසුන්ගේ තත්වය TVN ප්‍රමාණය මගින් නිර්නය කරන ලදී. නිස්සාරණය කරන ලද ලිපිඩවල තත්වය පෙරොක්සයිඩ, නිදහස් මේද අම්ල ප්‍රමාණය, හා තයෝබියුටරික් අම්ල අගය මගින් නිර්නය කරන ලදී. බහුලතාන ඉහල ලිපිඩ ප්‍රමාණය හා අඩු අගය මත පදනම්ව තවදුරටත් අධ්‍යයනය සඳහා මත්ස්‍ය විශේෂ ලාග්ගා, සූඩයා (සාඩිනල්ලා අල්බෙල්ලා), ලින්නා (වෙකාප්ටෙරස් සෙල්ලයි) කාරල්ලා (සෙකියුටර් රුකෝසස්) කිලිටා (ටෙරාසොන් පරුබා) හුරුල්ලා (අම්බ්ලිගස්ටර් සර්ම්), ඕරාවා (ඕගතස් ජායේ) හා අන්ගයා (ජුඩ්ලියර්) විය. තෙල් ප්‍රමාණයේ කාලරූපී වෙනස්වීම හා ඒවායේ තත්වය පිලිබඳ ඉහත විශේෂවල අධ්‍යයනයක් ආරම්භ කරන ලද අතර එය තවදුරටත් 1995දී ක්‍රියාත්මක කරනු ලැබේ.

මත්ස්‍ය පේශිවලින් ලිපිඩ නිස්සාරණය පිලිබඳ මූලික අධ්‍යයනය සිදුකරන ලදී. මෙම වැඩ කටයුතු තවදුරටත් 1995දී සිදු කරනු ලැබේ. සාලයා මත්ස්‍යයාගේ ලිපිඩවල ප්‍රමාණය හා තත්වය අයිස්වල ගබඩා කර ඇති විටදී බලපාන ආකාරය පිලිබඳ පරීක්ෂා කරන ලදී. මෙම අධ්‍යයන මීන් හෙළිවූයේ අයිස් තුල ගබඩා කිරීම මගින් තෙල්වල තත්වය කාමර උෂ්ණත්වය යටතේ ගබඩා කිරීමට වඩා ආරක්ෂා කලහැකි බවයි.

"STD3 ව්‍යාපෘතියේ නියාමක ඩෙන්මාර්කයේ මහාචාර්ය එච්.එච්. හුස් වෙත තත්වය පිලිබඳ වාර්තාවක් භාරදෙන ලදී.

9.5 හිස්ටමින් සමීක්ෂණය - ටී. එස්.ජී. පොන්සේකා හා පී. ජයසිංහ
මෙම කාලය තුලදී කරවල සාම්පල 9ක් එනම් ඒවා නිෂ්පාදනය කරනු ලබන කල්පිටිය හා හලාවත ප්‍රදේශවලින් 5ක්ද, ඒවා පාරිභෝජනය කරනු ලබන කුරුණෑගල - නුවර ප්‍රදේශවලින් 4ක්ද විශ්ලේෂණය කරන ලදී. සාම්පල 120ක් එකතු කරන ලද අතර එයින් සාම්පල 77ක් නුවර-කුරුණෑගල-කුලියාපිටිය ප්‍රදේශවලින්ද, අනෙක්වා හලාවත-කල්පිටිය ප්‍රදේශවලින්ද එකතු කරන ලදී. මෙම සාම්පල සියල්ල හිස්ටමින සඳහා පරීක්ෂා කරන ලදී. තවදුරටත් හිස්ටමින විකාබොක්සිලේස් නිෂ්පාදනය කරන ජීවීන් වෙන්කර ගන්නා ලද අතර ඒවා ජෛව රසායනික අධ්‍යයන සඳහා භාජනය කරන ලදී. කරවල වල හිස්ටමින ප්‍රමාණයේ පුළුල් වෙනස්වීමක් දක්නට ලැබේ. සාම්පල 16ක හිස්ටමින 6 මිලිග්‍රෑම්/ 100 ග්‍රෑ. අතර ඒවායින් සාම්පල 13 ඒවා නිෂ්පාදනය කරන ප්‍රදේශවලින් වේ.

සාමාන්‍යයෙන් හිස්ටමින ප්‍රමාණය නිෂ්පාදනය කරන ප්‍රදේශවලින් ලබාගත් කරවලවල ප්‍රමාණයට වඩා අඩුවිය. කෙසේ වුවද කල්පිටිය ප්‍රදේශයෙන් ලබාගත් බලයා කරවල සාම්පලයේ හිස්ටමින අධිකතම ප්‍රමාණයක් විය. (2086 මි.ග්‍රෑ./ 100 ග්‍රෑ). සාමාන්‍යයෙන් අභ්‍යන්තර ප්‍රදේශවල කරවලවල හිස්ටමින පුළුල් පරාසයක පවතී. සාම්පලවලින් 30% (23/ 77) වල හිස්ටමින ප්‍රමාණය 100 මි.ග්‍රෑ./100 ග්‍රෑ. වඩා වැඩිවිය. මෙම ප්‍රතිඵල වලින් හෙලිවූයේ 90% වඩා වැඩි ප්‍රමාණයක් ග්‍රෑම් ඍණ සංචාරක අඩුආකාර කාටලේජ ධන හා ඔක්සිකරන ධන හෝ ඍණ බැක්ටීරියා බවය. මොවුන් ප්‍රොටියස් හා එන්ටරෝ බැක්ටීරියේසිස් කාණ්ඩවලට අයත්ය. අභ්‍යන්තර ප්‍රදේශවල මෙම කරවල එක් සාම්පලයක් පිලිබඳ වැඩ කල පසු වාර්තාව ඉදිරිපත් කරයි. මෙය 1995 ජනවාරිවල සිදුකරනලද වාර්තාව පිලියෙල කිරීම 1995 මාර්තුවල නිමා කෙරේ.

10.0 අමතර වැඩ, පරීක්ෂණ සේවා හා තොරතුරු බෙදාහැරීම

1. මත්ස්‍ය සාම්පල 21ක්ද, ඉස්සන් සාම්පල 5ක්ද, මුළු සංඛ්‍යාව, මුළු කොලිපෝම ගණන, එස්චරිසියා කෝලයි හා ස්ටැපිලොකොකස් අවුරියස් ප්‍රමාණය සෙවීම සඳහා විශ්ලේෂණය කරන ලදී.

2. හිස්ටමින ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ටූනා සාම්පල 6, සප්පරා සාම්පල 1, උම්බලකඩ සාම්පල 1ක්ද විශ්ලේෂණය කරන ලදී.

3. සේවාදායකයකු සඳහා මත්ස්‍ය සාම්පල 6ක රසදිය ප්‍රමාණය පිලිබඳ විශ්ලේෂණය කරන ලද අතර වාර්තාව භාරදෙන ලදී.

4. මසුන් සාම්පල 10, ඉස්සන් සාම්පල 6, හා පොකිරිස්සන් සාම්පල 1ක් මුළු බැක්ටීරියා ප්‍රමාණය මුළු කොලිපෝම් ප්‍රමාණය, අපවිත්‍ර ද්‍රව්‍යවල වූ කෝලිපෝම් ප්‍රමාණය, ඊකෝලයි,ස්ටැපිලොකොකස් අවුරියස්, විබ්‍රියෝ කොලරා, හා විබ්‍රියෝ පැරාහෙමොලිටිකස් හා සැල්මොනෙල්ලා සඳහා විශ්ලේෂණය කරන ලදී.

5. එක් මත්ස්‍ය සාම්පලයක් විබ්‍රියෝ කොලරා සඳහා විශ්ලේෂණය කරන ලදී.

6. උම්බලකඩ හා ලුණු දමන ලද කරවල පිලියෙල කිරීම පිලිබඳ වාර්තා 2ක් සේවා දායකයකුට භාරදෙන ලදී.

7. සේවා දායකයකුගේ ඉල්ලීම් පරිදි මසුන් සැකසීමේ ස්වභාවික තත්වය අධ්‍යයනය කිරීමක් සිදුකල අතර වාර්තා භාරදෙන ලදී.

8. ඉස්සන් සාම්පල 2, පොකිරිස්සන් සාම්පල 1, මුළු බැක්ටීරියා ප්‍රමාණය, මුළු කෝලිපෝම් සංඛ්‍යාව, අපද්‍රව්‍ය වල වූ කෝලිපෝම් හා ඊකොලයි, ස්ටැපයිලොකොකස් අවුරියස්, විබ්‍රියෝ කොලරා, විබ්‍රියෝ පැරාහෙමොලිටික්ස් හා සැල්මොනෙල්ලා සඳහා විශ්ලේෂණය කරන ලදී.

9. ජලය සාම්පල 4, අයිස් සාම්පල 2, බැක්ටීරියා තත්වය පිලිබඳ විශ්ලේෂණය කරන ලදී. නිර්නය කල සාධක වූයේ කෝලිපෝම්ස්, අපද්‍රව්‍ය වලවූ කෝලිපෝම් හා ඊකොලයි ආදීන්ය.

10. සේවාදායකයකු සඳහා ඇල්ගී සාම්පල 2 අඩංගු ද්‍රව්‍ය විශ්ලේසණය කරන ලද අතර වාර්තාව භාරදෙන ලදී.

11. සේවාදායකයකුගේ ඉල්ලීම පරිදි මසුන් සාම්පල 2ක තත්වය පිලිබඳ පරීක්ෂා කරන ලද අතර වාර්තාව බාරදෙන ලදී.

12. කුලියාපිටිය අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අවසාන වසර සිසුන්ගේ උපාධි නිබන්ධන පරීක්ෂා කිරීම සඳහා ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා මයා පරීක්ෂකයකු වශයෙන් සහභාගී විය.

13. ජීවී පොකිරිස්සන් අපනයනය මත ආසියා පැසිපික් ජල පද්ධති සඳහා උපදේශක සේවා සිදු කරන ලදී.

14. කැලණිය විශ්ව විද්‍යාලයේ අවසාන වසර සත්ව විශේෂවේදී සිසුන් සඳහා ආචාර්ය වී. ජයවීර මහත්මිය මත්ස්‍ය තාක්ෂණය පිලිබඳ දේශණ පැවැත්විය.

15. Cartis සමාගම මගින් මුහුදු පැලෑටි සාම්පල 3ක් විශ්ලේෂණය සඳහා බාරදෙන ලදී. මෙම සාම්පලවල ජෙලිවල ශක්තිමත්බව සංයුතිය හා රසායනික සංයුතිය පරීක්ෂා කරන ලදී. මෙම සාම්පල එස්චරිසිටා කෝලයි හා සැල්මොනෙල්ලා පිලිබඳ විශ්ලේෂණය කරන ලදී. මෙම වාර්තා සේවාදායකයාට භාරදෙන ලදී.

16. ජීවී පොකිරිස්සන් අපනයනය මත ආසියා පැසිපික් ජල පද්ධති පිලිබඳ උපදේශක සේවාවක් ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා මයා සිදු කරන ලද අතර වාර්තාව බාරදෙන ලදී.

17. මත්ස්‍ය සොසේජස් සාම්පල මුළු බැක්ටීරියා ප්‍රමාණය, අපද්‍රව්‍යවල වූ කෝලිපෝම්, එස්චරිසිටා කෝලයි, සැල්මොනෙල්ලා හා ස්ටැපිලොකොකස් අවුරියස් පිලිබඳ විශ්ලේෂණය කරන ලදී.

18. ටින්කරන ලද මසුන් නැවිගත කිරීම පිළිබඳ අධ්‍යයනය හා වාර්තා කිරීම සඳහා කර්මාන්ත, තාක්ෂණ හා මානව සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ උපදේශක ආචාර්ය තිස්ස විතාරණ මහතාගේ ඉල්ලීම පරිදි ආචාර්ය වී. ජයවීර සැප්තැම්බර් 19දින රැස්වීමකට සහභාගී විය.

19. සංයුතිය සොයාගැනීම සඳහා ඉස්සන්ට දෙනු ලබන ආහාර සාම්පලයක් විශ්ලේෂණය කරන ලද අතර වාර්තාව පිළියෙල කරන ලදී.

20. බැක්ටීරියා තත්වය සෙවීම සඳහා එක් සාම්පලයක් විශ්ලේෂණය කරන ලදී.

21. ආචාර්ය වී. ජයවීර මිය විසින් "උවදුරු විශ්ලේෂණයේදී වැදගත් පාලන අවස්ථා" මැයෙන් දේශනයක් ඉස්සන් සැකසීමේ කර්මාන්තය සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අය සඳහා ඉදිරිපත් කරන ලදී.

22. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ආහාර විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය හදාරන සිසුන් සඳහා ආහාර ක්ෂුද්‍රජීවී විද්‍යාව මැයෙන් දේශණ මාලාවක් ආචාර්ය වී. ජයවීර මිය විසින් සිදුකරන ලදී.

23. මට්ටක්කුලිය පුහුණු ආයතනයෙහි පැවති වැඩ මුළුවකදී ආචාර්ය වී. ජයවීර මිය විසින් ගුරුවරුන් සඳහා අත් පොතක් පිළියෙල කිරීමේදී එයට මත්ස්‍ය තාක්ෂණය නමින් දේශන ඉදිරිපත් කරමින් දායක විය.

11. වාර්තා හා ප්‍රකාශණ

1. වී.එස්.ජී. පොන්සේකා හා ආර්. විතානගේ
සුදුසු උෂ්ණත්ව වලදී හා අයිස් තුල ඉස්සන් (පීනේයස් මොනඩන්) ගබඩා කිරීමේ ජීව කාලය - 1994 මාර්තුවල කොචින්හිදී පැවති දෙවන IPFC වාර්ෂික සැසියේදී ඉදිරිපත් ඉදිරිපත් කරන ලදී.

2. වී. එස්. ජී. පොන්සේකා "ශ්‍රී ලංකාවේ ගොවිපල ඉස්සන්ගෙන් වෙන් කරගත් සැල්මොනෙල්ලා අනුක තත්වය" 1994 මාර්තුවල කොචින් හිදී පැවති 9වන IPFC වාර්ෂික සැසියට ඉදිරිපත් කරන ලදී.

3. වී.එස්.ජී. පොන්සේකා හා අයි.වී. රංජනී හා කේ.එස්.සීතා
බහුදින යාත්‍රාවලින් ඇල්ලූ අයිස්තුල ගබඩා කල ටූනා මසුන් තුලවූ හිස්ටමින ප්‍රමාණය (කට්සුවොනස් පෙලමිස්) - 1994 නාරා වාර්ෂික සැසිය

4. වී.එස්.ජී. පොන්සේකා හා ආර්. විතානගේ
"අයිස් තුල ගබඩා කිරීමේදී ටූනා මසුන්ගේ හිස්ටමින" - 1994 SLAAS වාර්ෂික සැසිය

5. එල්.එස්. කුමාරසිංහ, වී.එස්.ජී. පොන්සේකා හා යූ. එදිරිසිංහ
අස්වනු නෙලීමේදී හා සකස් කිරීමේදී ගොවිපල ඉස්සන්ගේ ක්ෂුද්‍ර විද්‍යාත්මක ලක්ෂණ - 1994 SLAAS වාර්ෂික සැසිය

6. බී.ඩී.වයි. අමරසිංහ හා වී. ජයවීර
"ඇඹුල් තියල්වල ජීවී කාලය දික්කිරීම"
1994 මාර්තුවල කොචින්වල පැවති IPFC 9වන සමුළුවට ඉදිරිපත් කරන ලදී.

7. බී.ඩී.වයි. අමරසිංහ හා වී. ජයවීර හා එස්. කපුදුව
මසුන් සකස් කිරීමේදී සංරක්ෂකකාරකයක් ලෙස ගොරකාවල බලපෑම - නාරා විද්‍යාත්මක සැසියට ඉදිරිපත් කෙරිණි.

8. බී.ඩී.වයි. අමරසිංහ හා වී. ජයවීර
බැක්ටීරියාවල වර්ධනය කෙරෙහි ගොරකාවල බලපෑම පිළිබඳ මූලික පරීක්ෂණ - SLAAS විද්‍යාත්මක සැසියට ඉදිරිපත් කරන ලදී.

9. එන්.එම්. දිසානායක හා බී.ඩී.වයි. අමරසිංහ
වරාය පරිසරයේ දූෂණය හා සම්බන්ධව මීගමු ධීවර වරායේ දැනට පවතින තත්වය. මෙහි වාර්තාව බෙංගාල බොක්ක ව්‍යාපෘතියට සපයන ලදී.

10. පී. ජයසිංහ, සී.වී. ලියනගේ හා සී. ජයසිංහ
මුහුදු පැලෑටි මගින් ජිගාර් නස්සාරණය කිරීම
1994 කොචින්හිදී පැවති 9වන IPFC සැසියට ඉදිරිපත් කෙරිණි.

11. පී.එස්.ජයසිංහ හා සී. ජයසිංහ
ජලයේ රසදියේ තත්වය ඉවත් කිරීම පිළිබඳ කීටොසාන් පිළිබඳ මූලික අධ්‍යයනය - 1994 නාරා විද්‍යාත්මක සැසිය

12. පී. එස්. ජයසිංහ, සී.වී. ලියනගේ, සී. ජයසිංහ හා ආර්. සමරදිවාකර
කටුව සහිත මත්ස්‍ය කර්මාන්තයේදී නිකුත්වන ද්‍රව්‍ය භාවිතය - 1994 SLASS විද්‍යාත්මක සැසියට ඉදිරිපත් කෙරිණි.

13. වී. ජයවීර හා ආර්. බ්‍රවුන් - ශ්‍රී ලංකාවේ මසුන්ගේ හිස්ටමින - 1994 කොචින්හිදී පැවති 9වන IPFC වාර්ෂික සැසියට ඉදිරිපත් කරන ලදී.

14. වී. ජයවීර - පසු අස්වනු ධීවර කර්මාන්ත වැඩමුළුව - ශ්‍රී ලංකාවේ තත්වය
1994 ඉන්දියාවේ කොචින්වල පැවති ජාත්‍යන්තර ධීවර පර්යේෂණ උපාය මාර්ග වැඩමුළුව සඳහා වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

15. වී. ජයවීර - මසුන් සකස් කරනු ලබන ස්ථාන 1 හා 11 හි විවධ අවස්ථාව

භාරදෙන ලදී.

16. වී. ජයවීර, කේ. හෙට්ටිආරච්චි හා බී.ඩී.වයි. අමරසිංහ
නොපිසින ලද හා පිසින ලද ආහාර මත ව්‍යාධි ජනක බැක්ටීරියාවල පැවැත්ම, ජීවත්වීම හා සංඛ්‍යාවෙන් වැඩිවීම - නාරා අභ්‍යන්තර වාර්තාව

17. සී. වී. ලියනගේ
ආහාර සඳහා මත්ස්‍ය අපද්‍රව්‍යවලින් තෙල් නිස්සාරණය කිරීම 1 මෝර අක්මාව
1994 නොවැම්බර්වල තායිලන්තයේ සොංග්කාල විශ්ව විද්‍යාලයේ පැවති STD3 ව්‍යාපෘතියේ විද්‍යාත්මක රුස්වීමේදී වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

18. ජ.එම්.ආර්.කේ.බී. එදිරිසිංහ - ආහාර සඳහා මත්ස්‍ය අපද්‍රව්‍ය වලින් තෙල් නිස්සාරණය කිරීම
- 11 කුඩා නිතලවාසී මසුන්
1994 නොවැම්බර්වල තායිලන්තයේ සොංග්කාල විශ්ව විද්‍යාලයේ පැවති STD3 ව්‍යාපෘතියේ විද්‍යාත්මක රුස්වීමේදී වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

12. ව්‍යාපෘති නිරීක්ෂණ
පැසවුම්කරණය කරන ලද මසුන් පිළිබඳ පී. ජයසිංහ මිය විසින් සිදුකරන ලද දර්ශණපති (M. Phil) උපාධි පාඨමාලාව සඳහා අභ්‍යන්තර උපදේශකයකු වශයෙන් ආචාර්ය ටී.එස්.ජී. පොන්සේකා මයා සහභාගී විය.

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පැවති උපාධි අපේක්ෂකයන් පරීක්ෂා කිරීමේ කටයුතුද සිදු කෙරුණි. මෙම ව්‍යාපෘති ගොවිපළ ඉස්සන්ගේ බැක්ටීරියා රෝග මත පදනම් විය.

ආචාර්ය වී. ජයවීර, සී.වී. ලියනගේ මිය හා ආර්. එදිරිසිංහ යන අය අභ්‍යන්තර උපදේශකත්ව දැරිය. මෙම ව්‍යාපෘතිය STD3 යටතේ වූ මත්ස්‍ය ලිපිඩ යටතේ වූ අධ්‍යයනය ඉස්සන් සකස් කිරීමේ PH දත්ත වල වැදගත්කම පරීක්ෂා කිරීම පිළිබඳ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයකු උපදේශණය කරන ලදී.

බාධක:
මාධ්‍ය හා රසායනික ද්‍රව්‍ය සැපයීම අඩුවීම නිසා ව්‍යාපෘති කිහිපයක බාධා ඇති විය.

# පාරිසරික අධ්‍යයන අංශය

1. නාරා/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පාලන වැඩසටහන

කටුනායක හා බියගම අපනයන ප්‍රවර්තන කලාපවල පිහිටි කර්මාන්තශාලා වලින් නිකුත් කරනු ලබන කාර්මික අපද්‍රව්‍ය පිලිබඳ සමීක්ෂණයක් සතිපතා සිදුකරන ලදි. මෙහිදී භෞතික රසායනික සාධක 15 සාම්පල 121ක සොයාබලන ලදි. තවද මෙයින් සාම්පල 97ක කටුනායක ප්‍රදේශයෙන්ද, 23ක් බියගම ප්‍රදේශයෙන්ද ගන්නා ලද අතර ඇන්සෙල් ලංකා පුන්ගලික අංශයෙන් ලබාගත් සාම්පලයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉල්ලීම් පරිදි සිදුකරන ලදි. විශ්ලේෂක වාර්තාවල සඳහන් වූ නිර්දේශ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉල්ලීම පරිදි සිදුකරන ලදි. විශ්ලේෂක වාර්තාවල සඳහන්වූ නිර්දේශ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාරදෙන ලදි. මෙහිදී කටුනායක කලාපයෙන් එක්කරන ලද සමහර සාම්පල විශ්ලේෂණයෙන් හෙළිවූයේ ඒවායේ අඩංගු ද්‍රව්‍යය සාමාන්‍යයෙන් අභ්‍යන්තර ජලාශවලට නිදහස් කලහැකි මට්ටම් ඉක්මවා ගොස් ඇති බවයි. එවැනි දේ අදාල සුදුසු පියවර ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට භාරදෙන ලදි.

මෙම ආයෝජන ප්‍රවර්තන කලාපවලට අමතරව, කටාන ප්‍රදේශයේ වූ රබර් අත් ආවර්ණ නිෂ්පාදනය කරනු ලබන හා රබර් කර්මාන්තශාලාවක් පරීක්ෂා කරන ලද අතර නිදහස් කරනු ලබන ද්‍රව්‍යය සාම්පල එකතු කරන ලදි. මෙම අවස්ථා දෙකෙහිම මෙම නිදහස් කරනු ලබන ද්‍රව්‍යය සාම්පල එකතු කරන ලදි. මෙම අවස්ථා දෙකෙහිම එම නිදහස් කල කාර්මික අපද්‍රව්‍යයවල අඩංගු වූ සාන්ද්‍රණ සාමාන්‍යයෙන් තිබිය යුතු අගයයන්ට වඩා ඉහල බැවින් අදාල පියවර ගැනීම සඳහා එය කර්මාන්තායතනවල පාලක මණ්ඩලවලට ඉදිරිපත් කරන ලදි.

2. නාරා/සරෙක් කරදිය පර්යේෂණ වැඩ සටහන

වෙරළාසන්න පරිසරයට දූෂ්‍ය ද්‍රව්‍ය පරිවහනය කිරීම හා සම්බන්ධ ශ්‍රී ලංකාවේ වැදගත්වන ගංගා 2ක් පිළිබඳ අධ්‍යයනය කිරීම (කැලණි හා කළු ගඟ)

කැලණි හා කළු ගඟ යන ගංගා දෙකෙහි තෝරාගන්නා ලද ස්ථාන කීපයකින්, දූෂ්‍ය ද්‍රව්‍යය ප්‍රමාණය හා ඒවායේ ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයනය සඳහා ජල සාම්පල එකතු කරන ලදි. මෙහිදී ක්ෂේත්‍ර චාරිකා 8ක් සිදු කරන ලදි. ලබාගන්නා ලද සාම්පලවල භෞත-රසායන හා ක්ෂුද්‍රජීව විද්‍යාත්මක සාධක අධ්‍යයනය කරන ලදි.

ඕගනෝ ක්ලෝරීන් කෘමිනාශක මත්ස්‍යයින්ගේ දේහ පටකවල ඇති සාන්ද්‍රණය සෙවීම සඳහා කැලණි හා කළුගඟ ප්‍රදේශවලින් මත්ස්‍ය සාම්පල එකතු කරන ලදි. විශලේශක කටයුතු නිමා කරන ලද අතර වාර්තා පිළියෙල කරමින් පවතී. මෙහිදී අධ්‍යයනය අවසාන භාගයේ ඇතිවූ වාහනයේ කාර්මික දෝෂ නිසා සාම්පල ලබාගැනීම කෙරෙහි තදින් බලපෑම් සිදුවිය.

3. පාරිසරික පාලන වැඩසටහන

මහවැලි H කලාපයේ ඇති ජලාශවල ජලයේ තත්වය කෙරෙහි කෘෂිකාර්මික දියුණුවේ බලපෑම අධ්‍යයනය කිරීම පරමාර්ථය විය.

ජලාශවල හා ඇල මාර්ගවල සාම්පල එකතු කිරීමේ කටයුතු සිදු කෙරිණ. මෙහිදී ක්ෂේත්‍ර චාරිකා 8ක් සිදුකල අතර, එක් චාරිකාවකදී සාම්පල 18ක් ලබාගන්නා ලද අතර ඒවායේ ජලයේ තත්වය පිළිබඳ අධ්‍යයනය කරන ලදි. එම වාර්තාව පිළියෙල කරමින් පවතී. මෙම වාර්තාවෙන් ලබාගන්නා ලද දත්ත තෙත් බිම් ආශ්‍රිත කමිටුවට, නාච්චදුව ජලාශ ප්‍රදේශයට තෙත් බිම් වාර්තාවක් පිළියෙල කිරීමට සපයන ලදි.

3. කොත්මලේ ජලාශයේ සුපෝෂීයතත්වය පිළිබඳ අධ්‍යයනයක් කරන ලද අතර එයින් ලබාගත් දත්ත ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික විද්‍යාත්මක සැසියේදී ඉදිරිපත් කරන ලදි.

4. දූෂණ ද්‍රව්‍යවල පැවැත්ම පිළිබඳ මූලික සංඥා ඇනගැනීම උදෙසා ජීව-පාලන තත්ව හඳුන්වා දීම
   මෙහිදී යොදාගත යුතු විශේෂ හඳුනාගන්නා අතර අදාල උපකරණවල හිඟකම පර්යේෂණ කටයුතු අතරමඟ නතර කිරීමට සිදුවිය.

5. හික්කඩුව කරදිය අභයභූමියේ ජලයේ තත්වය හා දූෂ්‍ය ද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනය
   මෙම අධ්‍යයනය නිමාකරන ලද අතර වාර්තාව 1994 මැයි මස වෙරළාසන්න සම්පත් පරිපාලන ව්‍යාපෘතිය (CRMP)ට භාරදෙන ලදි. මෙම කරදිය අභය භූමියේ ජලය දූෂ්‍යවන සාධක හඳුනාගැනීම හා දැනට පවතින ජලයේ තත්වය පිළිබඳ දත්ත ලබාගැනීම උදෙසා මෙම අධ්‍යයනය ආරම්භ කරන ලදි.

මෙම CRMP මගින් ප්‍රකාශයට පත්කරන ලද හික්කඩුව සඳහාවූ පාරිසරික පැතිකඩ වාර්තාවේ ඉහත පර්යේෂණ මගින් ලබාගත් දත්ත, නිගමන හා නිර්දේශ අඩංගු විය.

1. නාරා/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පරිපාලන වැඩසටහන
2. නාරා/සරෙක් කරදිය පර්යේෂණ වැඩසටහන
3. පාරිසරික පාලන වැඩසටහන
4. දූෂණය සොයාගැනීමේ මූලික සංඥා හඳුනාගැනීම සඳහා ජීවීන් භාවිතය
5. හික්කඩුව කරදිය අභය භූමිය ප්‍රදේශයේ ජලයේ තත්වය හා දූෂ්‍ය ද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනය

5. විවිධ ව්‍යාපෘති

5.1 ලුනාව කලපුවේ දැන් පවතින තත්වය අධ්‍යයනය

5.1 ලුනාව කලපුවේ ධීවර කර්මාන්තය හා දූෂණ ද්‍රව්‍ය පිළිබඳ අධ්‍යයනයක් සිදු කෙරිණි. මෙහිදී දැකගත හැකිවූයේ මෙම ප්‍රදේශය කාර්මිකකරණය වීම නිසා ඉතා විශාල ප්‍රමාණයක ප්‍රතිකර්ම නොකරන ලද අපද්‍රව්‍ය කලපුවට එකතුවන බවයි. මෙමගින් සකසන ලද පර්යේෂණ පත්‍රිකාවක නාරා වාර්ෂික විද්‍යාත්මක සැසියේදී ඉදිරිපත් කරන ලදි.

5.2 හම් කර්මාන්ත සඳහා නැවත ස්ථානගත කිරීම

කල්පිටිය කලපුවේ ජලයේ තත්වය පිළිබඳ අධ්‍යයනය

කර්මාන්ත අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි ඉහත සඳහන් ව්‍යාපෘතිය සඳහා පරිසර ඇගයීම් තක්සේරු වාර්තාවක් කලපුවේ ජලයේ තත්වය පිළිබඳව පිළියෙල කරන ලදි. දත්ත විශ්ලේෂණ කටයුතු සිදුවෙමින් පවතී.

5.3 පුත්තලම දිස්ත්‍රික්කයේ වෙරළාසන්න ජලජීවී වගාව නිසාවූ ආර්ථික, සමාජීය හා පාරිසරික බලපෑම් අධ්‍යයනය. මෙම ව්‍යාපෘතිය හා අදාල වන ව්‍යාපෘති යෝජනා මධ්‍යම පරිසර අධිකාරියට ඉදිරිපත්කරන ලදි. ආචාර්ය පද්මිණී ද අල්විස් මෙම ව්‍යාපෘතිය තක්සේරු කිරීමේ රැස්වීමට සහභාගී විය.

5.4 කෙරවලපිටිය බිම නැවත සැකසීමේ ව්‍යාපෘතිය

ආචාර්ය පද්මිණී ද අල්විස් හා එස්. ඒ. එම්. අස්මි මහතා කාර්මික සලකා බැලීමේ කමිටු රැස්වීම්වලට හා වැලි පුරවමින් පවතිනු ලබන ස්ථානය පරීක්ෂා කිරීමේ කටයුතුවල නියැලුණි. එම්.එච්.එස් ආරියරත්න මෙනවිය එම ස්ථානය පරීක්ෂා කරන ලදි. ආචාර්ය පත්මිණී ද අල්විස් පරිසර බලපෑම ඇගයීම් තක්සේරු රැස්වීමට සහභාගී විය.

5.5 මීගමුව මසුන් ගොඩබිමට ගෙනෙනු ලබන ස්ථානය

මීගමුව මසුන් ගොඩබානු ලබන ස්ථානය පිළිබඳව හා පාරිසරික හා අස්වනු තාක්ෂණ කටයුතු පිළිබඳ අධ්‍යයනයක් සිදුකරන ලද අතර වාර්තාව ධීවර පුහුණු ආයතනය හා බෙංගාල බොක්ක ව්‍යාපෘතියට භාරදෙන ලදි.

5.6 වෙරළ සංරක්ෂණ ප්‍රදර්ශණය - ගාල්ල

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද ප්‍රදර්ශණයේ වැඩ කටයුතු පිළියෙල කරන ලද අතර එයට සහභාගී විය.

6. අනෙක් ක්‍රියාකාරකම්

6.1 ආචාර්ය පත්මිණීද අල්විස් මිය ජෛව විවිධත්වය පිළිබඳ ජාතික විශේෂඥ කොමිටියේ රැස්වීමකට සහභාගී විය.

6.2 ජාතික තෙත් බිම් පර්යේෂණ කොමිටිය - ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය මධ්‍යම පරිසර අධිකාරියේ පැවති මෙම රැස්වීම් වලට සහභාගී වූ අතර එහිදී නාච්චදූව ජලාශය පිළිබඳ අපනයනය කටයුතු පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලදි.

6.3 ජලයේ තත්වය පිළිබඳ පාලනය අධ්‍යයනයට ජාතික සංරක්ෂණ උපාය මාර්ග හා සම්බන්ධ සංරක්ෂණ ක්‍රියාකාරී සැලැස්මක් සහිත ඉතා කෙටි ව්‍යාපෘති යෝජනා පිළියෙල කරන ලද අතර එය පරිසර අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අදාල ප්‍රදානය කරන ආයතනයට ඉදිරිපත් කරන ලදි.

6.4 UNDP/පරිසර අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද "පාරිසරික තොරතුරු පද්ධතිය "ඉන්පොටෙරා" යන මැයෙන් වූ දේශණයකට එස්.ඒ.එම්. අස්මි මහතා සහභාගී විය.

6.5 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික විද්‍යාත්මක සැසිය (50 වන සංවත්සරය)

ආචාර්ය පද්මිණී ද අල්විස් හා එස්.ඒ.එම්. අස්මි මහතා විසින් කොත්මලේ ජලාශයේ සුපෝෂියතත්වය යන මැයෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

6.6 නාරා වාර්ෂික විද්‍යාත්මක සැසිය 1994

මෙහිදී වාචික පර්යේෂන පත්‍රිකා දෙකක්ද, විද්‍යාත්මක පෝස්ටරයක්ද ඉදිරිපත් කරන ලදි. තවත් පර්යේෂණ පත්‍රිකාවක් සමුද්‍ර විද්‍යා අංශය සමඟ ඒකාබද්ධව ඉදිරිපත් කරන ලදි.

6.7 ජා ඇල ඒකල ප්‍රදේශයේ කාර්මික අපද්‍රව්‍ය ප්‍රතිකර්ම කිරීම සඳහා ස්ථානයක් පිහිටුවීමට ඇති හැකියාව පිළිබඳ සොයාබැලීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පැවති ඉහත රැස්වීමට ආචාර්ය පද්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

6.8 නරෙප් කමිටු රැස්වීම

පාර්ලිමේන්තු කටයුතු හා පාරිසරික අමාත්‍යාංශයේ පැවති මෙම රැස්වීම්වලට ආචාර්ය පත්මිණී ද අල්විස් හා එන්. එච්. දසනායක මහතා සහභාගී විය.

6.9 වෙරළාසන්න සම්පත් පරිපාලන කොමිටි රැස්වීම
ආචාර්ය පද්මිණී ද අල්විස් මෙනවිය හික්කඩුව ප්‍රාදේශීය කාර්යාලයේ පැවති රැස්වීමට සහභාගී වූ අතර මෙම ප්‍රදේශයේ දූෂණය පිළිබඳ අදහස් ඉදිරිපත් කරන ලදී.

6.10 මීගමුව මෝරවල ප්‍රදේශයේ ධීවර වරාය සංවර්ධන සඳහාවූ සාකච්ඡාවකට සහභාගී විය.

6.11 මධ්‍යම පරිසර අධිකාරියේ පැවති ජලයේ තත්වය පිළිබඳ මූලික දත්ත පිළිබඳ රැස්වීමකට ආචාර්ය පත්මිණී ද අල්විස් සහභාගී විය.

6.12 ස්ථාන පරීක්ෂා කටයුතු - ගල් අඟුරු බලාගාරය - එස්. ඒ.එම්. අස්මි මහතා යෝජිත තලවිල ප්‍රදේශයේ පර්යේෂණ චාරිකාවකට සහභාගී විය.

6.13 ආචාර්ය පත්මිණී ද අල්විස් පාරිසිරික බලපෑම් තක්සේරු සඳහා වූ කාර්මික කමිටු රැස්වීමකට සහභාගී විය.

7.0 වැඩමුළු/දේශන

7.1 ශ්‍රී ලංකා පාරිසරික ක්‍රියාකාරී සැලසුම නැවත සලකා බැලීම
මෙයට ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

7.2 කාර්මික දූෂණය පාලනය සඳහා මූලික ක්‍රියාමාර්ග ශක්තිමත් කිරිම
ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

7.3 තෙත් බිම් සංරක්ෂණය
මධ්‍යම පරිසර අධිකාරියේ පැවති මෙම රැස්වීමට ආචාර්ය පද්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

7.4 න්‍යෂ්ටික බලය හා ශක්තිය සැලසුම් කිරිම - පරමාණු බලශක්ති අධිකාරිය
ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

7.5 පාරිසරික දූෂණයවීම හා එය ධීවර පරිපාලනය කෙරෙහි බලපෑම - ලුනාව කලපුව යන මැයෙන් වූ වැඩ මුළුවකට ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී වී පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

7.6 ශ්‍රී ලංකා ජෛව - විවිධත්වයේ වර්තමාන තත්වය යන මැයෙන් ප්‍රවාහන මහාමාර්ග පාරිසරික හා වනිතා කටයුතු අමාත්‍යාංශය සංවිධානය කල දේශණයකට ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

7.7 පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ අපක්‍රම
පේරාදෙණිය, පරිසර පාලනය සඳහා මධ්‍යස්ථානයේ පැවති දේශණයකට එස්.ඒ.එම්. අස්මි මහතා සහභාගී විය.

7.8 පරමාණු බලශක්ති අධිකාරිය මගින් සංවිධානය කරන ලද Tracer techniques යන මැයෙන්වූ දේශණයට එස්.ඒ.එම්. අස්මි මහතා සහභාගී විය.

7.9 පුත්තලම කලපු අධ්‍යයනය පිළිබඳ වැඩ මුළුව
මෙයට ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය දේශණයක් පැවැත්විය.

7.10 බොල්ගොඩ වැවෙහි පාරිසරික සේවාවේ ආර්ථික ඇගයීම - ආචාර්ය පත්මිණී ද අල්විස් මෙනවිය සහභාගී විය.

# අවසාන ගිණුම්
# 1994

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන**
**නියෝජිතායතනය**
කාක දූපත, මට්ටක්කුලිය,
කොළඹ 15.

# ජාතික ජලජ සම්පත් නියෝජිතායතනය
## 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් පිළිබඳ ගිණුම්

| 1993 | | | 1994 | |
|---|---|---|---|---|
| 22,500,000 | රජයේ දායක මුදල | | 23,000,000.00 | |
| 1,383,420 | විවිධ ආදායම් | | 2,822,807.12 | |
| 14,606,143 | වෙනත් ආදායම් | | 6,161,994.12 | |
| 781,414 | දායක මුදල | | 18,710,166.49 | |
| | විකුණුම් ප්‍රතිලාභ | | 12,714.45 | |
| 40,250,760 | | | | |
| | පරිපාලන වියදම් | | | |
| 13,910,218 | වැටුප් හා දීමනා | 14,494,143.24 | | 50,707,682.18 |
| 782,246 | පාරිතෝෂික වෙන් කිරීම් | 712,002.20 | | |
| 1,957,808 | සේවක අර්ථසාධක අරමුදල | 2.191,795.26 | | |
| 1,672,241 | අතිකාල | 1,336,487.61 | | |
| | ගමන් වියදම් | | | |
| 1,054,155 | ආරක්ෂක වියදම් | 709,221.73 | | |
| 589,650 | | 705,147.74 | | |
| | | 77,746.00 | | |
| 136,250 | ගාස්තු | 151,484.39 | | |
| 1,145,076 | සම්මන්ත්‍රණ හා රැස්වීම් වියදම් | 860,233.70 | | |
| | ඉන්ධන | | | |
| 344,953 | දැන්වීම් | 184,890.00 | | |
| 589,974 | ලිපි ද්‍රව්‍ය | 573,305.92 | | |
| 52,405 | තැපැල් | 113,478.97 | | |
| 87,717 | සංග්‍රහ | 97,074.80 | | |
| 42,219 | සුභ සාධක | 29,117.43 | | |
| 297,920 | දුරකතන | 180,908.12 | | |
| | විදේශීය ගමන් | | | |
| 284,145 | විවිධ සේවාවන් | 115,983.75 | | |
| 184,578 | රක්ෂණය | 143,931.17 | | |
| 431,946 | මෝටර් රථ ගොඩනැගිලි හා | 43,866.68 | | |
| 2,955,973 | වෙනත් වාහන | 3,763,603.31 | | |
| 55,000 | විගණන ගාස්තු | 55,000.00 | | |
| 27,362 | බැංකු ගාස්තු | 27,763.06 | | |
| 75,122 | රසායන හා පාරිභෝගික භාණ්ඩ | 14,740.50 | | |
| 44,450 | මුද්‍රණ | 93,439.00 | | |
| | බොල් ණය | 984,066.25 | | |
| 613,678 | විශේෂ ව්‍යාපෘති ගාස්තු | - | | |
| 979,782 | සනීපාරක්ෂක භාණ්ඩ | 6,161,994.12 | | |
| 92,874 | | - | | |
| 28,407,741 | | | | |
| | ආයතන වියදම් | | | |
| | විදුලි බලය | | | |
| 1,944,017 | ගෑස් | 2,625,860.39 | | |
| 29,820 | බදු වරිපනම් | - | | |
| 673,675 | ක්ෂයවීම් සඳහා වෙන් කිරීම් | 672,000.00 | | |
| 19,601,808 | | 25,063,476.78 | | |
| 22,249,320 | | -- | 28,361,337.17 | 62,582,750.62 |
| | ආදායමට වැඩි වියදම් | | | |
| (10,406,301) | පසුගිය වර්ෂය සඳහා හරිගැස්වීම් | | | (11,875,068.44) |
| (1,565,559) | | | | 708,717.16 |
| (11,971,860) | ඉදිරියට ගෙන ආ ශේෂය | | | (11,166,351.28 |

## ජාතික ජලජ සම්පත් නියෙ!ජිතායතනය
## 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ශේෂ පත්‍රය

| 1993 | | | 1994 | |
|---|---|---|---|---|
| 86,721,658 | ගතවූ වර්ෂයේ ශේෂය ඉදිරියට | | | 78,160,404.33 |
| 10,505,000 | ආධාර | | | 14,470,000.00 |
| 6,595,315 | විදේශාධාර | | | 4,450,682.20 |
| 3,023 | දේශීය ආධාර | | | 2,522,689.00 |
| (11,971,860) | ආදායමට වැඩි වියදම් අතිරික්තය | | | (11,166,351.28) |
| 91,853,136 | | | | 88,437,424 30 |
| | ස්ථිර වත්කම් | | | |
| 3,873,159 | ගොඩනැගිලි | | 8,159,053.40 | |
| 1,463,824 | යන්ත්‍ර උපකරණ | | 1,102,150.86 | |
| 4,832,976 | උපකරණ | | 9,365,197.33 | |
| 607,053 | වාහන | | 357,404.47 | |
| 10,863 | බයිසිකල් | | 198,071.00 | |
| 1,282,489 | ලී බඩු | | 1,636,380.60 | |
| 348,376 | ශ්‍රවණාගාරය | | 285,219.86 | |
| 149,957 | ප්‍රධාන පොකුණ | | 129,122.97 | |
| 814,107 | පුස්තකාල පොත් | | 1,147,146.50 | |
| - | සිතියම් | | 5,788.00 | |
| 5,565,397 | පර්යේෂණ හා සංවර්ධන (දේශීය) | | 7,798,230.92 | |
| 64,57,490 | පර්යේෂණ හා සංවර්ධන (විදේශීය) | | 48,512,062.92 | |
| 15,496,122 | සමුද්‍ර මාරු | | 17,162,276.71 | |
| 98,961,813 | | | | |
| | ප්‍රවර්තන වත්කම් | | | |
| 563,014 | තොග | 746,137.08 | | |
| 2,703,565 | ණයකරුවෝ | 773,169.13 | | |
| 242,215 | තැන්පතු | 166,715.00 | | |
| 1,152,272 | අත්තිකාරම් | 45,737.76 | | |
| 1,838,062 | ණයකරු සේවකයන් | 1,917,027.67 | | |
| 5,363,425 | බැංකුව සහ මුදල | 4,744,234.79 | | 96,038,106.03 |
| 11,862,553 | | | 8,411,021.43 | |
| | ප්‍රවර්තන වියදම් | | | |
| 7,568,743 | ණය හිමියන් හා එකතුව | 11,373,873.24 | | |
| 5,748,328 | ව්‍යාපෘති ණය මගින් | 419,085.72 | | |
| 3,788,222 | | 254,600.00 | | |
| 1,865,937 | උපදේශක ව්‍යාපෘති | - | | |
| 18,971,230 | දළ ප්‍රවර්තන වියදම් | | 12,047,518.96 | |
| (7,108,677) | | | | (3,636,537.58) |
| - | | | | (3,964,144.20) |
| 91,853,136 | | | | 88,437,424 30 |

එම්.එච්. ගුණවර්ධන
සභාපති

15 අගෝස්තු 1995

ආචාර්ය එම්.ශූ. ජයසේකර
අධ්‍යක්ෂ ජනරාල්

15 අගෝස්තු 1995

යසපාල සමරරත්න
ගණකාධිකාරි

15 අගෝස්තු 1995

දුරකථනය
தொலைபேசி
Telephone } 691151

ෆැක්ස් අංකය
பக்ஸ் இல.
Fax No. } 697451

මගේ අංකය
எனது இல.
My No. } විඑම්/ජේ/තාරා/01/95

ඔබේ අංකය
உமது இல.
Your No. }

විගණකාධිපති දෙපාර්තමේන්තුව
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7, ශ්‍රී ලංකාව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
சுதந்திர சதுக்கம், கொழும்பு 7, இலங்கை
AUDITOR-GENERAL'S DEPARTMENT
INDEPENDENCE SQUARE, COLOMBO 7, SRI LANKA

දිනය/திகதி/Date : 1996 අගෝස්තු 02 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය කරගෙන යාමේදී ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින ගණකාධිකාරී සමාගමක් මට සහාය විය. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තර වාර්තාවක් 1995 දෙසැම්බර් 27 දින නියෝජිතායතනයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

1:2. විගණන විෂය පථය

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය නිරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. ගිණුම්

### 2:1 විගණන මතය

මෙම වාර්තාවේ දැක්වෙන මාගේ නිරීක්ෂණයන් හේතුකොට ගෙන ඉදිරිපත් කරන ලද ගිණුම් පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය. මේ පිළිබඳව නිරීක්ෂණය වූ ප්‍රධාන අඩුපාඩු වගු කොට පහත දැක්වේ.

| | අඩුපාඩුව | වාර්තාවේ ඡේදයට යොමුව |
|---|---|---|
| (අ) | ගණකාධිකරණ ප්‍රතිපත්ති | 2:5:1 |
| (ආ) | ගිණුම්වල අනුචිත හෙළිදරව් කිරීම් | 2:5:2 |
| (ඇ) | ගිණුම්වලින් අත්හැරීම් | 2:5:3 |
| (ඈ) | ගිණුම්වල වූ වැඩියෙන් සහ අඩුවෙන් දැක්වීම් | 2:5:4 |
| (ඉ) | ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම් | 2:5:5 |
| (ඊ) | විගණනය සඳහා සාක්ෂි නොවීම | 2:5:6 |
| (උ) | නීති, රීති, රෙගුලාසි, කළමණාකරණ තීරණ ආදියට අනුකූල නොවීම | 2:5:7 |
| (ඌ) | ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | 2:5:8 |
| (එ) | මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය කෙරෙහි විශ්වාසය තැබිය නොහැකිවීම | 3:1 |
| (ඒ) | පද්ධති හා පාලන දුර්වලතා | 4 |

## 2:2. මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, සමාලෝචිත වර්ෂය තුල නියෝජිතායතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රු: 11,875,069 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌණතාවය රු: 10,406,301 ක් විය. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ සාරාංශයක් පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1994 | | 1993 | |
| | රු. | රු. | රු. | රු. |
| **ආදායම** | | | | |
| රජයේ දායකය | 23,000,000 | | 22,500,000 | |
| විවිධ ආදායම් | 2,822,807 | | 1,383,421 | |
| ලැබුණු ප්‍රදානයන්(ක්‍රමක්ෂය) | 18,710,166 | | 14,606,143 | |
| වත්කම් විකිණීමෙන් ලාභය | 12,714 | 44,545,687 | 781,414 | 39,270,978 |
| **වියදම** | | | | |
| පරිපාලන | 34,221,413 | | 28,407,741 | |
| ආයතන | 3,297,860 | | 2,647,512 | |
| ක්ෂය | 25,063,477 | | 19,601,808 | |
| | 62,582,750 | | 50,657,061 | |
| **අඩුකළා:** | | | | |
| ව්‍යාපෘතිවලින් අයකර ගත් මුදල | 6,161,994 | 56,420,756 | 979,782 | 49,677,279 |
| වර්ෂය සඳහා ඌණතාවය | | (11,875,069) | | (10,406,301) |
| ඉදිරියට ගෙනා සමුච්චිත ඌණතාවය | ( 92,615,655) | | (65,914,604) | |
| ඉකුත් කාලපරිච්ඡේදවල විෂයයන් | (12,984,015) | (105,599,670) | (16,294,750) | (82,209,354) |
| ඉදිරියට ගෙනගිය සමුච්චිත ඌණතාවය | | (117,474,739) | | ( 92,615,655) |

## 2:3. මූල්‍ය ව්‍යුහය

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, නියෝජිතායතනයේ 1994 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ව්‍යුහය 1993 දෙසැම්බර් 31 දිනට පැවති තත්ත්වය සමඟ සසඳා පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | | | |
|---|---|---|---|---|
| | 1994 | | 1993 | |
| | රු. | රු. | රු. | රු. |
| **සම්පත්** | | | | |
| රජයේ දායකය | | 95,813,380 | | 81,343,380 |
| විදේශාධාර | 100,547,427 | | 96,096,746 | |
| විශේෂ ඩොලර් ගිණුම් ශේෂයට කරන ලද ගැලපීම් | ( 8,853,775) | 91,693,652 | ( 8,853,775) | 87,242,971 |
| වෙනත් දායකයන් | | 18,405,129 | | 15,882,440 |
| | | 205,912,161 | | 184,468,791 |
| සමුච්චිත ඌණතාවය | | (117,474,739) | | ( 92,615,655) |
| | | 88,437,422 | | 91,853,136 |
| **උපයෝජනය** | | | | |
| ස්ථාවර වත්කම් ලියා අඩුකළ වටිනාකමට | | 22,385,535 | | 13,382,804 |
| " සමුද්‍ර මාරු "නැව | | 17,162,276 | | 15,496,122 |
| විදේශාධාර ව්‍යාපෘති (ශුද්ධ) | | 48,512,063 | | 64,517,490 |
| වෙනත් ව්‍යාපෘති (ශුද්ධ) | | 7,978,231 | | 5,565,397 |
| ශුද්ධ ජංගම බැරකම් | | ( 7,600,683) | | ( 7,108,677) |
| | | 88,437,422 | | 91,853,136 |

## 2:4. අරමුදල් ප්‍රභවය සහ යෙදවීම.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය තුල නියෝජිතායතනයේ අරමුදල් ප්‍රභවය සහ යෙදවීම පහත සඳහන් ප්‍රකාශයෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 1994 | | 1993 | |
| | රු. | රු. තැත | රු. | රු. තැත |
| **ප්‍රභවය** | | | | |
| **වෙනත් ප්‍රභවයන්** | | | | |
| රජයේ දායකය | 14,470,000 | | 10,505,000 | |
| විදේශාධාර | 4,450,681 | | 6,595,315 | |
| අනෙකුත් ප්‍රාග්ධන දායකය | 2,522,689 | | 3,023 | |
| ස්ථාවර වත්කම් අපහරණයෙන් ලත් මුදල් | 25,774 | 21,469,144 | 875,489 | 17,978,827 |
| **යෙදවීම්** | | | | |
| වර්ෂය සඳහා ඌණතාවය | (11,875,069) | | (10,406,301) | |
| **අරමුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් සඳහා ගැලපීම්** | | | | |
| වර්ෂය සඳහා ප්‍රතිපාදනය කරන ලද පාරිතෝෂික | 712,002 | | 782,245 | |
| ක්ෂය – ස්ථාවර වත්කම් | 5,883,803 | | 4,748,331 | |
| – ව්‍යාපෘති වියදම් | 19,179,674 | | 14,853,477 | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය | (12,714) | | (781,414) | |
| | 13,887,696 | | 9,196,338 | |
| ඉකුත් කාලපරිච්ඡේදවල විෂයයන් | (12,984,015) | | (16,294,750) | |
| **අරමුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයයන් සඳහා ගැලපීම** | | | | |
| ස්ථාවර වත්කම්වලට ගැලපීම් | 146,501 | | 1,080,000 | |
| | 1,050,182 | | ( 6,018,412) | |
| පාරිතෝෂික ගෙවීම් | (187,421) | | (127,401) | |
| ස්ථාවර වත්කම්වලට එකතුවීම් | (14,815,166) | | ( 6,827,140) | |
| ස්ථාවර වත්කම්වලට කරන ලද ගැලපීම් | 251,128 | | 1,850 | |
| විදේශාධාර ව්‍යාපෘතිවල වියදම් වැඩිවීම | ( 3,735,834) | | ( 9,800,866) | |
| වෙනත් ව්‍යාපෘතිවල වියදම් වැඩිවීම | ( 3,999,458) | (21,436,569) | ( 1,023,994) | (23,795,963) |
| පහත විග්‍රහ කෙරෙන පරිදි කාරක ප්‍රාග්ධනයේ අඩුවීම | | 32,575 | | ( 5,817,136) |

කාරක ප්‍රාග්ධනය කෙරෙහි බලපෑම

වැඩිවීම/(අඩුවීම)

| | 1994 | 1993 |
|---|---|---|
| | රු. | රු. |
| බොල් ණය සඳහා වෙන්කිරීම | 94,059 | - - |
| තොග | 201,123 | (114,124) |
| ණයගැතියෝ | (1,930,396) | 1,017,615 |
| අත්තිකාරම් | (1,106,535) | (483,664) |
| ලැබියයුතු කාර්ය මණ්ඩල ණය | 78,966 | 141,165 |
| මුදල් සහ බැංකු ශේෂ | (619,191) | (3,807,717) |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | (3,805,130) | (108,778) |
| උපදේශක සේවා ව්‍යාපෘති | 1,865,937 | 7,924 |
| ව්‍යාපෘති ණයහිමියෝ | 5,329,242 | (2,469,557) |
| තැන්පතු | (75,500) | - |
| | 32,575 | (5,817,136) |

2:5. ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම්.

2:5:1 ගණකාධිකරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂපත්‍රයෙහි අනාවරනය කරන ලද ස්ථාවර වත්කම් සහ තොග වටිනාකම වූ පිළිවෙලින් රු.96,038,106 සහ රු.764,137 න් පොත් ශේෂයන් නියෝජනය විය.

(ආ) වර්ෂය සඳහා ආදායමක්වශයෙන් දක්වන ලද රු.18,710,166 ක මුදල පොත් සටහනකින් නියෝජනය විය. එය විදේශ අරමුදල් සපයන ලද ව්‍යාපෘති මත ඉකුත් වර්ෂ සඳහා ක්‍රමක්ෂය වෙනුවෙන් කරන ලද ප්‍රතිපාදනවලට සමාන වූ ප්‍රදාන ලැබීම්ව ප්‍රාග්ධන බන්ධය ආපසු ලියා හැරීමෙන්(රු . 17,510,166) සහ 'සමුද්‍ර මාරු' නැව සඳහා ක්ෂය (රු.1,200,000) එකතුවෙන් සෑදී තිබුණි. ඉකුත් වර්ෂයේ ලද ප්‍රදාන ප්‍රවර්තන වර්ෂය සඳහා වූ ආදායමක් ලෙස නොදැක්විය.

(ඇ) දීර්ඝකාලීන කොන්ත්‍රාත්තුවල වූ කෙරීගෙන යන වැඩ 1994 දෙසැම්බර් 31 දිනට අගය කර නොතිබුණි. ගණුදෙනුකරුවන්ගෙන් ලැබීම්වලට එරෙහිව දරන ලද පිරිවැය හිලව් කර අතිරික්තය/ඌණතාවය, ණයහිමියෝ/ණයගැතියෝ යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ එකතුව රු:56,490,294 ක ව්‍යාපෘති වියදම් ස්ථාවර වත්කම් ලෙස එනම්, විදේශාධාර ව්‍යාපෘති යටතේ රු:48,512,063 ක් සහ අනෙකුත් ප්‍රාග්ධන ව්‍යාපෘති යටතේ රු:7,978,231 ක් ලෙස දක්වා තිබුණි. ස්පෘශ්‍ය වත්කම් සහ අස්පෘශ්‍ය වියදම් යන දෙකෙන්ම ව්‍යාපෘති වියදම් යුක්ත විය. ස්පෘශ්‍ය සංරචක ගැන නොසළකා ව්‍යාපෘති වියදම් සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැයෙන් 20% කට ක්‍රමක්ෂය කර තිබුණි. එසේ ක්‍රමක්ෂය කිරීම වෙනුවෙන් ප්‍රතිපාදනය කළ මුදල රු: 19,179,674 ක් විය.

(ඉ) පරිගණක සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය මත පිරිවැයෙන් 10% ක් ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි. මෙම ප්‍රමාණය පොදු සම්මත ප්‍රමාණය හා එකඟ නොවිය.

(ඊ) සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය කිරීමට යොදාගනු ලැබූ පදනම ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 16 ට අනුකූල නොවිය.

## 2:5:2. ගිණුම්වල වූ අනුචිත හෙළිදරව් කිරීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු:764,137 ක් වූ පොගවල අයහාර විෂයයන් හා ලැබිය යුතු අත්තිකාරම් ඇතුළත් වී තිබුණි. එබැවින් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති/5 ට අනුකූල වන පරිදි තොගය අගය කර නොතිබුණි.

(ආ) රු,2,902,650 ක් වූ ලැබියයුතු මුදල්වලින් උපලබ්ධි විය හැකි අගයැ නියෝජනය නොවිය.

(ඇ) සඟරාවක් සඳහා ගෙවන ලද වාර්ෂික දායක මුදල වූ රු:4,200 එම සඟරාව වර්ෂය තුළදී ලැබී නොතිබුණ නමුත්, ප්‍රාග්ධන ගත කර තිබුණි.

(ඈ) පුහුණු සංගමය වෙත ලබා දෙන ලද රු:50,000 ක අත්තිකාරම් මුදල ලැබියයුතු මුදලක් ලෙස ගිණුම්වල දක්වා නොතිබුණි.

## 2:5:3. ගිණුම්වල වූ අත්හැරීම්.

පහත සඳහන් අත්හැරීම් නිරීක්ෂණය විය.

(අ) නියෝජිතායතනය 1981 දී පිහිටුවූ විට එයට ධීවර අමාත්‍යාංශයේ කලින් පැවති ධීවර තාක්ෂණ අංශයෙන් මාරු කරන ලද වත්කම්, පනතේ නියමයන් යටතේ අත්පත් කර ගැනීමෙන් පසු අගය කර ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) කොළඹ මහ නගර සභාවට 1994 දෙසැම්බර් 31 දින දක්වා ගෙවියයුතු වරිපනම් බදු රු:4,927,830 ක් වූ අතර රු:2,463,915 ක් වූ දඩ ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදලේ දායක මුදල් ප්‍රේෂණය කිරීමේ සැලකිය යුතු ප්‍රමාදයක් තිබූ නමුත් දඩ සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ඈ) 1993 මාර්තු මාසයේදී ව්‍යාපෘති සමායෝජක විසින් දේශීයව මිළට ගත් කුඩා බෝට්ටුවක් අගය කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඉ) 1994 දී පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත් 75 ක් වටිනාකම අගය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඊ) ආයතනයක් විසින් තැන්පතුවක රඳවාගෙන තිබූ රු.30,000 ක මුදල අදාල පාර්ශවය විසින් සතාට කර තිබූ අතර එය ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) නියෝජිතායතනය විසින් දෙනු ලද අත්තිකාරම්වලින් පවත්වාගෙන යන " සුපුන්සල " සුභසාධක සංගමයේ සමාලෝචිත වර්ෂයේ වෙළඳ ප්‍රතිඵල ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

(ඌ) රු.266,700 ක් වටිනා ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණු වීඩියෝ කැසට් යන්ත්‍රයක් වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(එ) වර්ෂය තුළදී පුස්තකාලයෙන් නැතිවූ පුස්තකාල පොත් 357 ක් වෙනුවෙන් ගැලපීම් සිදුකර නොතිබුණි.

## 2:5:4. ගිණුම්වලවූ වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම්.

පහත සඳහන් වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම් නිරීක්ෂණය විය.

(අ) 1994 ජනවාරි 01 දිනට ස්ථාවර වත්කම් ශේෂය රු.349,650 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 1994 ජනවාරි 01 දිනට වූ සමුච්චිත ක්ෂය ශේෂය රු.34,965 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) පර්යේෂණ හා සංවර්ධන (විදේශ අරමුදල් සපයන ලද ව්‍යාපෘති) මත වූ ක්ෂය රු.9,999 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ජාතික ජල විද්‍යා කාර්යාලයේ ජංගම ගිණුම් ශේෂය රු.219,991 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ජාතික ජල විද්‍යා කාර්යාලයේ පෙර වර්ෂය සඳහා වූ ගැලපුම් ගිණුමේ ශේෂය රු.91,016 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2:5:5. ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවති රු:76,842 ක් වූ වැටුප් අත්තිකාරම් සහ ගමන් වියදම් අත්තිකාරම්වල ඇතුලත් රු:33,277 ක් අවුරුදු එක සිට හතර දක්වා විහිදි කාල පරිච්ඡේදයක් හිඟව පැවතුණි.

(ආ) පිළිවෙලින් එකතුව රු:773,169 , රු:153,415 සහ රු:45,738 ක් වූ ණයගැතියෝ, තැන්පතු සහ අත්තිකාරම් ශේෂ කිසිවක් සනාථ කර නොතිබුණි.

(ඇ) බැංකු දෙකකට අදාළ රු:1,516,099 ක් වූ ශේෂයන් සඳහා සනාථ කිරීම් ලැබී නොතිබුණි.

(ඈ) ශේෂයන්ගේ මුළු එකතුව රු:11,792,959 ක් වූ ණයහිමියන් 157 ක් වෙනුවෙන් කිසිවෙකුගෙන් ශේෂ සනාථ කිරීමක් ලැබී නොතිබුණි.

(ඉ) 1991 සිට 1994 කාලපරිච්ඡේදය තුළ කාර්ය මණ්ඩලය වෙත ලබාදෙන ලද එකතුව රු:133,777 ක් වූ සුළු මුදල් අත්තිකාරම් 1994 වර්ෂය අවසානය දක්වා පියවා නොතිබුණි.

(ඊ) ණයගැතියෝ, තැන්පතු සහ අත්තිකාරම් ශේෂවලින් එකතුව රු: 322,491 ක් සහ රු:103,965 ක් පිළිවෙලින් අවුරුදු එක සිට පහ දක්වා විහිදි කාලපරිච්ඡේදයක් සහ අවුරුදු පහකට වැඩි කාලයක් හිඟව පැවතුණි.

(උ) ණයහිමියන්ගේ ශේෂවලින් රු:11,614,099 ක් හා රු:6,887,091 ක් පිළිවෙලින් අවුරුදු එක සිට පහ දක්වා සහ අවුරුදු පහකට වැඩි විහිදි කාලපරිච්ඡේදයක් හිඟව පැවතුණි.

(ඌ) ණය දිගු කාලයක් හිඟව පැවතීමේ බලපෑම ගැන බලනවිට බොල් ණය සඳහා ප්‍රතිපාදනය කරන ලද රු:254,600 ප්‍රමාණවත් යයි සැලකිය නොහැකි විය.

### 2:5:6. විගණනය සඳහා සාක්ෂි නොවීම.

ගිණුම්වල වූ පහත සඳහන් විෂයයන් ඒ එකිනෙක විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම<br>රු. | ලබාගැනීමට නොතිබුණ සාක්ෂි |
|---|---|---|
| (අ) ස්ථාවර වත්කම් (පර්යේෂණ හා සංවර්ධන හැර) | 39,547,812 | (I) ස්ථාවර වත්කම් ලේඛනය<br>(II) සමීක්ෂණ මණ්ඩල වාර්තා |

| | | | |
|---|---|---|---|
| (ආ) | පර්යේෂණ හා සංවර්ධන වියදම් | 56,490,294 | (I) ස්ථාවර වත්කම් ලේඛනය.<br>(II) ව්‍යාපෘති වියදම් ලේඛනය.<br>(III) සමීක්ෂණ වාර්තා. |
| (ඇ) | පාරිභෝජ්‍ය තොග | 764,137 | සමීක්ෂණ වාර්තා |
| (ඈ) | කාර්ය මණ්ඩලයට සුළු මුදල් අත්තිකාරම් | 133,777 | සුළු මුදල් අත්තිකාරම් ලේඛනය. |
| (ඉ) | ණයගැතියෝ | 579,239 | } සෘජු සනාථ කිරීම් |
| (ඊ) | ණයහිමියෝ | 11,792,959 | } |
| (උ) | විදේශාධාර - ප්‍රදාන | 2,910,000 | ස්ථාවර වත්කම් ලේඛනය. |
| (ඌ) | වෙනත් ප්‍රාග්ධන ව්‍යාපෘති | 12,210,554 | විස්තරාත්මක උපලේඛන |
| (එ) | ගමන් වියදම් අත්තිකාරම් | 57,980 | - එම - |
| (ඒ) | ගෙවීම් | 86,311 | ගෙවීම් වවුචර් අටක් |
| (ඔ) | තැන්පතු | 166,715 | සෘජු සනාථ කිරීම |
| (ඕ) | බැංකු ශේෂ | 1,516,099 | සනාථ කිරීම් |
| (ක) | බොල් ණය සඳහා ප්‍රතිපාදන | 254,600 | ගණනය කිරීමේ පදනම |
| (ග) | මිළදී ගැනීම් | 342,927 | භාණ්ඩ ලැබීම් පත්‍රිකා |
| (ච) | මිළදී ගැනීම් අත්තිකාරම් | 45,738 | සනාථ කිරීම් |
| (ජ) | සේවක අර්ථසාධක අරමුදල් වගකීම | 1,191,647 | විස්තරාත්මක උපලේඛන |
| (ට) | සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය | 3,964,144 | ගණනය කිරීමේ විස්තර. |

2:5:7. <u>නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම.</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි, කළමණාකරණ තීරණ යනාදියට යොමුව | විස්තර |
|---|---|
| (අ) <u>මුදල් පනත</u> | |
| (I) 12 වගන්තිය | වාර්ෂික ගිණුම්වල ආකෘතිය හා අඩංගු විය යුතු දෑ සඳහා අදාළ අමාත්‍යවරුන්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

(II) 13 (5) (ඕ) වගන්තිය — තොග, ගබඩා භාණ්ඩ, ණයගැතියෝ සහ ණයහිමියෝ පිළිබඳ වාර්තා ගිණුම් සමග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(III) 13 (5) (ඩී) වගන්තිය — විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර නොතිබුණු අතර නියම කර ඇති ආකාරයට 1994 වර්ෂය සඳහා අර්ධ වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(IV) 13(6) වගන්තිය — විගණකාධිපති විසින් නියම කර ඇති පරිදි ගිණුම් පිළිබඳ වාර්තාව ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි.

(V) 14(1) වගන්තිය — මුදල් වර්ෂය අවසානවීමෙන් පසු මාස 4 ක් තුළ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතේ පිටපතක් ඉදිරිපත් කර නොතිබුණි.

(VI) 14(3) වගන්තිය — 1991, 1992 සහ 1993 වර්ෂ සඳහා වූ ගිණුම් පිළිබඳ වාර්ෂික වාර්තා 1995 ජුනි 30 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ආ) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනත.

(I) 32(2) වගන්තිය — වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ නිසි ගිණුම් පොත් තබා නොතිබුණි.

(II) 10(1) වගන්තිය — පාලක මණ්ඩලය අඩුම වශයෙන් මාසයකට වරක්වත් රැස්විය යුතු නමුත් 1994 අගෝස්තු 23 දින සිට 1995 ජුනි 30 දින දක්වා රැස්වීම් පවත්වා නොතිබුණි.

(ඇ) පරිපාටි සංග්‍රහය

(I) 5 ඡේදය — විය පැහැදම් වලට අදාලව පහත සඳහන් ක්‍රියාකාරකම් හඳුනාගෙන බලය පැවරීම් කර නොතිබුණි.

- බලයදීම.
- අනුමැතිය.
- සහතික කිරීම.
- ගෙවීම.

(II) 7 ඡේදය — නියම කර ඇති පරිදි තැන්පතු ලෙජරය සහ වැය ලෙජරය තබා නොතිබුණි.

(III) 13 ඡේදය — භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පවත්වා නොතිබුණි.

(ඇ) <u>මුදල් රෙගුලාසි</u>

| | |
|---|---|
| (1) අංක 1646 | සමාලෝචිත වර්ෂයට අදාල /වාහනවල දෛනික ධාවන සටහන් හා මාසික කාර්ය සාධන සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු නමුත් [illegible] එම වාර්තා 1996 ජනවාරි 31 දින දක්වාත් ඉදිරිපත් කර නොතිබුණි. |

(ඉ) <u>භාණ්ඩාගාර චක්‍රලේඛය</u>

| | |
|---|---|
| 1978 දෙසැම්බර් 19 දින අංක 842 දරන | ස්ථාවර වත්කම් ලේඛන ලියා තබා නොතිබුණි. |

(ඊ) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය</u>

| | |
|---|---|
| 1984 අගෝස්තු 15 දින අංක 264 දරන | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන නියෝජිතායතනයේ ගණකාධිකාරී විසින් නියෝජිතායතනයේ වාහන පෞද්ගලික කටයුතු සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි. |

2:5:8. <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

පහත සඳහන් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ගෙවීම් වවුචරයක් සම්පූර්ණවීමට අත්සන් හතක් අවශ්‍ය වුවත් වවුචර්වල ඒවා පිළියෙල කළ නිලධාරියාගේ සහ ගණකාධිකාරීගේ අත්සන් පමණක් දක්නට ලැබුණි.

(ආ) වර්ෂය තුළදී රු:279,189 ක පිරිවැයකට පරිගණක තුනක්, මුද්‍රණයන්ත්‍ර තුනක් හා මුද්‍රණ යන්ත්‍ර කේබලයක් මිලදී ගෙන තිබුණ නමුත් මේ සඳහා පත්කරන ලද ටෙන්ඩර් මණ්ඩලය අනුමත කර තිබුණේ එක් පරිගණක යන්ත්‍රයක් හා එක් මුද්‍රණ යන්ත්‍රයක් පමණි.

ටෙන්ඩර් මණ්ඩලය පත්කර තිබුණේ 1993 දෙසැම්බර් 29 දින ටෙන්ඩරය විවෘත කිරීමෙන් පසු 1994 ජනවාරි 12 දින බවද නිරීක්ෂණය විය.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3:1. මූල්‍ය ප්‍රතිඵල

1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල නියෝජිතායතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය රු: 11,875,069 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂය සඳහා ඌණතාවය රු: 10,406,301 ක් විය.

පහත විස්තර කර ඇති පරිදි මූල්‍ය ප්‍රකාශවලින් පිළිබිඹුවන ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවය හේතුකොට ගෙන මෙම විචලනය විශ්ලේෂණය කිරීමට උත්සාහ කිරීමෙන් එතරම් අර්ථවත් ප්‍රතිඵලයක් ලැබෙතැයි සිතිය නොහැක.

නියෝජිතායතනයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කළ මූල්‍ය ප්‍රතිඵල ඊට පසු වර්ෂවලදී නිරීක්ෂණය කෙරුණු ගිණුම් දෝෂ, වැරදි, අත්හැරීම් ආදිය සඳහා ගැලපීම් කිරීම නියෝජිතායතනයේ අඛණ්ඩ ලක්ෂණයක්ව පැවතුණි. නිදසුනක් ලෙස ඉකුත් වර්ෂයේ ගිණුම්වලින් දැක්වූ රු: 10,406,301 ක්වූ ඌණතාවය සමාලෝචිත වර්ෂය තුලදී රු: 12,984,015 කින් ගලපා තිබුණි. පසුගිය වර්ෂ පහ තුල කරන ලද එවැනි ගැලපුම් පහත දැක්වේ.

| වර්ෂය | මූල්‍ය ප්‍රතිඵල | පසු වර්ෂවලදී කරන ලද ගැලපීම් |
|---|---|---|
| | රු. | රු. |
| 1988 | (6,335,458) | (1,058,134) |
| 1989 | (6,129,198) | 475,250 |
| 1990 | (8,715,370) | (1,724,142) |
| 1991 | (7,733,944) | ( 12,317,717) |
| 1992 | (8,163,129) | ( 16,294,750) |

මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වයට ඉදිරි වර්ෂවලදී ද එවැනි ගැලපීම් නොකෙරේය යන්න පිළිබඳ නිගමනය කළ නොහැකි විය. එබැවින් ගිණුම්වලින් පිළිබිඹු වූ මූල්‍ය ප්‍රතිඵල සහ මූල්‍ය තත්ත්වය පිළිබඳව විශ්වාසයක් තැබිය නොහැකි විය.

### 3:2. නිශ්චිත අරමුදල් යෙදවීම.

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව ජර්මන් සමූහාණ්ඩු ජනරජයේ (එෆ්.ආර්.ජී) ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ මුළු ලැබීම් හා වියදම් පහත දැක්වේ.

| | ලැබීම් | වියදම් |
|---|---|---|
| | රු. | රු. |
| භාණ්ඩාගාර ප්‍රදානය | 14,470,000 | 14,470,000 |
| විදේශාධාර | 4,450,682 | 4,627,832 |
| | 18,920,682 | 19,097,832 |

ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ ජල විද්‍යාව සඳහා ජලජ සම්පත් හා මුහුදු නාවික කළමණාකරනය මගින් ලබාදී ඇති දායකත්වය තහා සිටුවීමේ පරමාර්ථයෙන් ජල විද්‍යාත්මක සේවාවට ආධාර උපකාර කිරීමයි. 1973 ඔක්තෝබර් 18 දිනැති ගිවිසුමේ පිටපතක් විගණනය සඳහා ඉදිරිපත් කරන ලෙස දන්වන ලද නමුත් ඉදිරිපත් නොකෙරිණි.

## 3:3. භෞතික කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් වාර්තා ලියා තබා නොතිබුණ මෙන්ම ව්‍යාපෘති කාර්ය සාධනය ඇගයීමේ වාර්තා පිළියෙල කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘති හා නියෝජිතායතනයේ ප්‍රගතිය තක්සේරු කළ නොහැකි විය.

## 3:4. ද්‍රව්‍ය කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) රු.60,280 ක සේප්පුවේ වූ මුදල් කැපීම්මක් 1993 මාර්තු 29 දින වාර්තාවී තිබුණි. සේප්පුවේ මුදල් හා මාර්ගස්ථ මුදල් අවදානම්වලට එරෙහිව මේ දක්වා රක්ෂණය කර නොතිබුණි.

මුදලක්

(ආ) නියෝජිතායතනයට අයත් රු.12,460 ක/ 1993 මාර්තු 29 දින සිට මෝදර පොලිස් ස්ථානයේ තිබුණි. මෙම කාරණය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 3:5. " සමුද්‍ර මාරු " පර්යේෂණ නැව අලුත්වැඩියාව හා නඩත්තුව

ධීවර අමාත්‍යාංශයෙන් 1985 පෙබරවාරි මාසයේදී පවරන ලද " සමුද්‍ර මාරු " පර්යේෂණ නැව දස දෙනෙකුගෙන් යුතු කාර්ය මණ්ඩලයක් සමඟ 1994 දෙසැම්බර් 31 දක්වාම අක්‍රියව පැවතුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1993 දෙසැම්බර් 31 දිනෙන් අවසන් අවුරුදු 8 තුළ අළුත්වැඩියා හා නඩත්තු සඳහා එකතුව රු.11,655,788 ක් වැය කර තිබුණි.

(ආ) වර්ෂය තුළ අළුත්වැඩියා හා නඩත්තු සඳහා රු.1,806,529 ක් වැය කර තිබුණි.

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් පිරිවැය රු.20,310,000 ක්වූ අමතර කොටස් මිලට ගෙන තිබුණි.

(ඈ) නැවේ කාර්ය මණ්ඩලයේ වාර්ෂික වැටුප් පිරිවැය රු.485,125 ක් විය.

3:6. සේවක පාරිතෝෂික ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදල් ගොඩනැගීම.

1994 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික සඳහා රු.3,964,144 ක් ප්‍රතිපාදනය කර තිබුණි. කෙසේ වෙතත්, මේ පිළිබඳ අනාගත බැරකම් පියවීමට නියෝජිතායතනය විසින් අරමුදලක් ගොඩනගා නොතිබුණි.

3:7. නිශ්ක්‍රිය වත්කම්

සමාලෝචිත වර්ෂය තුළ ඉඩමේ සමහර කොටස්, ක්‍රීඩා කාමරය, මාලු ටැංකිය, "සුපුන්සැල" සහ සමහර ගොඩනැගිලි ඉඩ පහසුකම් නිෂ්ක්‍රියව පැවතුණි. මෙම සම්පත් උපයෝජනයට හෝ උචිත විකල්ප කාර්යයන් සඳහා යෙදීමට නියෝජිතායතනය විසින් නිසි පියවර ගෙන නොතිබුණි. මෙම සම්පත් වර්ෂ එකේ සිට තමය දක්වා විහිදි කාලපරිච්ඡේදයක් නිෂ්ක්‍රියව පවතී.

3:8. ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියෝජිතායතනය සතු සමහර වාහන ධීවර අමාත්‍යාංශය විසින් පාවිච්චි කර තිබුණි. වාහන තුනක් සඳහා දරන ලද ධාවන හා නඩත්තු වියදම් අමාත්‍යාංශයෙන් අයකර ගෙන නොතිබුණි.

(ආ) 1979 වර්ෂයේ සිට මහ නගර සභාවට ගෙවිය යුතු වරිපනම් වෙනුවෙන් එකතුව රු.4,927,830 ක් ප්‍රතිපාදනය කර තිබුණු නමුත් හිඟව පැවති ශේෂය ගෙවීම් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි./ ප්‍රමාදය වෙනුවෙන් මේ දක්වා උපචිත දඩ මුදල රු.2,463,915 කි.

(ඇ) ධීවර අමාත්‍යාංශයේ වැඩ සඳහා මුදාහරින ලද සමහර සේවකයින්ගේ වැටුප් වශයෙන් රු.32,985 ක මුදලක් ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනයේ අරමුදල්වලින් ගෙවා තිබුණි.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කිරීම සඳහා රු.21,246 ක මුදලක් ගෙවා වරලත් ගණකාධිකාරී ආයතනයක සේවය ලබාගෙන තිබුණි. කෙසේ නමුත්, නියෝජිතායතනය විසින් ස්ථාවර වත්කම් ලේඛණය නිසි අයුරු පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය.

(ඉ) කිසිම සාධාරණ හේතුවක් නොමැතිව සරප්ගේ සුළු මුදල් අග්‍රිමය රු.25,000 සිට රු.35,000 දක්වා වැඩිකර ඇති අතර මේ නිසා සරප්ට වැඩිපුර මුදල් ළඟ තබා ගැනීමට හැකිව ඇත.

(ඊ) නියෝජිතායතනය විසින් පිටස්තර ව්‍යාපෘති වෙනුවෙන් සපයන විදුලිය හා ජලය සඳහා අයකිරීමක් කර නොතිබුණි.

උදාහරණ :- ටූනා ව්‍යාපෘතිය.

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතිය.

3:9. හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අදාල සේවකයන් තවදුරටත් නියෝජිතායතනයේ සේවයේ නොසිටීම නිසා සේවකයන්ගෙන් අයවිය යුතු එකතුව රු :75,680 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට නොහැකි තත්වයට පත්ව ඇත.

(ආ) 1994 අප්‍රියෙල් මාසයේදී පෞද්ගලික ආයතනයකින් රු:9,200 ක පිරිවැයකට මිළට ගන්නා ලද ටයර් හතරක්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතා යතනයට ලැබී නොතිබුණි.

(ඇ) බාහිර පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් හා කාර්ය මණ්ඩලයට ගෙවන ලද සුළු මුදල් අත්තිකාරම් වූ රු:984,066 ක් අයකරගත නොහැකි සේ සළකා වර්ෂය තුලදී කපාහැර තිබුණි.

3:10. කාර්ය මණ්ඩල පිරිවැය

එක් එක් වර්ගය යටතේ විශ්ලේෂණය කරන ලද 1993 හා 1994 වර්ෂවල සාමාන්‍ය කාර්ය මණ්ඩල පිරිවැය සැසඳීමේ ප්‍රකාශයක් පහත දැක්වේ.

| වර්ගය | සේවක සංඛ්‍යාව | | සේවකයෙකුට සාමාන්‍ය පිරිවැය | |
|---|---|---|---|---|
| | 1994 | 1993 | 1994 | 1993 |
| | | | රු. | රු. |
| විධායක | 60 | 74 | 105,361 | 62,220 |
| විධායක නොවන | 219 | 190 | 54,978 | 57,780 |
| එකතුව | 279 | 264 | 65,813 | 58,361 |

3:11. වාහන උපයෝජනය

සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 26 ක ඇණියක් නියෝජිතායතනයට තිබුණි. වෙනම ශීර්ෂ යටතේ මෙම වියදම් දක්වන නිසි ගිණුම් වාර්තා නොමැතිවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට මෙම ඇණියේ ධාවන හා නඩත්තු පිරිවැය තක්සේරු කිරීමට නොහැකි විය. සමාලෝචිත වර්ෂය තුළ මෙම ඇණියේ ඉන්ධන සඳහා මුළු පිරිවැය එකතුව රු:1,047,675 ක් වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ රු:1,145,076 ක් විය. එක් එක් වාහනය වෙනුවෙන් ධාවනය කළ දුර, ඉන්ධන පරිභෝජනය, අළුත්වැඩියා පිරිවැය යනාදිය දැක්වෙන ලෙස ධාවන සටහන් සහ ලොග් පොත් නිසිලෙස ලියාතබා නොතිබුණ බවද නිරීක්ෂණය විය. එබැවින්, එක් එක් වාහනයේ පරිභෝජනය කළ ඉන්ධනවල පිරිවැය, ලීටරයකට කාර්ය සාධනයේ සාමාන්‍ය සහ වාහනයකට අළුත්වැඩියා පිරිවැය නිශ්චය කිරීමට නොහැකි විය.

3:12. <u>අයවැය ලේඛනමය පාලනය.</u>

සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොමැති බව පෙනේ.

4. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මගින් නියෝජිතායතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී.

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) රාජකාරි වෙන්කිරීම හා පැවරීම.

(ආ) ස්ථාවර වත්කම්.

(ඇ) මිළදී ගැනීම් සඳහා අත්තිකාරම්.

(ඈ) ණයගැතියෝ හා ණයහිමියෝ

(ඉ) සුළු මුදල්.

(ඊ) පාලන ගිණුම්.

(උ) අභ්‍යන්තර විගණනය විසින් මෙහෙයුම් සමාලෝචනය සහ වාර්තා කිරීම.

(ඌ) වාහන

(එ) අයවැය

(ඒ) පොත් හා වාර්තා ලියාතැබීම.

(ඔ) විදේශීය දුරකථන ඇමතුම්.

(එස්.සී.මායාදුන්නේ)
වැඩබලන විගණකාධිපති.

කපු/-